# සමාජයේ සංවාදයට ලක් වන කොරෝනා වසංගතයේ

# ව්‍යාප්තිය ගැන විධිමත් පරීක්ෂණයක් ඕනෑ

## කුමන්ත්‍රණකාරී ක්‍රියාවක් සිදුව තිබේ නම් නීතිමය පියවර ගන්න
## ජාතික සංවිධාන එකමුතුව ජනපතිගෙන් ඉල්ලයි

සමාජයේ සංවාදයට ලක්වෙමින් තිබෙන කොරෝනා වසංගතයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් විධිමත්, ඉහළ මට්ටමේ පරීක්ෂණයක් සිදු කොට යම් පාර්ශ්ව සිතාමතා කඩාකප්පල්කාරී ක්‍රියාවක හෝ ආණ්ඩුවට එරෙහිව කුමන්ත්‍රණකාරී ක්‍රියාවක නිරත වී ඇත්නම් ඒ පිළිබඳව හෙළිදරව් කොට ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ජාතික සංවිධාන එකමුතුව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගෙන් ඉල්ලීමක් කරයි.

ජාතික සංවිධාන එකමුතුවේ කැඳවුම්කරු ගුණදාස අමරසේකර මහතා මේ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත ලිපියක් යොමුකරමින් මේ ඉල්ලීම සිදු කර තිබේ.

එම ලිපියේ මෙසේ ද සඳහන් කර තිබේ.

කොවිඩ් වසංගත තත්වයේ දෙවැනි රැල්ල ආරම්භ වීම සමගම සමාජයේ විවිධ පාර්ශ්වවලින් වෙනත් විවිධ පාර්ශ්වවලට චෝදනා එල්ල කෙරෙමින් තිබෙන බව රහසක් නොවේ. ජාතික සංවිධාන ලෙස එදිනෙදා මහජන සබඳතාවල දී ඊට අදාළව විවිධ ප්‍රශ්නවලට පිළිතුරු දීමට අපට සිදු වී ඇත. එම තත්ත්වය වසංගත පාලනයට අදාළව මහජන සහාය ලබා ගැනීම සහ මහජන විශ්වාසය තහවුරු කිරීම යන සාධකවලට එරෙහිව අගතිගාමී ලෙස බලපාන බව අපට පෙනී යයි. ඊට අමතරව එම තත්ත්වය කොවිඩ් පළමු රැල්ල අතිසාර්ථකව මැඩලීම මගින් ඔබතුමා ප්‍රමුඛ ආණ්ඩුව දිනාගත් මහජන ප්‍රසාදය සහ ගෞරවයට අදාළව ද නිෂේධාත්මක බලපෑම් ඇති කරන බව පැහැදිලි කරුණකි.

එම නිසා සමාජයේ සංවාදයට ලක්වෙමින් ඇති පහත සඳහන් කරුණු ආශ්‍රිතව විධිමත් ඉහළ මට්ටමේ පරීක්ෂණයක් සිදුකොට යම් පාර්ශ්ව සිතාමතා කඩාකප්පල්කාරී ක්‍රියාවක හෝ ආණ්ඩුවට එරෙහිව කුමන්ත්‍රණකාරී ක්‍රියාවක නිරත වී ඇත්නම් ඔවුන් හෙළිදරව් කොට ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අප ජාතික සංවිධාන වශයෙන් ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් සහ ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමු.

මිනුවන්ගොඩ පිහිටි බ්‍රැන්ඩික්ස් ආයතනයට අයත් කර්මාන්ත ශාලාවට එම සමාගමට අයත් ඉන්දියාවේ විශාකාපට්නම්හි පිහිටි කර්මාන්ත ශාලාවේ සිට සේවකයන් අවස්ථා කිහිපයක දී ගුවන් මඟින් රැගෙනවිත් නිරෝධායන උපදෙස්වලට පටහැනිව වැඩමුළු සහ අභ්‍යන්තර විගණනයක් සිදු කිරීම. එසේ අවස්ථා කිහිපයක දී ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට සේවකයන් පැමිණි බව හමුදාපතිවරයා පුවත්පත්වලට ප්‍රකාශකොට ඇති අතර හිටපු ඇමැති පාඨලී චම්පික රණවක මහතා ද ඊට අදාළව ප්‍රකාශයක් සමාජ මාධ්‍යවලට නිකුත් කොට ඇත.

දැනට ඉතා බරපතළ ලෙස කතාබහට ලක්වෙමින් ඇති සැප්තැම්බර් 22 වැනි දින මත්තල ගුවන්තොටුපොළෙන් ශ්‍රී ලංකාවට පැමිණි ඉන්දියානුවන් හෝ ඉන්දියාවේ පිහිටි බ්‍රැන්ඩික්ස් සමාගමට අයත් කර්මාන්ත ශාලාවේ සේවය කළ ශ්‍රී ලාංකිකයන් නිසිලෙස නිරෝධායනය නොවූ බවට ප්‍රබල සාක්ෂි ඉදිරිපත් වී ඇත. ඊට අදාළව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමය නිල වශයෙන් පුවත්පත්වලට ප්‍රකාශයක් සිදු කොට තිබිණි. එම ගුවන් මගීන් පිළිබඳව විනිවිදභාවයෙන් යුතුව තොරතුරු ලබාදීම අදාළ ගුවන් සමාගම සහ ගුවන්තොටුපොළ බලධාරීන් ප්‍රතික්ෂේප කිරීම නිසා මහජන සැකය තවදුරටත් වර්ධනය වේ.

එසේ විදේශ වලින් ශ්‍රී ලංකාවට පැමිණෙන පිරිස් ආරක්ෂක හමුදා විසින් නිරෝධායනයට ලක් කරන බව සඳහන් වුවද ප්‍රායෝගිකව එම කටයුත්ත සිදුකරනු ලබන්නේ පෞද්ගලික ආරක්ෂක සමාගමක් විසින් බවට සහ ඔවුන් විසින් එසේ පිරිස් හෝටල් වෙත රැගෙන යාමේ දී හමුදාව ඔවුන් කැටුව නොගිය බවට ද වාර්තා පළවේ. එසේ නිරෝධායනයට ලක් වූ බව කියන පිරිස් සහ හෝටල් හෝ නිවාස පිළිබඳ කිසිදු තොරතුරක් තමන්ට ලබා දී නැති බව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු පවසති. එවැනි තත්ත්වයක් තුළ ඊට පෙර රට තුළට පැමිණි පිරිස් සම්බන්ධයෙන් ද ඒ ආකාරයට ක්‍රියාකොට ඇති බවට සාධාරණ සැකයක් මතු වේ.

ඒ ආකාරයට දක්නට ලැබෙන යම් වගකිවයුතු පිරිස්වල වගකීම් විරහිතභාවය හෝ නොසැලකිලිමත්භාවය පිළිබඳ මහජන සැකය දුරුකිරීම ඉතා වැදගත් වන්නේ, අදාළ සමාගමට ඉන්දියානු සහ අමෙරිකානු ආයතන සමඟ තිබෙන බැඳීම් නිසා සමස්ත සිදුවීම් මාලාව ශ්‍රී ලංකාවට එරෙහි බාහිර කුමන්ත්‍රණයක් ලෙස අර්ථ දැක්වීමේ තත්වයක් තිබෙන බැවිනි. මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් කර්මාන්ත ශාලාව තුළ ශ්වසන රෝග තත්ත්වයක් ලෙස දක්නට ලැබෙන කොවිඩ් වසංගතයේ දෙවැනි රැල්ල මතුවන්නේ සැප්තැම්බර් මස 24 වැනි දිනය ආශ්‍රිත දිනයක බව අනාවරණය වී ඇත. එම තත්ත්වය ඇති වූ පසුව අදාළ සමාගමේ කළමනාකාරීත්වය සහ එහි සෞඛ්‍ය නිලධාරීන් ඊට ප්‍රතිචාර දක්වා ඇති ආකාරය කිසිසේත්ම පිළිගත නොහැකි බව පුවත්පත් වාර්තා අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ.

යම් පිරිස් සඳහන් කරන ආකාරයට එම තත්වය ව්‍යාපාරික ඇණවුම් නිසි වේලාවට නිම කිරීම සඳහා වූ පෙළඹවීම නිසා හෝ තවත් පිරිස් සඳහන් කරන ආකාරයට ධන තන්හාව හෝ මිනිස් ජීවිත පිළිබඳ නොසැලකිල්ල නිසා ඇති වූවක් ලෙස විග්‍රහ කිරීම අර්ධ සත්‍යයක් විය හැක.

ඒ මඟින් කළමනාකාරීත්වයේ වගකීම් විරහිතභාවය සහ නොසැලකිලිමත් භාවය ප්‍රදර්ශනය කෙරෙනවාට අමතරව ඉහත සඳහන් කළ කුමන්ත්‍රණ න්‍යාය ද තහවුරු වේ. එහි දී සැකයට ප්‍රධාන වශයෙන්ම හේතුවන්නේ රෝග ලක්ෂණ පෙන්වූ 30කට අධික පිරිසක් ඔවුන්ගේ ගම්බිම්වලට යැවීම ය. එහි දී PCR පරීක්ෂණ සිදුකිරීමෙන් තොරව පොදු ප්‍රවාහන සේවා මඟින් ඔවුන් දුර බැහැර ප්‍රදේශවලට යැවීම මඟින් වසංගත පාලනයට අදාළ මූලික මූලධර්ම පවා උල්ලංඝනය වේ. මෙම තත්ත්වය නිසා අද වනවිට ආශ්‍රිතයන් හඹායාම සඳහා ආරක්ෂක හමුදාවලට ඉතා දුෂ්කර ව්‍යායාමයක යෙදීමට සිදු වී ඇත.

එසේ වුවත් බ්‍රැන්ඩික්ස් පොකුරේ පළමු රෝගියා හඳුනාගත් පසුව සෞඛ්‍ය අංශ ක්‍රියාකොට ඇති ආකාරය කිසිසේත්ම පිළිගත නොහැකි අතර එම තත්ත්වය සාමාන්‍ය මහජනයා පවා පුදුමයට පත්කළ බව රහසක් නොවේ.

දෙවනි රැල්ලේ පළමු රෝගියාට වෛරසය ආසාදනය වූයේ කෙසේ දැයි සොයා බැලීමේ වසංගත රෝග විද්‍යා ක්‍රමවේද පිළිබඳ මහජනයාට අවබෝධයක් නැතත් පළමු රෝගියා හමු වූ පසුව ඔහුගේ හෝ ඇයගේ ආශ්‍රිතයන් පිළිබඳව ගතයුතු පියවර පිළිබඳව මහජනයාට යම් අවබෝධයක් ඇත. එසේම පළමු රැල්ල මැඩ පැවැත්වීමෙන් පසුව දෙවැනි රැල්ලක් වළක්වා ගැනීම සඳහා විශේෂයෙන්ම වඩා අනතුරුදායක ආයතන සහ තත්ත්වයන්ට අදාළව පැහැදිලි නිර්දේශ සෞඛ්‍ය අංශ ලබා දී ඇතැයි මහජනයා විශ්වාස කරති. එහෙත් එසේ සිදුවූවා ද යන්න සහ සිදුවූවා නම් එම නිර්දේශ අදාළ ආයතනය නොසලකා හරිනු ලැබුවේ කුමක් නිසා ද යන්න දැන ගැනීමේ අයිතියක් මහජනයාට ඇත.

ඒ සියල්ලටම වඩා බ්‍රැන්ඩික්ස් පොකුරේ පළමු රෝගියා හඳුනාගත් වහාම ඊට පෙර ආයතනයේ දක්නට ලැබුණු ශ්වසන රෝග තත්ත්වයන් සැලකිල්ලට ගෙන කර්මාන්ත ශාලවේ සමස්ත සේවක පිරිස් නිරෝධායනයට ලක්කිරීම වෙනුවට PCR පරීක්ෂණවලට ලක් කළ සේවකයන් නිරෝධායනය සඳහා නිවෙස්වලට යැවීම බරපතළ වරදක් බව සාමාන්‍ය මහජනයාට පවා තේරුම්ගත හැක. එම සැකකටයුතු රෝගීන් නිවෙස්වලට ගමන් කරනු ලැබුවේ ත්‍රිරෝද රථවල සමූහ වශයෙන් සහ පොදු ප්‍රවාහන සේවාවලින් බවට සාක්ෂි ඇත. එසේ පළමු වටයේ දී නිවෙස්වලට යැවූ PCR පරීක්ෂණවලට ලක් කෙරුණු 100ක පමණ සේවකයන්ගෙන් 69 දෙනෙකු රෝගීන් බව තහවුරු විය. ඔවුන් බොහෝ දෙනෙකුට රෝග ලක්ෂණ නොතිබූ බැවින් ඔවුන් නිවෙස් ආශ්‍රිත සෙසු මහජනයා සමඟ ගැවසීම නිසා බොහෝ පිරිසකට රෝගය බෝ කිරීමේ අවදානමක් ඇති අතර එම පළමු පෙළ ආශ්‍රිතයන් සහ ඔවුන්ගේ දෙවන පෙළ ආශ්‍රිතයන් සියලූදෙනා කඩිනමින් හඳුනාගැනීම පහසු නැත. ඒ නිසා සමාජය තුළ සැඟවුණු රෝගීන් සිටින බව සහ රෝගය සමාජයට සම්ප්‍රේෂණය වී ඇති බවට මහජනයා දක්වන අදහස් තාක්ෂණික තර්ක මඟින් බැහැර කළ හැකිද යන ප්‍රශ්නය මතුවේ.

එම තත්ත්වය එසේ තිබිය දී දෙවන වතාවට PCR පරීක්ෂණවලට ලක්කරනු ලැබූ 1280 ක් ද නිවෙස්වලට යැවීමට තීන්දු ගනු ලැබුවේ කවුරුන් විසින් ද යන ප්‍රශ්නය මතු වේ. ඒ අයගෙන් සියයට 50කට වැඩි පිරිසක් රෝගීන් බව තහවුරු වූ නමුත් ඔවුන් සොයා ගැනීම සඳහා ආරක්ෂක අංශවලට බලවත් පරිශ්‍රමයක් දැරීමට සිදු වූ අතර යම් පිරිසක් සොයාගත නොහැකිව සමාජයේ සිටින බව වාර්තා වේ. ඒ සියලු දෙනාගේ ආශ්‍රිතයන් සහ ඔවුන්ගේ දෙවැනි පෙළ ආශ්‍රිතයන් සියල්ල පිළිබඳ සැලකීමේ දී මේ වනවිට සමාජයේ ද්විතීක පොකුරු රාශියක් ඇති වී තිබෙන බව පිළිගැනීමට සිදු වේ. ඒ අනුව ඉහත සඳහන් කළ ආකාරයට රෝගය, සමාජයට සම්ප්‍රේෂණය වී ඇති බව හෙවත් වසංගතයේ 4 වැනි අවධියට ලඟා වෙමින් තිබේ ද යන සැකය ද මතුවේ.

මෙම සියලු කරුණු සැලකිල්ලට ගැනීමේ දී වසංගත තත්ත්වය සමාජයට පැතිරෙමින් තිබෙන බව පිළිගෙන ඊට අනුව කටයුතු කළ යුතු බව සහ සමස්ත සිදුවීම් මාලාව පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකිරීම මඟින් මහජන විශ්වාසය තහවුරු කළ යුතු බව අපගේ විශ්වාසයයි. අප ජාතික සංවිධාන ලෙස මෙම කරුණු ඔබතුමා වෙත ඉදිරිපත් කරන්නේ අපගේ සමාජ වගකීමක් ලෙස මෙන්ම ඔබතුමා එම කරුණු පිළිබඳව අවධානය යොමු කොට නිසි පියවර ගනු ඇතැයි යන විශ්වාසයෙනි.


OBSERVER MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2020
SINCE 1978 42nd
Recognizing talent, inspiring greatness.
Sri Lanka Telecom Mobitel

### 42 වන ඔබ්සවර් - මොබිටෙල්
### වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරග වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරග වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : ..........
අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐
සමස්ත ලංකා ක්‍රීඩිකාව: ..........
**(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)**
පාසල : ..........
ඔබේ නම : ..........
ලිපිනය : ..........
ජංගම දුරකථන අංකය : ..........

SUNDAY OBSERVER

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

**කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.**

**ප්‍රථම ත්‍යාගය** : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-
**තෙවන ත්‍යාගය** : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

**කොන්දේසි :**
1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

**දිනය** 2020-10-17 **අංකය** 32





# මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තුමේන්තුවේ මහජන සේවාවන් 21 වැනි දා නැවත ඇරැඹේ

**නිමල් රාජපක්ෂ**

කොවිඩ් 19 වයිරසය හේතුවෙන් රටේ උද්ගත වී ඇති අවදානම් සහගත තත්ත්වය මත තාවකාලිකව අත්හිටුවනු ලැබූ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තුමේන්තුවේ මහජන සේවාවන් නැවත ජනතාවට අපහසුතාවයක් නොවන ආකාරයට කොවිඩ් නීතිරීතිවලට අනුගත වෙමින් ලබන 21 වැනි දා සිට ආරම්භ කිරීමට ආණ්ඩුව තීරණය කර ඇත.

එහිදී වාහන ලියාපදිංචි කිරීම, රියැදුරු බලපත්‍ර නිකුත් කිරීම, වාහන අංක තහඩු නිකුත් කිරීම හා වාහන පරීක්ෂා කර වාර්තා ලබාදීම ඇතුළු සේවාවන් සඳහා සතියේ දිනවල පෙරවරු 09.00 සිට පස්වරු 04.00 දක්වා කාලය තුළ දුරකතන මාර්ග ඔස්සේ කලින් දිනයක් සහ වේලාවක් වෙන්කර ගත යුතුය. ඊට පරිබාහිරව කිසිදු හේතුවක් මත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තුමේන්තුවට පැමිණෙන පුද්ගලයන් සඳහා සේවා සැපයීමක් සිදු නොකරනු ඇතැයි වාහන නියාමන බස්රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය ඇමැති දිලුම් අමුණුගම මහතා පවසයි.

වේරහැර කාර්යාලය මඟින් සිදු කරනු ලැබූ රියැදුරු බලපත්‍ර ලබාදීමේ එක දින සේවාව නැවත දැනුම් දෙන තුරු අත්හිටුවා ඇති අතර සාමාන්‍ය සේවා යටතේ එම සේවය ලබා ගැනීම සඳහා වේරහැර කාර්යාලය විවෘත වන්නේ කොළඹ ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවට පමණක් වන අතර ඔවුන්ගේ පදිංචිය සනාථ කළ යුතු වෙයි. අනෙකුත් දිස්ත්‍රික් වල පදිංචි සේවා අපේක්ෂකයින් හට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තුමේන්තුවට අයත් දිස්ත්‍රික කාර්යාල හරහා අදාළ සේවාව සැපයීමට විවෘතව පවතී. පොලිස් ඇඳිරි නීතිය පවතින දිස්ත්‍රික්කවල ජනතාව සඳහා මෙම සේවාවන් ලබා ගැනීමට කිසිදු අවස්ථාවක් හිමි නොවනු ඇත.

www.ntmi යන අන්තර්ජාලයට පිවිසීමෙන් නුගේගොඩ ප්‍රධාන කාර්යාලයෙන් සේවාව ලබා ගැනීමට සේවා ලාභීන්ට හැකියාව ඇත. කෙසේ වෙතත් ඉදිරියේදී ක්‍රමක්‍රමයෙන් එම පහසුකම අනෙකුත් ශාඛා කාර්යාල මඟින් ලබා ගැනීමට කටයුතු සූදානම් කරනු ලැබේ.

ඊට අමතරව සතියේ වැඩ කරන දිනවල උදේ 8.30 සිට පස්වරු 3.00 දක්වා කාලය තුළ දුරකථන 0112852095/ 0112852868 අංක වලට ඇමැතීමෙන් දිවයිනේ ඕනෑම ශාඛාවකින් සේවය ලබා ගැනීමට දිනයක් සහ වේලාවක් වෙන් කර ගැනීමට පුළුවන.

ඊට අමතරව ඉදිරියේදී ඕනෑම දුරකතන ජාලාවක් මඟින් අංක 225 ට ඇමතුමක් ලබා දීම මඟින් දිවයිනේ ඕනෑම ශාඛාවකින් සේවාව ලබා දීම සඳහා දිනයක් හා වේලාවක් වෙන් කර ගැනීමේ පහසුකම සැලසීමට කටයුතු කරනු ලැබේ.

මීට අමතරව නව වාහන ලියාපදිංචි කිරීම සඳහා නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ 0706354116 ,0706354117 ,0706354118 හෝ වාහන පැවරුම් සඳහා නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ 07 06354107,0706354108,0706354109,0 706354110,0706354111,0706354112, 06354114 0706354115,0706354137,0 706354138,0706354139,0706354140, 0706354141,0706354142,070635414 4 යන අංක වලටද, වාහන අංක තහඩු පිළිබදව 0706354119,0706354120 යන අංක සඳහාද, අනෙකුත් විමසීම් සඳහා නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ 0706354145,0706354146, 0706354147,0706354148,0706354 149 සදහාද,ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ www.ntmi වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ දුරකතන අංක-0112852095/ 0112852868 යන දුරකතන අංකවලට ඇමැතීමෙන් සිය සේවාවන් හා තොරතුරු ලබා ගැනීමට පහසුකම් සලසා ඇතැයිද දිලුම් අමුණුගම රාජ්‍ය ඇමැතිවරයා පවසයි.

# ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමේ ජාතික වැඩසටහන ක්‍රියාවට නංවන්න ඇමැතිවරුන්ගෙන් සමන්විත කමිටු හතරක්

**මහින්ද අලුත්ගෙදර**

ජනතා ප්‍රශ්න සඳහා විසඳුම් ලබාදෙමින් ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමේ ජාතික වැඩසටහන ඇමැතිවරුන්ගෙන් සමන්විත කමිටු හතරක් හරහා රටම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට තීරණය කරයි.

ප්‍රධාන කමිටු හතර කැබිනට් ඇමැතිවරුන්ගෙන්, රාජ්‍ය ඇමැතිවරුන්ගෙන් සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ගෙන් සමන්විත වන අතර ඒ ඒ පළාත්වල දිස්ත්‍රික්ක වල, ප්‍රාදේශීය දේශපාලන නායකත්වයෙන් සහ ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමේ රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත වෙයි.

ජාතික ආර්ථික සංවර්ධනයට සමගාමීව ග්‍රාමීය ආර්ථිකය ගොඩනැගීමට රජයේ ප්‍රමුඛ අවධානය යොමුකර තිබෙන අතර ග්‍රාමීය ආර්ථිකය නා සිටුවීමේ ජාතික වැඩසටහන සියලු දිස්ත්‍රික්ක ආවරණය කරමින් ක්‍රියාත්මක කෙරේ. ඇමැතිවරුන් කමිටු ලෙස සංවිධාන ගතවී ගමේ ජනතා ප්‍රශ්න විසඳීමට මැදිහත් වේ.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් යටතේ සිදුකෙරෙන අතර සාමාජීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව, ජීවනෝපාය සංවර්ධන කමිටුව, දේශීය නිෂ්පාදන කර්මාන්ත වැඩිදියුණු කිරීමේ සංවර්ධන කමිටුව සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව ඊට අයත් වෙයි. මෙම වැඩසටහන දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කෙරේ.

මෙම ප්‍රධාන කමිටු හතර මඟින් දිවයින පුරා ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී පළාත් මට්ටමෙන්, දිස්ත්‍රික් මට්ටමෙන්, ප්‍රාදේශීය මට්ටමෙන් සහ ග්‍රාමීය මට්ටමෙන් අමාත්‍යාංශවල වැඩසටහන් සකස් කරමින් ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමට අදාළ කරුණු අධ්‍යයනය කරමින් කටයුතු කරයි.

ප්‍රධාන කමිටු හතර කැබිනට් ඇමැතිවරුන්ගෙන්, රාජ්‍ය ඇමැතිවරුන්ගෙන් සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ගෙන් සමන්විත වන අතර ඒ ඒ පළාත්වල දිස්ත්‍රික්ක වල, ප්‍රාදේශීය දේශපාලන නායකත්වයෙන් සහ ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමේ රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත වෙයි.

මෙම ජාතික වැඩපිළිවෙළ පිළිබඳව කැබිනට් ඇමැතිවරුවන්, රාජ්‍ය ඇමැතිවරුන් සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් දැනුවත් කිරීම සඳහා අරලියගහ මන්දිරයේ දී පැවති වැඩසටහනක දී ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතා සඳහන් කළේ පසුගිය මැතිවරණවල දී සෞභාග්‍යයේ දැක්ම යටතේ රජය ඉදිරිපත් කළ ග්‍රාමීය මට්ටමේ දියුණු යටතල පහසුකම් පද්ධතියක් ඇති කිරීමේ යෝජනාව සාක්ෂාත් කර ගැනීම සඳහා අයවැයෙන් වෙන්කරන මුදල් ප්‍රමාණය වඩා ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගතහැකි ආකාරයෙන් කටයුතු කිරීම මෙම ජාතික වැඩපිළිවෙළ තුළින් අපේක්ෂා කෙරෙන බවයි.

මෙම කමිටු දිස්ත්‍රික් මට්ටමින් රැස්වන අවස්ථාවන්හි දී කැබිනට් ඇමැතිවරුන්, රාජ්‍ය ඇමැතිවරුන් සහ ප්‍රධාන පෙළේ නිලධාරීන්ගේ ප්‍රාදේශීය නිලධාරීන් ඊට සම්බන්ධ කර ගැනීම තුළින් වඩා කාර්යක්ෂමව ව්‍යාපෘති දියත් කිරීමට අපේක්ෂා කරයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සහ අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ උපදෙස් මත අගමැති කාර්යාලය මඟින් මෙම වැඩපිළිවෙළ සම්බන්ධීකරණය කෙරෙන අතර ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමේ ජාතික වැඩසටහන් සඳහා රජයේ නිලධාරීන් කාර්යක්ෂම යොදවා ගැනීමට මෙමඟින් අපේක්ෂා කෙරෙයි.

මෙම සාකච්ඡාව සඳහා කැබිනට් ඇමැතිවරුන්, රාජ්‍ය ඇමැතිවරුන්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කරමින් උසස් පෙළ සාර්ථකව පැවැත්වෙයි

**සිතාරා සේනානි**

රටේ දැනට පවතින කොවිඩ් තත්ත්වය හමුවේ දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කරමින් මේ මස 12 වැනිදා ආරම්භ කළ අ.පො.ස. උසස් පෙළ විභාගය මේ දක්වා සාර්ථකව පවත්වා ගෙන යෑමට හැකි වූ බවත්, මින් ඉදිරියටත් එනම් නොවැම්බර් 06 වැනිදා තෙක් එම විභාගය ඒ අයුරින්ම පවත්වන බවත් අධ්‍යාපන ලේකම්, මහාචාර්ය කපිල පෙරේරා මහතා පවසයි.

එමෙන් ම කොවිඩ් තත්ත්වය හේතුවෙන් ඇඳිරිනීතිය පවතින පොලිස් බල ප්‍රදේශවල විභාග මධ්‍යස්ථානයන්හි රාජකාරී කටයුතුවල නිරතව සිටින ගුරුවරුන්ට මුහුණපෑමට සිදු ව ඇති ප්‍රවාහන අපහසුතා හේතුවෙන් ලැබී තිබෙන ඉල්ලීම් සැලකිල්ලට ගනිමින්, මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කොට සහනයක් සැලසීමට බලාපොරොත්තු වන බව ද අධ්‍යාපන ලේකම්වරයා වැඩිදුරටත් සඳහන් කරයි.

# ගංගා 103ක් රැකීමට කෝටි 2300ක් වෙන් කළා

## කඩුවෙල සිට පැලියගොඩ දක්වා ඇති කර්මාන්තශාලා 7000න් 4000කටම පරිසර වාර්තා නෑ

### පරිසර අමාත්‍ය මහින්ද අමරවීර

**අමෝදා ජයමහ**

රටේ ජනතාවගේ අවශ්‍ය පානීය ජලය මෙන්ම ගොවිතැන් හා වෙනත් මූලික අවශ්‍යතාවන්ට ජලය ලබා දෙන ප්‍රධාන ජල මූලාශ්‍ර වන ගංගා පද්ධති සංරක්ෂණය සඳහා පරිසර අමාත්‍යාංශය විසින් "සුරකිමු ගංගා" නමින් විශේෂ ව්‍යාපෘතියක් සකස් කර ඇත. මෙම වැඩපිළිවෙළ යටතේ දිවයිනේ ගංගා 103ක් සංවර්ධනය කෙරෙන අතර ඒ සඳහා රජය රුපියල් කෝටි 2300ක මුදල් ප්‍රමාණයක් යෙදවීමට නියමිත බව පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතා මහතා ප්‍රකාශ කළේය.

දැනට රටේ සමස්ත ගංගා පද්ධතියම මිනිසුන්ගේ විවිධ ක්‍රියාකාරකම් නිසා දූෂණයට ලක් වී තිබෙන අතර, ඇතැම් ගංගාධාර ආශ්‍රිතව පවතින පරිසර පද්ධති විනාශ කිරීම නිසා ගංගාවලට ජලය සැපයෙන ජලමූලාශ්‍ර පවා අහිමිව යමින්පවතින බවද ඒ මහතා කීවේය.

එමෙන්ම මහජනතාව පානීය ජල අවශ්‍යතා සඳහා යොදා ගන්නා ජල මූලාශ්‍රයවලට කර්මාන්තශාලාවලින් බැහැර කරන අපජලය හා අපද්‍රව්‍ය එක් වීම මඟින් එම ජලය පරිභෝජනය කරන්නන් විවිධ රෝගාබාධවලට ගොදුරු වන බව ඇමැතිවරයා කීය.



විශේෂයෙන් කැලණි ගඟ ආශ්‍රිතව කඩුවෙල සිට පැලියගොඩ පාලම දක්වා කර්මාන්තශාලා 7000ක් තිබෙන අතරින් පරිසර වාර්තා ලබා ගෙන ඇත්තේ කර්මාන්තශාලා 3000ක් පමණක් බව හා ඉතිරි 4000ම පරිසර වාර්තා ලබා ගෙන නැති බව පරිසර සංවිධානයන්හි නිලධාරින් විසින් තමාව මේ වන විට දැනුවත් කර ඇති බවද මහින්ද අමරවීර මහතා කීවේය.

මෙම ගංගා අවට අනවසර පදිංචිකරුවන් හඳුනා ගැනීම, ඔවුන්ට විකල්ප ඉඩම් මෙන්ම ඒවායේ නිවාස ඉදි කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම, කර්මාන්තවල අපජලය බැහැර කිරීමේ විද්‍යාත්මක ක්‍රම අනුගමනය කිරීම සඳහා මුදල් නැති නම්, ඊට අඩු පොලියක් යටතේ ණය මුදලක් ලබා දීම වැනි සහන ලබා දීමට පියවර ගැනීමටද නියමිත බව අමාත්‍යවරයා පැවසුවේය.

# සංවර්ධනය වෙමින් තිබූ ඉඩමක පස්කන්දකට යට වී තරුණියක මිය යෑම

## ආණ්ඩුවෙන් මව්පියන්ට වන්දියක් සමාගමෙන් ඉඩමක් සහ නිවෙසක්



**රක්ෂණ ශ්‍රියන්ත**

කඩුවෙල, කොතලාවල, පාසල් මාවතේ නිවසක් මතට පස් කන්දක් කඩා වැටීමෙන් මිය ගිය ගීතිකා ශ්‍යාමලී තරුණියගේ පවුලේ සාමාජිකයන්ට රජය මගින් ලබා දෙන වන්දි මුදලට අදාළ චෙක්පත පසුගියදා (14) කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ජාතික නිදහස් පෙරමුණේ නායක, කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මහතා විසින් එම තරුණියගේ මවට ප්‍රදානය කරනු ලැබීය. එසේම එම පවුලට කඩුවෙල ආසනය තුළ ඉඩමක් ලබා දී නව නිවසක් ඉදිකර දීමටද වීරවංශ මහතා මැදිහත් වී තිබේ.

තමන් විසූ කුලී නිවස මතට පස් කන්දක් කඩා වැටීමෙන් ගීතිකා ශ්‍යාමලී තරුණිය අවාසනාවන්ත ලෙස මිය ගොස් තිබිණි. ඉදිකිරීම් සමාගමක් මඟින් සංවර්ධනය කරමින් තිබූ ඉඩමක තාප්පයක්ද සමඟ පස් කන්දක් ඉහත නිවසට කඩා වැටී තිබුණු අතර, අමාත්‍ය විමල් වීරවංශ මහතා එම සමාගමේ ප්‍රධානීන් සමඟ සිදු කළ සාකච්ඡාවක ප්‍රතිඵලයක් ලෙස, ඉහත පවුලට කඩුවෙල ආසනයෙන් ඉඩමක් ලබා දී මාස 06ක් තුළ නව නිවෙසක් ඉදිකර දීමට ඔවුහු එකඟ වූහ.

මෙම අවස්ථාවට කොළඹ දිස්ත්‍රික් ලේකම් ප්‍රදීප් යසරත්න, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් යෂිකා අනන්දනී, කඩුවෙල නගරාධිපති බුද්ධික ජයවිලාල් යන මහත්ම මහත්මීහු එක්ව සිටියහ.

# මොස්කව්, පේරාදෙණිය රෝහල්වල නව වෛද්‍ය දැනුම වීඩියෝ තාක්ෂණයෙන් හුවමාරු වේ


**මහින්ද අලුත්ගෙදර**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය හා රුසියාවේ මොස්කව් නුවර සායනික රෝහල අතර වෛද්‍ය පර්යේෂණ හා ප්‍රතිකාර පිළිබඳ අත්දැකීම් බෙදා ගැනීමේ වැඩසටහනක් සංවිධානය කර තිබේ.

ඒ අනුව ශ්‍රී ලංකාව හා මොස්කව් නුවර වෛද්‍ය පර්යේෂණ හා ප්‍රතිකාර පිළිබඳ අත්දැකීම් බෙදා ගැනීමේ වැඩසටහනක් පසුගිය දා ආරම්භ කෙරුණු අතර මෙහි ප්‍රථම වැඩසටහන ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය හා මොස්කව් නුවර අංක 52 සායනික රෝහල අතර වීඩියෝ තාක්ෂණය ඔස්සේ ළමා රෝග, වකුගඩු බද්ධ කිරීම, ප්‍රතිශක්තිකරණය හා රසායනාගාර කටයුතු ආදි විෂයයන් රැසක අත්දැකීම් බෙදා ගත් බව රුසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය පවසයි.

රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලංකා තානාපති විශේෂඥ වෛද්‍ය මහචාර්ය එම්. ඩී. ළමාවංශ මහතාගේ මෙහෙයවීම අනුව මෙම වෛද්‍ය පර්යේෂණ හා ප්‍රතිකාර අත්දැකීම් හුවමාරු වැඩසටහන ආරම්භ කර තිබේ.

මෙහි මුල්ම වැඩසටහනට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පීඨාධිපති මහචාර්ය ආසිරි අබේගුණවර්ධන, ළමා අසාත්මිකතා හා ප්‍රතිශක්ති විද්‍යාව පිළිබඳ විශේෂඥ වෛද්‍ය තුෂාර කුඩගම්මන, ළමා වෘක්කවේද වෛද්‍ය ෂෙනාල් තල්ගහගොඩ, වැඩිහිටි වෘක්කවේද වෛද්‍ය රංජිත් අබේසේකර, වකුගඩු ව්‍යාධිවේදි වෛද්‍ය සුලෝචනා විජේතුංග, ප්‍රතිශක්ති විද්‍යාව පිළිබඳ විශේෂඥ වෛද්‍ය මහාචාර්ය සංජය අධිකාරි, ක්ෂුද්‍රජීව විද්‍යාව හා රසායනාගාර ප්‍රිශක්ති විද්‍යාව පිළිබඳ විශේෂඥ වෛද්‍ය චම්පා රත්නතුංග යන මහත්ම මහත්මීන් සමඟ මොස්කව් අංක 52 සායනික රෝහලේ සභාපති මහාචාර්ය ව්ලැඩිමීර් විටෝරෙන්කෝ, අසාත්මික හා ප්‍රතිශක්තිකරණ මධ්‍යස්ථානයේ ප්‍රධානි වෛද්‍ය චාරියා ෆෝමිනා, වකුගඩු බද්ධ කිරීමේ ව්‍යාධි විද්‍යාව පිළිබඳ විද්‍යාත්මක මධ්‍යස්ථානයේ ප්‍රධානි ඔලෙක් කොටෙන්කෝ ජාත්‍යන්තර සහයෝගිතා දෙපාර්තමේන්තුවේ ප්‍රධානි වෛද්‍ය වට්යානා කිරිලෝවා මහත්ම මහත්මීන් සම්බන්ධ වූ බවද රුසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය කියයි.



# බැංකු නිලධරයකු සේ පෙනී සිටිමින් දුම්රිය මඟීන් කොල්ල කෑ අයෙක් දැලේ

**නිමල් රාජපක්ෂ**

පෞද්ගලික බැංකුවක විධායක නිලධාරියකු ලෙස හැසිරෙමින් මඟී ජනතාවගේ ජංගම දුරකතන හා මුදල් පසුම්බි සොරා ගන්නා පුද්ගලයකු දුම්රිය ආරක්ෂක නිලධාරීන් පසුගියදා (13) පෙරවරුවේ අත්අඩංගුවට ගෙන ඇත. ඔහු මෙසේ අත්අඩංගුවට පත් වුණේ සාගරිකා දුම්රියේ ගමන් කළ කාන්තාවකගේ ජංගම දුරකතනයක් සොරා ගන්නා අවස්ථාවේදීය. අදාළ සැකකරු පරීක්ෂා කිරීමේදී රුපියල් 19700ක මුදලක් හා ජංගම දුරකතන දෙකක් සොයා ගත් බව දුම්රිය ආරක්ෂක නිලධාරීහු පැවසූහ.

සැකකාර තරුණයා සිය මෝටර් රථය පානදුර දුම්රිය ස්ථානය අසල, රථ ගාලේ නතර කොට පාණදුර දුම්රිය ස්ථානයෙන් සමුද්‍රදේවී දුම්රියට ගොඩ වන කාන්තාවකගේ ජංගම දුරකතනයක් සොරා ගෙන දුම්රියෙන් බැස තිබේ. ඊට පසුව පෙරවරු 07.30 ට පමණ පාණදුර දුම්රිය ස්ථානයට මරදාන බලා ගමන් කිරීමට පැමිණි සාගරිකා දුම්රියට ගොඩ වී කාන්තාවකගේ ජංගම දුරකතනයක් සොරා ගනිද්දි දුම්රියේ සිටි දුම්රිය ආරක්ෂක නිලධාරීන් අදාළ සැකකරු ඒ මොහොතේම අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු පරීක්ෂා කිරීමේදී ඔහු ළඟ රුපියල් ලක්ෂයක් පමණ වටිනා ජංගම දුරකතන තුනක් සොයා ගැනීමට දුම්රිය ආරක්ෂක නිලධාරීන් සමත්වී තිබේ. එයින් ජංගම දුරකතන දෙකක් සැකකරුගේ සාක්කුවේ තිබියදී සොයා ගත් අතර තවත් දුරකතනයක් තම මොටර් රථයේ තිබෙන බවද දුම්රිය ආරක්ෂක නිලධාරීන් ඉදිරියේ පාපොච්චාරණය කර තිබේ.

කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් දුම්රිය මඟීන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ධාවනය වන දුම්රියවලට දුම්රිය ආරක්ෂක නිලධාරීන් යොදවීමට දුම්රිය සාමාන්‍යාධිකාරි ඩිලන්ත ප්‍රනාන්දු මහතා පියවර ගෙන ඇත. ඒ අනුව සාගරිකා දුම්රියයට මාතර දුම්රිය ආරක්ෂක සේවයේ නියුතු ආරක්ෂක නිලධාරීන් වන එච්. ඩී. අරුන කුමාර හා ආර්. පී. අනුර යන නිලධාරීන් දෙදෙනා අදාළ සැකකරු අත්අඩංගුවට ගෙන පරීක්ෂා කිරීමේදී ඔහු සතුව තිබී පෞද්ගලික බැංකුවක විධායක නිලධාරියකු බව සනාථ වන හැඳුනුම්පතක් සොයා ගත් අතර අත්දිගට දමා හොඳින් හැද පැළඳ ගෙන දුම්රියේ කාලයක් තිස්සේ මඟීන්ගේ මුදල් පසුම්බි හා ජංගම දුරකතන සොරා ගැනීම සිදු කර ඇතැයිද සැකකරුගේ ප්‍රශ්න කිරීමේදී හෙළිවී තිබේ. පානදුර කුරුස හන්දියේ පදිංචි සැකකරු අවුරුදු 35 පමණ වයසැති අයකු බවද දුම්රිය ආරක්ෂක නිලධාරීහු පවසති.

කොටුව දුම්රිය ආරක්ෂක අධිකාරී අනුර ප්‍රේමරත්න මහතාගේ උපදෙස් මත, දුම්රිය ආරක්ෂක නිලධාරීන් වන එච්. ඩී. අරුන කුමාර හා ආර්. පී. අනුර මහත්වරුන් විසින් අදාළ සැකකරු වැඩි දුර පරීක්ෂණ පැවැත්වීම සඳහා කොටුව පොලිසිය වෙත බාර දී ඇත.

# මුහුණු පොතේ පළ වන කොවිඩ් තොරතුරු සත්‍ය නොවේ

### සබරගමු පළාත් සෞඛ්‍ය සේවා අධිකාරී කපිල කන්නන්ගර

**එන්. පී. රාජදොරේ**
**රත්නපුර විශේෂ වාර්තාකරු**

සබරගමු පළාතෙන් කොරෝනා ආසාදිතයන් 16 දෙනකු පෙරේදා (15) දින වන විට වාර්තා වී ඇත. මෙම රෝගීන්ගෙන් 13 දෙනකු කෑගල්ල දිස්ත්‍රික්කයෙන්ද තිදෙනකු රත්නපුර දිස්ත්‍රික්කයෙන්ද වාර්තා වී ඇතැයි සබරගමු පළාත් සෞඛ්‍ය සේවා අධිකාරී කපිල කන්නන්ගර මහතා පැවසීය. කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ කොයිඩ් 19 ආසාදිතයන් 13දෙනාට, කෑගල්ල රෝහලෙන් වාර්තා වූ වෛද්‍යවරුන් තිදෙනාද ඇතුළත් වන බවද කන්නන්ගර මහතා කීය. කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ කෝවිඩ් 19 ආසාදිතයන්ගෙන් වැඩි දෙනකු මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවකයන්, ඔවුන්ගේ පවුලේ අය සහ ළඟින් ඇසුරු කළ අය බවද හෙතෙම පැවසීය.

රත්නපුර වැල්ලඳුර ප්‍රදේශයෙන් හමු වූ ආසාදිතයා මේ වන විට ඉරණවිල රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටී. මොහුගේ දෙවන (P. C. R.) පරීක්ෂණය මේ මස 19 වැනි දින පැවැත්වීමට නියමිත බව පැවසූ කන්නන්ගර මහතා මෙම ආසාදිතයා ඇසුරු කළ විදුලිබල මණ්ඩලයේ රියැදුරා නිරෝධානයට ලක් කර ඇති බව පැවසුවේය.

කොවිඩ් ආසාදිතයන් පිළිබඳ නිවැරදි තොරතුරු රජය විද්යුත් නාලිකා සහ මුද්‍රිත මාධ්‍ය මගින් ලබා දෙන හෙයින්, මුහුණු පොතේ විවිධ පුද්ගලයන් පළ කරන තොරතුරු විශ්වාස නොකරන ලෙසත් වෛද්‍යවරයා ජනතාව දැනුවත් කළේය. තොරතුරු ලබා ගැනීමේදී සහ ප්‍රකාශ කිරීමේදී අවබෝධයෙන් යුතුව කටයුතු කරන ලෙස කන්නන්ගර මහතා ජනතාවගෙන් ඉල්ලා සිටියේය.

# මාස නවයකදී මිලියන 121ක මත්ද්‍රව්‍ය අත්අංඩගුවට

### සැකකරුවන්ගෙන් තුනෙන් එකක් කාන්තාවෝ

**නිමල් රාජපක්ෂ**

ජනවාරි පළමු වැනිදා සිට සැප්තැම්බර් මස 30 වැනිදා දක්වා ගත වූ මාස නවය තුළ දිවයින පුරා කළ සෝදිසි මෙහෙයුම්වලදී රුපියල් මිලියන 121ක් වටිනා මත්ද්‍රව්‍ය තොගයක් සමඟින් සැකකරුවන් 30354කු අත්අඩංගුවට ගැනීමට සුරාබදු දෙපාර්තමේන්තුව සමත් වී තිබේ.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අතර කාන්තාවන් 3020 ක් සිටින බව සුරාබදු මාධ්‍ය ප්‍රකාශක, සුරාබදු කොමසාරිස් කපිල කුමාරසිංහ මහතා පවසයි.

මෙම වැටලීම්වලදී නීති විරෝධී මත්පැන් නිෂ්පාදනාගාර, මත්පැන් විකිණීම, ප්‍රවාහනය, සන්තකයේ තබා ගැනීම, රා හා රජයේ අරක්කු විකිණීම ඇතුළු මත්පැන් ජාවාරම්කරුවන් 24434ක්ද, හෙරොයින් විකිණීම, ප්‍රවාහනය, කොකෙන්, ගංජා විකිණීම, ප්‍රවාහනය යනාදිය සම්බන්ධයෙන් සැකකරුවන් 4424 ක්ද, බදු නොගෙවූ සිගරට් සන්තකයේ තබා ගැනීම්, අවුරුදු 21 ට අඩු අයට දුම්වැටි අලෙවිය හා ප්‍රදිස්ධ ස්ථානවල දුම්පානය කළ අය 1533 ක්ද කොටු කර ගැනීමට සුරාබදු නිලධාරීන් සමත් වී ඇත.

දිවයින පුරා ඇති සුරාබදු ස්ථාන 57කින් හා සුරාබදු විශේෂ මෙහෙයුම් ඒකක 5ක් මගින් සිදු කරන ලද සාර්ථක වැටලීම්වලදී මත්ද්‍රව්‍ය හා දුම්කොළ අපරාධ යටතේ අත්අඩංගුවට ගත් සැකකරුවන් 30354 දෙනා අදාළ ප්‍රදේශවල මහේස්ත්‍රාත් අධිකරණ වෙත ඉදිරිපත් කොට රුපියල් මිලියන 119 ක දඩ මුදලක් අය කර ගෙන ඇත.

අදාළ පලාත් භාර සහකාර සුරාබදු කොමසාරිස්වරුන්ගේ හා සුරාබදු අධිකාරීවරුවරුන්ගේ උපදෙස් හා අධීක්ෂණය යටතේ දිවයිනේ පළාත් නවයම ආවරණය වන පරිදි සුරාබදු ස්ථානාධිපතිවරුන්ගේ හා නිලධාරීන්ගේ සහයෝගය මත මෙම වැටලීම් සිදු කොට ඇත.

# ලොව පුරා කොවිඩ් ලක්ෂ 11ක් බිලි ගනී

**සෞඛ්‍යයට මෙතෙක් කලක් දමා තිබුණෙ — රීති**
**ඒවා කඩ කර දමලා වෙයි සමහරු — ප්‍රීති**
**හිර නොකළොත් දැනෙන්නෙ නෑ වගෙ සමහර — ජාති**
**කඩ කෙරුවොත් දඬුවම් දෙයි දැන් තිබෙන්නෙ — නීති**



**මහින්ද අලුත්ගෙදර**

ලොව පුරා කොවිඩ් 19 හෙවත් නව කොරෝනා වයිරසය ආසාදනය වූවන් අතරින් මිය ගිය සංඛ්‍යාව ලක්ෂ 11 ඉක්මවා ගොස් තිබේ.

නවතම දත්තවලට අනුව වාර්තා වන මිය ගිය සංඛ්‍යාව 1,102,941ක් වන අතර මුළු ආසාදිතයන් සංඛ්‍යාව 39,175,466ක් වෙයි. ඒ අතරින් 29,378,743 දෙනකු සුවය ලබා තිබෙන බව වාර්තා වෙයි.

වැඩිම ආසාදිතයන් පිරිස අමෙරිකාවෙන් වාර්තා වන අතර එම සංඛ්‍යාව 8,216,315 ක් වන අතර එරට මරණ සංඛ්‍යාව 200,000 ඉක්මවා යෑම විශේෂත්වයකි. ඒ අනුව එරට මිය ගිය සංඛ්‍යාව 222,717 ක් වෙයි. මේ අතර ඉන්දියාවේ ආසාදිතයන් 7,370,468 ක් සහ බ්‍රසීලයේ ආසාදිතයන් සංඛ්‍යාව 5,170,996ක් ලෙස වාර්තා වන අතර රුසියාවද ආසාදිතයන් ලක්ෂ 10 ඉක්මවා ගොස් ඇත. පේරු, කොලොම්බියාව, මෙක්සිකෝව, දකුණු අප්‍රිකාව, ස්පාඤ්ඤය, ආර්ජන්ටිනාව, ප්‍රංශය, එක්සත් රාජධානිය, ඉරානය යන රටවල ආසාදිතයන් ප්‍රමාණය 500,000 ඉක්මවා ගොස් ඇත.

මේ වනවිට කොවිඩ් නයින්ටීන් ආසාදනය වීම හේතුවෙන් ලොව පුරා මිය ගිය සංඛ්‍යාව දෙලක්ෂයකට වැඩි පිරිසක් අමෙරිකා එක්සත් ජනපදයෙන් වාර්තා වන අතර ඉන්දියාවෙන් හා බ්‍රසීලයෙන් ලක්ෂයකට වැඩි මරණ සංඛ්‍යාවක් වාර්තා වෙයි. ඒ අනුව බ්‍රසීලයේ මරණ සංඛ්‍යාව 152,513 ක් වන අතර ඉන්දියාවේ මරණ සංඛ්‍යාව 112,161 කි. ඇමෙරිකා එක්සත් ජනපදයේ ජෝන්ස් හොප්කින්ස් විශ්වවිද්‍යාලයේ සංඛ්‍යා ලේඛන අනුව කොවිඩ් 19 වයිරසය හේතුවෙන් ස්පාඤ්ඤයේ 33553ක්, ඉතාලියේ 36372ක්, ප්‍රංශයේ 33125ක්, බ්‍රිතාන්‍යයේ 43293ක්, බ්‍රසීලයේ 152513ක්, රුසියාවෙ 23491ක්, බෙල්ජියමේ 10327ක්, ඉරානයේ 29605ක්, නෙදර්ලන්තයේ 6692ක්, මෙක්සිකෝවේ 85285ක්, කැනඩාව 9699ක් සහ ජර්මනියේ 9810ක් ලෙස මරණ වාර්තා වී තිබේ. ඊට අමතරව අසල්වැසි ඉන්දියාවේ ආසාදිතයන් 7,370,468ක් වාර්තා වන අතර, මිය ගොස් තිබෙන සංඛ්‍යාව 112,161 කි.

චීනයේ හුබෙයි පළාතේ වුහාන් නගරයෙන් ව්‍යාප්ත වීමට පටන්ගත් නව කොරෝනා වයිරසය පැතිර යෑමේ නව කේන්ද්‍රස්ථානය බවට ඇමෙරිකානු කලාපය සහ ආසියාව පත්ව ඇතැයි ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙයි. මේ වන විට ලොව වැඩිම ආසාදිතයන් සංඛ්‍යාවක් වාර්තා වන රටවල් ලැයිස්තුවේ තවදුරටත් පෙරමුණේ පසු වන්නේ අමෙරිකාව වන අතර, ඉන්දියාව දෙවැනි ස්ථානයේත්, බ්‍රසීලය තෙවන ස්ථානයේත්, රුසියාව සිව්වන ස්ථානයේ හා ස්පාඤ්ඤය පස්වැනි ස්ථානයේත් පසුවෙයි.

# අද සිට සුළං අඩු වන හැඩක්

**උපාලි කරුණාරත්න**

දිවයිනේ නිරිත දිග කොටසේ පැවැති වැසි තත්ත්වයේ සහ රට පුරා පැවැති සුළං තත්ත්වයේ අඩුවීමක් අද (17) සිට ඉදිරි දින කීපයේ ඇති වන බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පැවසීය.

අද (17) දිනයේ බස්නාහිර සහ සබරගමුව පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් වැසි ස්වල්පයක් ඇති වේ. වව්නියාව, මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක වල ප.ව 2.00න් පසුව ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැකිය. හම්බන්තොට සිට පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු විය හැකිය. දිවයින වටා සෙසු මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු වේ.

# හබරාදූව පොලීසියේ පීසීආර් වාර්තා ලැබේ

**එස්. දීයගහගේ - දකුණු පළාත් සංචාරක**

නිරෝධායනයට යොමු කර සිටින හබරාදුව පොලිසියේ නිලධාරින් හය දෙනාට කොරෝනා වයිරසය

ආසාදනය වී නැති බව ඔවුන්ගේ පී. සී. ආර්. පරීක්ෂණවලදී තහවුරු වී ඇතැයි හබරාදුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෛද්‍ය පමෝද සිරිවර්ධන මහතා ඊයේ (16) පැවසීය. හබරාදුව පොලිසියේ කොස්තාපල්වරයකු නිවාඩු ලබා, පසු ගිය 30 වැනි දින මැදවච්චියේ පිහිටි නිවෙසට ගොස් 6 වැනි දින නැවත රාජකාරියට පැමිණ ඇත.

එම කොස්තාපල්වරයා මැදවච්චියේදී මිනුවන්ගොඩ ඇඟලුම් කම්හලේ සේවකයකු සමඟ සමීප ඇසුරක් පවත්වා ගෙන ගොස් ඇති බව අනාවරණය වීමෙන් පසු, මෙම කොස්තාපල්වරයා සමඟ හබරාදුව පොලිසියේ සේවය කරන තවත් උප පොලිස් පරීක්ෂකවරුන් දෙදෙනෙකු, සැරයන්වරයකු සහ කොස්තාපල්වරුන් දෙදෙනෙකුද නිරෝධායනය සඳහා හබරාදුව නිල පියස නිරෝධායනය මධ්‍යස්ථානය වෙත යොමු කර තිබිණි. පෙරේදා (15) මොවුන් සඳහා පී. සී. ආර්. පරීක්ෂණ පැවැත්විණි. එම පරීක්ෂණ අනුව මොවුන් හයදෙනාම කොරෝනා ආසාදිතයන් නොවන බව තහවුරු වී ඇතැයි වෛද්‍ය සිරිවර්ධන මහතා වැඩිදුරටත් සඳහන් කළේය.





**කණ්ඩායම් හයක් යොදවා — පොලීසියේ**
**රහස් පොලීසියෙ හැටකුත් යොදා — තියේ**
**ඉන්නා තැනක් ගැන හෙව්වත් දිවා — රැයේ**
**මොන දීපංකරේටද ඔහු පලා — ගියේ**

**හැම දේකින්ම පැන පැන ගිය කොහොම — හරී**
**දැන් නම් පෙනෙනවා ඇති වග කොළය — ඉරී**
**තොප්පිය ගියත් කොතැනට කොයි අතට — හැරී**
**පොඩි බඩුවක්ද? අල්ලන්නට මොකද — බැරී**

**රටේමුල්ලේ මුදන්නායක**

**ශ්‍රීකාන්තගේ ප්‍රියදූපත**



• මෛත්‍රීගෙ අත්සනත් හොරට ගහල කියන්නෙ බං !

• මරණීය දණ්ඩනය නියම වෙච්ච එකාව නිදහස් කළෙත් කවුරුහරි අත්සන හොරට ගහල වෙන්න බැරිද සර් !



# ලෝකයටම අලුත් නිපැයුම් තනන
# කඳුකර විද්‍යාගාරය




ශ්‍රී ලංකාව ආර්ථික අර්බුදවලින් පිරි රටකි. මෙරට දියුණුව උදෙසා නවෝත්පාදන ආර්ථිකයේ මූලාරම්භය සැපයිය හැකි දැනුම සහ සම්පත් විශාල ප්‍රමාණයක් අප රට සතුව පවතී. එම සම්පත් වසර දෙතුන් සියයකට මුළු ලෝකයටම නිෂ්පාදන සැපයීමට තරම් ප්‍රමාණවත්ව තිබේ. ඒ ඔස්සේ විද්‍යා පර්යේෂණ සිදු කර කර්මාන්ත වශයෙන් කරගෙන යා හැකි නිෂ්පාදන හඳුනාගෙන ඇත. එම නව සොයා ගැනීම් පහළොවක් සඳහා පේටන්ට් බලපත්‍ර ද ලැබී ඇත. වසර ගණනාවක් මුළුල්ලේ සිදු කරන ලද එම විද්‍යා පර්යේෂණ ප්‍රතිඵල පර්යේෂණාගාරවලට පමණක් සීමා වී ඇත.

ලොව බොහෝ රටවල් දියුණුවේ හිණිපෙත්ත කරා ළඟා වී ඇත්තේ මූලික විද්‍යා දැනුම සහ සම්පත් උපයෝගි කර ගත් නිෂ්පාදන හරහා වූ කර්මාන්තවලිනි. ජපානයේ ටොයොටා, කොරියාවේ සැම්සුන් ඊට උදාහරණ ලෙස ගත හැකිය. එම නිෂ්පාදන ලොව පුරා ප්‍රචලිතය.

මෙවැනි පසුබිමක අප රට සතු සම්පත්වලින් නවෝත්පාදන නිෂ්පාදන සිදු කර වසර පහක් ඇතුළත ඒක පුද්ගල ආදායම ඩොලර් හාරදහසේ සිට දොළොස්දහස දක්වා වැඩි කිරීමේ හැකියාව පවතින බව මෙරට මූලික විද්‍යා පර්යේෂණ කිරීමේ ආයතනයේ පුරෝගාමියා වන ජාතික මූලික අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සමන් සෙනෙවීර මහතා පවසයි.

විද්‍යාවට මූලිකත්වය නොදුන් කිසිම රටක් දියුණු වී නැත. දියුණුවේ ඉහළටම ගමන් කළ සෑම රටක්ම විද්‍යා පර්යේෂණ සඳහා ශ්‍රමය සහ ධනය විශාල ලෙස වැය කර තිබේ. විද්‍යා පර්යේෂණ, ව්‍යවහාරික පර්යේෂණ සහ මූලික පර්යේෂණ ලෙස දෙයාකාරයකි. ව්‍යවහාරික පර්යේෂණවලදී විද්‍යාවේ සංකල්ප මිනිසාගේ අභිවෘද්ධිය උදෙසා ප්‍රායෝගිකව භාවිතයට ගත හැකි ආකාරය පරීක්ෂා කරන අතර, මූලික පර්යේෂණවලදී විද්‍යාවේ නවතම කරුණු සෙවීම සිදු කෙරෙයි.

විද්‍යාවේ මූලික පර්යේෂණ සිදු කිරීම රටකට ඉතා වැදගත් අංශයකි. නව විද්‍යා දැනුම ගොඩනැඟීම, රටේ දීර්ඝ කාලීන දියුණුව උදෙසා නවෝත්පාදන ආර්ථිකයේ මූලාරම්භය සැපයීම මෙන්ම විශාල ව්‍යවහාරික පර්යේෂණ ප්‍රමාණයකට අවස්ථාව සැලසේ. බොහෝ රටවල මූලික විද්‍යා පර්යේෂණ සිදු කිරීමේ ආයතන පිහිටුවා ඇත. ජර්මනියේ මැක්ස් ප්ලාන්ස් ආයතනය, ඇමරිකාවේ හාර්වර්ඩ් සහ ඔක්ස්වර්ඩ්ස් විශ්වවිද්‍යාලය, ජපානයේ ටෝකියෝ විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාවේ CSIRO ආයතනය සහ ඉන්දියාවේ ටාටා ඉන්ස්ටිටියුට් යන ආයතන ඉන් සමරහකි.

මේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස විද්‍යාවේ අභිවෘද්ධිය උදෙසා ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති ප්‍රධානතම ආයතනය වන්නේ මහනුවර හන්තාන පිහිටි ජාතික මූලික අධ්‍යයන ආයතනයයි. (NIFS) මෙය ලංකාවේ විද්‍යාව පිළිබඳව මූලික පර්යේෂණ සිදු කිරීම සඳහා පිහිටුවා ඇති එකම ආයතනයයි. මෙම ආයතනය ආරම්භ වන්නේ 1981 වසරේදිය. මූලික විද්‍යා පර්යේෂණවල ප්‍රතිඵල ලැබීමට දීර්ඝ කාලයක් ගත වුවත් විද්‍යා නව සොයා ගැනීම්වලට සම්බන්ධ පේටන්ට් බලපත්‍ර 15ක පමණ අයිතිය මේ වන විට ජාතික මූලික අධ්‍යයන ආයතනය ලබා ගෙන තිබීම විශේෂත්වයකි.

රටේ සිටින උගත්තු, බුද්ධිමත්තු, විද්‍යාඥයන් වැනි ප්‍රාමාණික දැනුම ඇත්තන්ගේ නැණ නුවණ එක් තැන් කරන මෙම ආයතනය මෙරට ඇති වටිනාම සම්පතකි.



අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සමන් සෙනෙවීර, ආචාර්ය අතුල විජේසිංහ සහ මහාචාර්ය අතුල සෙනෙවිරත්න යන මහත්වරු පර්යේෂණ නිෂ්පාදන සමඟ



ජාතික මූලික අධ්‍යයන ආයතනය

ජාතික මූලික අධ්‍යයන ආයතනයෙහි මූලාරම්භයේ අධ්‍යක්ෂ ධුරය හෙබවූයේ මහාචාර්ය චන්ද්‍රා වික්‍රමසිංහ මහතායි. 1985 වසරේ මහාචාර්ය සිරිල් පොන්නම්පෙරුම මහතා මෙහි අධ්‍යක්ෂ ධුරය හෙබවීය. මෙම ආයතනයේ වර්තමානයේ මහාචාර්යවරුන් විසිහත් දෙනෙක්, ආචාර්යවරු හැටදෙනකු , පුහුණු වන හතළිස් දෙනකු ඇතුළු දෙසීයක පමණ කාර්ය මණ්ඩලයක් සේවය සපයති.

මෙම ආයතනයේ සිදු කරන ලද මූලික විද්‍යා අධ්‍යයනයන්හි ප්‍රතිඵලයක් ලෙස ලොව ප්‍රථම ජෛව පොහොර නිෂ්පාදනය කිරීමට ඔවුන් සමත් වී ඇත. කෘෂි රසායනික නිසා විනාශ වූ ශාක සහ සත්ව ප්‍රජාව නැවත ස්ථාපිත කිරීමට සමත් වුවා සේම වැඩි අස්වැන්නක් ලබා දීමටද මෙම ජෛව පොහොරට හැකියාව ඇත.

සෝයා මුං වැනි රනිල භෝග සඳහා යූරියා පොහොර භාවිතය 50%කින් අඩු කර ගැනීම සඳහා ද උපකාරි වන මෙම ජෛව පොහොර පරිසරය රැක ගැනීම සඳහා මහෝපකාරි වේ. පොහොර සඳහා රජයේ පිරිවැය අඩු කිරීමට ද හැකියාව ලැබේ. පාරිසරික ගැටලුවලට පිළියම් සෙවීම සඳහාද මෙම ආයතනය අවධානය යොමු කර ඇත. ඒ අනුව මෙහි විද්‍යාඥයන් ජෛව අඟුරු පිළිබඳව සිදු කළ මූලික පර්යේෂණවලදී කැළිකසළ භාවිතයෙන් නිපද වූ ජෛව අඟුරු මඟින් කැළිකසළ ප්‍රශ්නයට විසඳුම් ලබා දීමට හැකියාව ඇති බව තහවුරු කරගෙන ඇත. තවද පුනර්ජනනීය බලශක්ති පිළිබඳව පර්යේෂණ පවත්වා සූර්ය කෝෂ සඳහා භාවිතා කරන අමු ද්‍රව්‍ය මෙරටදීම අඩු වියදමකින් නිපදවීමට හැකියාව ඇති බව සොයා ගෙන ඇත.

මෙරට තිබෙන සුවිශේෂ සම්පතක් වන මිනිරන් උපයෝගි කරගෙන බැටරි නිෂ්පාදනය කිරීම පිළිබඳව පර්යේෂණ සිදු කර අවසන් කොට ඇත. මේ තුළින් බැටරියක්ද නිෂ්පාදනය කොට සාර්ථකත්වය ලබා ඇත. මුළු ලෝකෙටම සැපයිමට අවශ්‍ය බැටරි නිෂ්පාදනයට අවශ්‍ය තරම් මිනිරන් අප රට සතුව පවතී.

ජීව අජීවි සම්පත් ගවේෂණයේ යෙදීම, මෙරට උණු ළිං තුළ ඇති භූගත තාපය මඟින් විදුලිය නිපදවීම අත්හදා බැලීම සඳහාත් පර්යේෂණ කර ඇත. එමෙන්ම විවිධ ලෙස රෝග හඳුනා ගැනීම සහ පාලනය පිළිබඳව පර්යේෂණ කිරීම ද වැදගත් වේ.

මෙම ආයතනය පර්යේෂකයන් පුහුණු කරන ආයතනයක් ලෙස ද කටයුතු කරනු ලබයි. මූලික විද්‍යා පර්යේෂණවලට අමතර අන්තර්ජාතික විවිධ ක්ෂේත්‍රවල දැනුම හුවමාරු කිරීමේ මධ්‍යස්ථානය බවට පත් වෙමින් දකුණු ආසියාවේ ප්‍රථම විද්‍යා පණිවිඩ සේවාව වන විදුනැණ හවුල පවත්වාගෙන යනු ලබන්නේ ද ජාතික මූලික අධ්‍යයන ආයතනයයි.


මෙම ආයතනය විශ්වවිද්‍යාල ආචාර්යවරු පුහුණු කරන ආයතනයක් ලෙස ද ක්‍රියා කරනු ලබයි. ඉදිරියේදී පශ්චාත් උපාධි පර්යේෂණ විශ්වවිද්‍යාලයක් ලෙස එම කටයුත්ත පුළුල් කිරීමට ද කටයුතු යොදා තිබේ.

මෙහි පවතින බොහෝ සම්පත් අමුද්‍රව්‍ය ලෙස ඉතා අඩු මුදලකට විදේශ රටවලට ගෙන ගොස් නිෂ්පාදිත භාණ්ඩ ලෙස නැවත මෙරටට ආනයනය කිරීම සිදු කරයි. මෙරට පවතින සම්පත්වලින් නිෂ්පාදනයක් නොකිරීම නිසා මේ තත්ත්වය උදා වී තිබේ. අපේ ශ්‍රමිකයන් විශාල පිරිසක් විදේශයන්හි සේවයෙහි යෙදී සිටිති. මෙරට මානව සහ භෞතික සම්පත් ඉතා ඉහළ මට්ටමක පවතී.

කලකට පෙර අප සාර්ථකව සොයා ගත් පර්යේෂණ රැසක් කාලයත් සමඟ අතපසු වී තිබේ. සූර්ය බල ශක්ති නිපැයුම පිළිබඳ පර්යේෂණ එවැන්නකි. ලෝකයේ පළවෙනි වතාවට එය සොයා ගනු ලැබුවේ අප රට විසිනි. එදා එවැනි දෙයින් ප්‍රයෝජන ගත්තා නම් අද අපේ රට තිබෙන්නේ බොහෝ ඉදිරියෙනි.

සිදු කර ඇති පර්යේෂණ සහ ප්‍රතිඵල ඔස්සේ අවධානය යොමු කොට අප රට සතු සම්පත්වලින් ලෝකය ඉදිරියේ ශ්‍රී ලාංකික නාමය ඔසවා තැබීමටත් දියුණුවේ මාවත එළිපෙහෙළි කර ගැනීමටත් දෑස යොමු කළ යුතු කාලය එළඹ ඇත.

**සටහන**
**ඉන්ද්‍රාණි තෝරදෙණිය**
**ඡායාරූප**
**රුවන් මීගම්මන**




# අපේ ප්‍රථම 'පොප්' ගායක
# සී.ටී. ප්‍රනාන්දු

(අදට යෙදෙන සී.ටී ප්‍රනාන්දු 43 වන අනුස්මරණය වෙනුවෙනි)



'රන් ස්වරයෙන් කළ ගායනා -
ලක් වැසි දන මන රස කලතා 'සමුගෙන ගියමුත් අදත් ඇසේ - මිහිරැති ගී රාවේ ඔබේ
ගීත කෝකිලයාණෙනි'

ඉහත සඳහන් වනුයේ මිල්ටන් මල්ලවආරච්චි විසින් රචනා කරන ලද, සී. ටී. ප්‍රනාන්දු සූරීන් අනුස්මරණ ගීතයයි. ඒ මහතා ස්වර්ගස්ථ වූයේ 1977 ඔක්තෝබර් 17 වන දාය.

සී.ටී. ප්‍රනාන්දු මුලින්ම ගීතයක් ගුවන් විදුලියට ගැයුවේ 1947 වසරේ දීය. ඒ 'සවස් කල ඇළේ හමන මඳ නලේ' ගීතයයි. එකල පාසල් ආචාර්යවරයකු වූ ආර්. එන්.එච් පෙරේරා, සී.ටී.ප්‍රනාන්දුට හරි අපූරු ගීතයක් රචනා කර දුනි. එය ලංකා ගීත සාහිත්‍ය තුළ මහා පෙරළියක් කළ ' පින් සිදු වන්නේ බාල ළමුන්නේ' කියන ගීතය යි. එලෙස ම සී.ටී. ප්‍රනාන්දුට ගායන ලොවේ දොර විවෘත කර දී, ඔහුගේ ගායන ජීවිතයේ නිසි ආරම්භය රැගෙන දුන්නේ ද, ආර්. එන්.එච්. පෙරේරා ලියූ මේ ගීතය යි.

තම දෙ වැනි ගීතයෙන් ම ගායන ක්ෂේත්‍රයේ ස්ථාවර වූ සී.ටී. ප්‍රනාන්දුගෙ හඬ රාවයේ රිද්මයන් ඔප මට්ටම් වූයේ ඔහු පල්ලියේ කන්තාරු කණ්ඩායමේ ප්‍රධානම සමාජිකයා වූ නිසා ය. 'රොනට වඩින බිගු ඔබ යි', ' ජේසු රජාණෙනි ඔබ වට ලා' වැනි ක්‍රිස්තු භක්ති ගී ගැයූ සී.ටී.ප්‍රනාන්දු, පසු කලෙක කේ. ප්‍රැන්සිස් රචනා කළ
'නත්තල නත්තල ආවා ආවා
අප වෙත මෙත සිත පැවා පැවා
සැම සිත සැනසිලි වඩවා
හැම හද නළවාලා' යන
ගීතය තමාගේ ගීතයක් ලෙස ගැයුවේ එකී කන්තාරු පසුබිමට ගරු කිරීමක් වශයෙන් විය හැකි ය.

'අම්බිලි මාමේ ඔබ මොකද කරන්නේ', 'බර බාගේ බර බාගේ' වැනි ජනප්‍රිය ගීත මෙන් ම, 'මේ වෙසක් දිනේ, පෝය ලැබූ තැනේ' වැනි බොදු ගීත ආර්.එන්. එච්. පෙරේරා රචනා කර දෙමින් සී.ටී.ට, මුල් කල දුන් 'තල්ලුව' තුළින් "සී.ටී" යන නාමය ලාංකීය ගීත ක්ෂේත්‍රයේ බැබළෙන්නට පටන් ගතී.

එතැන් පටන් සී.ටී.ප්‍රනාන්දු ගීත ගණනාවක් ගයමින්, විවිධ රචකයන්ගේ රචනා තුළින් තම අනන්‍යතාව තහවුරු කරන්නට විය. එසේ තහවුරු වූ අනන්‍යතාව නම් ලාංකීය හැඩහුරු කම ඇති පද මාලාවන්, බටහිර 'පොප්' ස්වරයෙන් ගැයීම ය. නිදසුනකට, 'රෑ පැල් රකලා පැල් කවි කියලා' යන පද ලාංකීය ගැමි ජීවිතයට නෑකම් කීවද, එහි තනුව, සංගීතය මෙන්ම ගායනය අයත් වූයේ බටහිර පොප් ශෛලියටය. මේ සී.ටී ප්‍රනාන්දුගේ අනන්‍යතාවයි. එ ලෙස ම ඔහු සරල සුගම ජීවන අත්දැකීම් සහිත පද රචනාවලට යොදා ගත්තේ 'වෝල්ට්ස්', හා ලතින් ඇමරිකානු සංගීත ශෛලියන්ය. ඔහුගේ, 'මා බාල කාලේ', 'බිලිඳා නැළවේ උකුළේ', 'සුවඳ රෝස මල් නෙලා', 'සමන් කැකුළු අතුරලා', 'සඳවට රන් තරු', 'ලෝ අඩ නින්දේ', 'පින් සිදු වන්නේ', 'බර බාගේ බර බාගේ', 'අනන්ත ගී මා මුවින්' වැනි ගීත ඔහු නිර්මාණය කර තිබුණේ එකී 'වෝල්ට්ස්' රිද්මයට ය.

ලතින් ඇමරිකානු සංගීත රටාවලට අයත් 'බොසනෝවා' 'රුම්බා' 'රොක් ඇන්ඩ් රෝල්' වැනි සංගීත රිද්මයන් හෙතෙම සිය බොහෝ ගීතවලට එකතු කර ගති. 'රන්වන් රන් කෙඳි පීරාලා', පුරා ම රැඳි තිබුණේ 'රොක් ඇන්ඩ් රෝල්' රිද්මය යි. 'සීගිරි සුකුමාලියේ' ගීතය නිර්මාණයේ දී 'බොසොනෝවා' රිද්මය අභාසය කොට ගෙන තිබිණි.

'පරවුණු මල් නැවත නැතේ', 'සිහින ලොවේ මිහිර මැවූ මාලි', 'අවදි වන්න අවදි වන්න', 'රණ මොනරයි රණ මොනරියි', 'අම්බිලි මාමේ ඔබ මොකද කරන්නේ', 'සරුංගලේ සරුංගලේ', 'මා හද සිසිල් පවන් දියෙන්', 'පුන්සඳ හිනැහෙන්නේ', 'මල් ලෝක රාණි', 'ඔන්චිලි චිලි චිල්ල මලේ', 'මා සුකුමාලී මහද දිනූ රමණී', 'ආනේ ඩිංගක් ඉන්න කෝ' යන ගීත තුළ රැඳී තිබුණේ ලතින් ඇමරිකානු ශෛලිය තුළ අනුගත වූ ඉහත දැක්වූ රිද්මයන්ය.

පැට්‍රික් දෙනිපිටියගේ හවායින් ගිටාර් නාදය සී.ටීගේ ගීතවලට එකතු වූ අත්‍යවශ්‍ය අංගයක් විය. සීටී-පැට්‍රික් සුසංයෝගය එකල ප්‍රසංග කලාවට අත්‍යවශ්‍ය යුගලක් විය.

සී.ටී. ප්‍රනාන්දු විටින් විට චිත්‍රපට ගායනයට ද එකතු විය. සිනමාවේ දී ඔහු ගේ ජනප්‍රියතම ගීතය වූයේ 'කවුද හරි' චිත්‍රපටය වෙනුවෙන් සිසිර සේනාරත්න ගේ සංගීතයට ගැයූ 'මී වදයකි ජීවිතේ' ගීතය යි. ඔහු එය ගැයුවේ එම චිත්‍රපටයේ රඟපෑ ඩොමී ජයවර්ධනට ය. එ ලෙස ම, සී.ටී. ප්‍රනාන්දු ගායනා කරමින්, එම ගායන දර්ශනයේ ම රඟපෑ චිත්‍රපටය වූයේ 'නිම් වළල්ල ය'. එහි එන 'නිසයුරු මුතුවැල් සැලෙන වෙලාවේ' ගීතය, සංගීතවත් කළේ රංජිත් ලාල් ය. එය මහින්ද අල්ගමගේ රචනයකි. සී.ටී.ගේ 'පොප්' ශෛලයට අනුකූල ව ම එම ගීතය නිර්මාණය කර තිබුණු අතර එයට වාදනය වූයේද, බටහිර සංගීත භාණ්ඩ වූ , පියානෝව, සැක්සෆෝනය, හා එකෝස්ටික් ඩ්‍රම්ස්ය.

'සඳ නැග එද්දී' චිත්‍රපටයට සී.ටී. විසින් 'ලා තණ නිල්ලයි' නම් ගීතයක් ගායන කරන ලද අතර, එය 'සිම්පෝනි ' සංගීතයට අනුව ගයා තිබිණි. 'සැඟවුණු මැණික' චිත්‍රපටයට 'ඈත කඳුරැලි සිප සිප සැනසිලා' ගීතයත්, 'සාරවිට' චිත්‍රපටයට ' ලක්ෂ ගණන් වස්තු ලැබී' හා 'සැණකෙළිය' චිත්‍රපටයට 'පිපුණු මලකි ජීවිතේ' ගීත සමූහ ගීතයන් ලෙස ගැයුවේය.

'දෙයියන්නේ රටේ' චිත්‍රපටයට 'හිමේ සමන් දෙව් පිහිටෙන්', 'පෙම් කුරුල්ලෝ' චිත්‍රපටයට 'මී අඹ වනයේ', 'චණ්ඩියා' චිත්‍රපටයට 'මග හිඟන කොටත්', 'කවට අන්දරේ' චිත්‍රපටයට 'හොඳයි කාලේ අපට ලැබූ', 'මොකද වුණේ' චිත්‍රපටයට 'දන්නෝ දනී අප', 'පාරා වළලු' චිත්‍රපටයට 'ගොනා නොවෙයි හරකයි බර අදින්නෙ', සහ 'හතර මහ නිධානය' චිත්‍රපටයට 'සෝබනලු කොළඹ' හා 'අසරණයා දුගී' යන ගීතත් සී.ටී ගේ චිත්‍රපට ගීත ලෙස හැඳින්විය හැකි ය. 'ගම් පෙරළිය', 'දෙයියන්නේ රටේ', හා 'පාරා වළලු' සී.ටී. ප්‍රනාන්දු සුළු චරිත රඟපෑ චිත්‍රපටයන්ය.

1950-1960 දශකයේ ලාංකික 'පොෂ්' සමාජය බෙහෙවින් අගය කළේ සී.ටී.ප්‍රනාන්දුව ය.

කොළඹ කුරුඳුවත්තේ අයගේ දොරවල් හැරුණු එකම සිංහල ගායකයා සී.ටී.ප්‍රනාන්දුය. එහි ගී ගැයීමට නිතර ආරාධනා ලැබුණේ, එකී උසස් සමාජය සී.ටී ගේ බටහිර පොප් ශෛලයට වඩාත් ඇලුම් කරන නිසා ය. බටහිර රටක් වූ එංගලන්තයේ ප්‍රථම වතාවට ගී ගැයූ ගායකයා මෙන් ම, ලංකාවෙන් ගීත ගැයීමට බටහිර රටකට ගිය ප්‍රථම සිංහල ගායකයා වූයේ ද සී.ටී.ප්‍රනාන්දු ය.

සීටීගේ ඇතැම් ගීත ගැඹුරට ම අධ්‍යනය කරන විට, එසේ නැත්නම් ඒ පිළිබඳව සොයා යන විට, ඔහු තනු උපයා-ගත් ඇතැම් තැන් හමු වේ. ලතින් ඇමරිකානු බොසොනොවා රිද්මයට ගැයුණු 'සීගිරි සුකුමාලියේ' ගීතය, එක් නිදසුනකි. 'දෙයාර් ඊස් අ ටැවන් ඉන් ද ටවුන්' නමැති ඉංග්‍රීසි ගීතයේ තනුව ඔහු තම 'සැලලිහිනි කොවුල් හඬ' ගීතයට එකතු කර ගෙන තිබිණි. 70 දශකයේ පෝලන්ත ගායිකාවක වූ යනීනා විසින් ගායනා කළ ඉංග්‍රීසි ගීතයක තනුවක් සී.ටී උකහා-ගෙන තිබුණේ ඔහු ගේ 'බේරෙන පැණි බිඳු' ගීතයට ය. මේ හේතුවෙන් දෝ සුරිය රෙකෝඩ් අධිපති ජෙරල්ඩ් ජයසූරිය ඔහුව හැඳින්වූයේ සිංහල 'පොප්' ගායකයා කියා ය. 60 දශකයේ තරුණයන් 'යැංකි' ගායකයා කියා කළ හැඳින්වීම 70 දශකය වන විට 'පොප්' ගායකයා වී තිබිණි.

සී.ටී. ප්‍රනාන්දු කවදත් ඇන්දේ යුරෝපීය ඇඳුමය. ඔහුගේ ස්වරූපය බ්‍රිතාන්‍ය පෙනුමක් ඉසිලීය. ඔහු වේදිකාවේ දී රිද්මයානුකූල වේ.ඔහු බොහෝ විට අනුගමනය කළේ ඇමරිකානු ජාතික නැට් කිං කෝල් ව ය. ඔහු කළු ජාතික ගායකයෙක් විය. ඔහු වේදිකාව මත තම දෙපා හා සිරුර රිද්මයට අනුව මනා සංයමයකින් චලනය වන ආකාරයට ම ය සී.ටී. ප්‍රනාන්දු වේදිකාව මත තම ගීත ඉදිරිපත් කළේ.

සී.ටී. ප්‍රනාන්දු යනු ජාතික වස්තුවකි. එහෙත් ඒ ජාතික වස්තුවේ මතකය දැන් ටිකෙන් ටික වියැකෙමින් යයි. ඔහුගේ පුත් ප්‍රියන්ත ප්‍රනාන්දු වුව ද, සී.ටී. ගේ නාමය කල්ප ගානක් රැකගැන්මට සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළේ නැත. එහෙත්, වාසනාවකට මෙ වර දෙරණ 60 ප්ලස් තරගයේ සී.ටී.ගේ ගීත ගයා අනුශූරතාව දිනාගත් මිල්ටන් මලවි ආරච්චි නම් සී.ටී. නාමය තවකල්ප ගණනාවක්ම බබළවන්නට සිය උපරිම ශක්තිය යොදවයි. එය එක් අතකට දැයේ වාසනාවකි.ඒ, මලවි ආරච්චි හරහා හෝ සී ටී. සජීව හඬ ඇසෙන්නට ලැබීම ය. ඔහු මේ වන විටත් දැවැන්ත සී.ටී. උපහාර ගී උළෙල කීපයක්ම පවත්වා ඇත.

**ශෝන් මැක්ස්මස් දිසානායක**

| ලොතරැයිය | දිනය | දිනුම් වාරය | අංක | වෙනත් |
|---|---|---|---|---|
| ගොවිසෙත | 2020 - 10 - 13 | දිනුම් වාරය - 2569 | 13 21 44 54 | අක්ෂරය G |
| සුපිරි වාසනා | 2020 - 09 - 21 | දිනුම් වාරය - 1537 | 01 33 37 57 | සුපිරි අංකය -01 |
| ලග්න වාසනාව | 2020 - 09 - 08 | දිනුම් වාරය - 2916 | 21 37 45 59 | ලග්නය-මිතුන; විශේෂිත අංක; රු 500 ත්‍යාග සඳහා-9609 |
| කෝටිපති කප්රුක | 2020 - 09 - 27 | දිනුම් වාරය - 630 | 11 21 45 64 | ඉංග්‍රීසි අක්ෂරය- E |
| සංවර්ධන වාසනාව | 2020 - 07 - 31 | දිනුම් වාරය - 354 | 22 23 40 | දෛව අංකය - 02; අක්ෂරය- L |
| ජයෝදා | 2020 - 09- 09 | දිනුම් වාරය - 1688 | 07 31 35 43 | අක්ෂරය- A |
| ශනිදා වාසනාව | 2020 - 09 - 09 | දිනුම් වාරය - 3366 | 31 34 60 64 | අක්ෂරය - D |
| සුපර් බෝල් | 2020 - 09- 27 | දිනුම් වාරය - 1228 | 11 27 35 42 | අක්ෂරය - Q; විශේෂ අංකය -5767 |
| ජාතික සම්පත | 2020 - 09-30 | දිනුම් වාරය - 1059 | 0 0 2 7 9 6 | අක්ෂරය -H |
| අද කෝටිපති | 2020 - 09 - 09 | දිනුම් වාරය - 1036 | 07 12 39 48 | අක්ෂරය - K; රු 500 ත්‍යාග සඳහා-2169 |
| වාසනා සම්පත | 2020 - 09 - 28 | දිනුම් වාරය - 1617 | 37 46 48 58 | අක්ෂරය - G |
| දරු දිරි සම්පත | 2020 - 07 - 30 | දිනුම් වාරය - 013 | 04 12 33 63 | අක්ෂරය - U |

# අත්අඩංගුවට නොගන්නැයි රියාජ්ගේ පෙත්සම සලකා බැලීම 20දා

**නෙල්කා මැදගෙදර**

ඉකුත් වසරේ අප්‍රේල් මස 21වැනි පාස්කු දින සිදු වූ ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන රඳවා තබා සිට පසුගිය සැප්තැම්බර් 29වැනිදා රහස් පොලිසිය විසින් නිදහස් කළ තමන් නැවත අත්අඩංගුවට ගැනීමෙන් හෝ අත්අඩංගුවට ගැනීමට පියවර ගැනීමෙන් වැඩ බලන පොලිස්පතිවරයා ඇතුළු බලධාරීන් වළක්වන පොහිබිෂන් රිට් ආඥාවක් සහ අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා රියාජ් බදියුදීන් මහතා ගොනු කළ පෙත්සම මෙම මස 20වැනිදා සලකා බැලීමට අභියාචනාධිකරණය ඊයේ (16) තීරණය කළේය.

පෙත්සම සම්බන්ධ නොතීසි නීතිපතිවරයා ඇතුළු එහි වගඋත්තරකරුවන්ට දන්වා යවන ලෙස පෙත්සම්කරුගේ නීතිඥවරයාට නියම කෙරිණ.

මහින්ද සමයවර්ධන සහ අර්ජුන ඔබේසේකර යන අභියාචනාධිකරණ විනිසුරු මඩුල්ල හමුවේ මෙම පෙත්සම කැඳවනු ලැබිණි .

මෙම පෙත්සම හදිසි කරුණක්මත ගොනු කර ඇති බැවින් එය කඩිනමින් විභාග කිරීමට සලකා බලන ලෙස පෙත්සම්කරු වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ පායිස් මුස්තාපා මහතා ඉල්ලා සිටියේ ය.

ඒ අනුව එම පෙත්සම ලබන සතියේ දිනයක සලකා බැලීමට නියම කෙරිණ.

වැඩ බලන පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටපු නියෝජ්‍ය පොලිස්පති නුවන් වෙදිසින්හ, එහි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ප්‍රසන්න ද අල්විස්, එහි ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක මිහිදු අබේසිංහ ඇතුළු හත් දෙනකු මෙහි වගඋත්තරකරුවෝ වෙති.

නීතිඥ ගෞරි සංගරී තවරාසා මගින් මෙම පෙත්සම ගොනු කර තිබේ.

# කුමාර් සානුටත් කොරෝනා

**මහින්ද අලුත්ගෙදර**

ඉන්දීය ප්‍රවීණ ගායක කුමාර් සානුට නව කොරෝනා වෛරසය ආසාදනය වී තිබේ.

සුප්‍රකට චිත්‍රපට පසුබිම් ගායකයෙකු වන ඒ මහතාට සිදුකළ පී.සී.ආර් පරීක්ෂණයක දී කොවිඩ් වෛරසය ආසාදනය වී ඇති බවට තහවුරු කරගෙන තිබෙන බවට ඔහුගේ නිල ෆේස්බුක් පිටුවේ සඳහන් කර ඇත.

කෙසේ වෙතත් ඒ මහතා යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් පසු වන බවද කුමාර් සානු සිය බිරිඳ සහ දරුවන් සමඟ පසුගිය 14 වෙනිදා අමෙරිකාවේ ලොස් ඇන්ජලිස් බලා පිටත්ව යාමට නියමිතව තිබූ අතර ඇතිවූ නවතම තත්ත්වය හමුවේ එය නතර කර තිබෙන බවද වාර්තා වෙයි.

දශක තුනකට අධික කාලයක් බොලිවුඩ් සිනමා පට රැසක පසුබිම් ගායනයෙන් දායක වී ඇති කුමාර් සානු මේ වනවිට 62 හැවිරිදි වියේ පසුවෙයි.

# කොරෝනා සමඟ රට ඉදිරියට යනවා නම් සෞඛ්‍ය අංශ ශක්තිමත් කරගත යුතුයි

## ජවිපෙ ප්‍රචාරක ලේකම් විල්වින් සිල්වා

**නදී මාණික්කගේ**

රට වහගෙන දිගටම සිටීමට නොහැකි බව පැහැදිලි වුවද කොරෝනා සමග රට ඉදිරියට ගෙනියනවා නම් සෞඛ්‍ය අංශ මීට වඩා ශක්තිමත් කරගත යුතු බවත් කොරෝනා රෝගීන්ට ත්‍රස්තවාදීන්ට ලෙස සැලකීම නැවැත්වීම හා රජය විසින් කරනු ලබන පීසීආර් පරීක්ෂණ ගණන වැඩිකළ යුතු බව ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් ටිල්වින් සිල්වා මහතා ඊයේ (16) දිනමිණට පැවසුවේය.

රෝගීන් වැඩිවන විට රෝගීන් භාරගන්නා රෝහල් ගණන වැඩිකළ යුතු බවත් මේ වන විට රෝහල්වල ඇඳවල් අවසන් වෙමින් යන බැවින් ඇඳවල් ප්‍රමාණය වැඩිකිරීම, හුස්ම ගැනීම පහසු කිරීමේ උපකරණ වැඩිකිරීම වැනි පහසුකම් වැඩිකිරීමේ ක්‍රියාමාර්ගයකට යා යුතු බවත් මේ රෝගය අපරාධයක් නොවන බවට සමාජ මතය සකස් කළ යුතු බවත් කීවේය.

ආණ්ඩුව, හමුදාව ප්‍රමුඛ කොරෝනා මර්ධන ඒකකය සහ සමහර ජනමාධ්‍ය එකතු වී කොරෝනා රෝගීන් ත්‍රස්තවාදීන් ලෙස පෙන්වන බවත් සාමාන්‍ය ජනතාව බිය වී ඇත්තේ කොරෝනා රෝගයට නොව රෝගය වැළඳීමෙන් ඇතිවන සමාජ හෙළාදැකීම හා අපරාධකරුවන්ට සේ සැලකීම පිළිබඳව බව කියා සිටි ටිල්වින් සිල්වා මහතා රජය විසින් කරනු ලබන පීසීආර් පරීක්ෂණ සංඛ්‍යාව වැඩි කිරීමත් පුද්ගලිකව එම පරීක්ෂණ කරන්නන්ට එය ව්‍යාපාරයක් බවට පත්කර ගැනීමට ඉඩනොදී සිටීමත් කළ යුතු බව සඳහන් කළේය.

# ලක්ෂ 4ක මත් පෙති 3750ක් ලුනාවෙන් අල්ලයි

**බොරලැස්ගමුව සමූහ සෙනවිරත්න කහටපිටිය**

කොළඹ හා තදාසන්න ප්‍රදේශවලට මහා පරිමාණයෙන් මත් පෙති බෙදා හැරීමේ නියුතු පුද්ගලයකු අලෙවිය සඳහා රැගෙන යමින් තිබූ රුපියල් ලක්ෂ හතරකට ආසන්න වටිනා මත් පෙති 3750ක් සහ ප්‍රවාහනය සඳහා යොදාගත් වෑන් රථය ද අලෙවියෙන් උපයාගත් මුදල් රුපියල් 31500/=ක මුදලක් සමග ඉකුත් 15 දින රාත්‍රියේ ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය මගින් ලුනාව ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇතැයි ගල්කිස්ස පොලීසිය කියයි.

සැකකරු රත්මලාන වෙඩිකන්ද පදිංචි වයස(35) ක්ද වන අතර මොහු මෙම වෑන් රථය යොදාගන මත් පෙති නියෝජිතයින් හරහා වැල්ලවත්ත, දෙහිවල, රත්මලාන, ගල්කිස්ස, ලුනාව, මොරටුව, පිලියන්දල, බොරලැස්ගමුව යන ප්‍රදේශවලට බෙදාහැර ඇති බවටත් මූලික විමර්ශනවලදී අනාවරණයවී ඇතැයි ද පොලීසිය කියයි.

වැඩිදුර පරීක්ෂණ ගල්කිස්ස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රෝහන් ප්‍රේමරත්න මහතාගේ අධීක්ෂණය මත ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක පුෂ්පකුමාර මහතා ඇතුළු නිලධාරීන් විසින් සිදු කර ගන යනු ලබයි. සැකකරු සහ නඩු භාණ්ඩ 16 වන දින ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

# මහනුවර වෙළෙඳසලක සෝපානය කඩා වැටී දෙදෙනෙක් මරුට

**අසේල කුරුළුවංශ**

මහනුවර ධර්මාශෝක මාවතේ පස්මහල් ගොඩනැගිලක් වන වාසනා ටෙක්ස් හි තාවකාලික සෝපානය කඩා වැටීමෙන් එහි සේවකයින් දෙදෙනකු මිය ගියේය.

රෙදිපිලි ඉහළට පහළට ගෙන යාම සඳහා සකසා තිබූ තාවකාලික සෝපානය ඊයේ 9දා පෙරවරු 9.00 ට පමණ කඩාවැටීමෙන් මෙම අනතුර සිදුව තිබේ.

අනතුරින් මිය ගොස් ඇත්තේ, කටුගස්තොට උඩුවාවල පදිංචිව සිටි පනස් දෙහැවිරිදි කලල්දොරේ ගෙදර උපාලි සහ මහනුවර ඔගෙස්ටාවත්තේ සිරිමල්උයන 10 ජී නිවසේ පදිංචිව සිටි අම්බලන්ගොඩ ගෙදර අරවින්ද යන අයය.

මොවුහු වාසනා ටෙක්ස් ගොඩනැගිල්ලේ ඉදිකරමින් තිබූ කොටසට සිමෙන්ති ගෙන යමින් සිට ඇත. රෙදි ගෙන යන තාවකාලික සෝපානයේ සිමෙන්ති කොට්ට අටක් දමා ගෙන යමින් සිටියදි මෙම අනතුර සිදුව ඇත. මහනුවර පොලිසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

# ගිනිගත් නැවේ කපිතාන්ට පැනවූ විදෙස්ගතවීමේ තහනම ඉවතට

**සිරන්ජනි කුමාරි**

ශ්‍රී ලංකා සමුද්‍රයට ආසන්නව ගිනි ගැනීමට ලක්වූ නිව් ඩයමන්ඩ් නෞකාවේ කපිතාන්වරයාට අධිකරණය මගින් පනවා තිබූ විදේශ ගමන් තහනම ඉවත් කරන ලෙස කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් මොහමඩ් මිහාර් මහතා ඊයේ (16 )නියෝග කළේය.

නිව් ඩයමන්ඩ් නෞකාවේ කපිතාන්වරයා වන ග්‍රීක ජාතික තිරෝස් හිල්යාස් වෙනුවෙන් ඔහුගේ නීතිඥවරු මෝසමක් මගින් ඉදිරිපත් කළ කරුණු සලකා මහේස්ත්‍රාත්වරයා මෙම නියෝගය කළේය.

තම සේවාදායකයා කොළඹ මහාධිකරණය හමුවේ අදාළ චෝදනාවලට වරද පිළිගෙන රුපියල් මිලියන 12ක දඩයක් දැනටමත් ගෙවා ඇති බවට කපිතාන්වරයා වෙනුවෙන් පෙනීසිටි නීතිඥවරයා අධිකරණ හමුවේ කරුණු දක්වමින් ඔහුට පනවා තිබෙන විදේශ ගමන් තහනම ඉවත් කරන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටියේය.

අදාළ ඉල්ලීම සලකා බලු මහේස්ත්‍රාත්වරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විරෝධයක් නොමැති බැවින් කපිතාන්වරයාට පනවා තිබූ විදේශ ගමන් තහනම ඉවත් කිරීමට නියෝග කළේය.

## මුදලින් ලක්ෂයයි: ශරීර ඇප ලක්ෂ 40යි

# පොඩි ලසීට ඇප

**එස් දීයගහගේ**
**දකුණු පළාත් සංචාරක**

ජනාධිපතිතුමාට, ආරක්ෂක ලේකම්වරයාට සහ බන්ධනාගාරයේ උසස් නිලධාරින් කීප දෙනකුට මරණ තර්ජන කිරීම සම්බන්ධයෙන් පවරා ඇති නඩුවේ දෙවන සැකකරුවන සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයකුවන අරුමා හන්දි ජනිත්

මදුසංක හෙවත් පොඩි ලසී නමැති අය රුපියල් ලක්ෂයක මුදල් ඇපයක් සහ රුපියල් ලක්ෂ 10ක ශරිර ඇප හතරක් මත මුදා හරින ලෙස ගාල්ල ප්‍රධාන මහේස්ත්‍රාත් හර්ෂණ කැකුණවෙල මහතා ඊයේ (16) නියෝග කළේය.

දැනට දින 90ක රැඳවුම් නියෝග මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ සිටින සැකකරු රැඳවුම් නියෝග කාල සීමාව අවසන්වූ පසු මෙසේ ඇප මත මුදා හරින ලෙස නියෝග කළ මහේස්ත්‍රාත්වරයා සෑම මසකම අවසන් ඉරුදින අපරාධ පරීක්ෂණදෙපාර්තමේන්තුවේ පෙනී සිටින ලෙස ද සැකකරුට නියෝග කළේය. ඇප නියෝග කළ මහේස්ත්‍රාත්වරයා සැකකරුට විදේශ ගමන් තහනම් කොට විදේශ ගමන් බලපත්‍රයක් ඇත්නම් එය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දෙන ලෙසද නියෝග කළේය .

දැනට දින 90ක රැඳවුම් නියෝග මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ සිටින සැකකරු ඊයේ අධිකරණයට ඉදිරිපත් නොකරන ලදි.

නියෝජ්‍ය සොලිස්ටර් ජෙනරාල් දිලිප පීරිස් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර පොලිස් අධිකාරි මෙරිල් රංජන්ළමාහේවා සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක පොල්වත්ත යන මහත්වරු පැමිණිල්ල මෙහෙය වූහ. ජනාධිපති නීතිඥ ටිරන්ත වලලියද්ද මහතා ඇතුළු නීතිඥවරු නව දෙනෙක් සැකකරු වෙනුවෙන් පෙනී සිටියහ.

සැකකරුට එරෙහිව පවරා ඇති තවත් නඩු කීපයක් සම්බන්ධයෙන් බූස්ස බන්ධනාගාරයේ රිමාන්ඩ්කර සිටි පොඩි ලසී නමැති සැකකරු මත්ද්‍රව්‍ය ගිනි අවි ජාවාරම් කිරීම සහ මනුෂ්‍ය ඝාතනවලට සම්බන්ධ බවට තොරතුරු ඇති නිසා මේ පිළිබඳ විමර්ශන කටයුතු සඳහා පෙරේදා(15) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෝසමක් ඉදිරිපත් කරමින් සැකකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දෙන ලෙස කළ ඉල්ලිම අනුව ගාල්ල මහේස්ත්‍රාත්වරයා සැකකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලෙස බූස්ස බන්ධනාගාර අධිකාරිවරයාට නියෝග කළේ ය. ඒ අනුව මේ වන විට සැකකරු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ සිටියි.

# මීළඟට මැතිවරණයට ටෙලෝ තනිවම

**උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ**

දෙමළ ජාතික සන්ධානය විසින් ටෙලෝ සංවිධානයට වූ පොරොන්දු ඉටු නොකිරීම නිසා මීළඟට එළඹෙන පළාත් සභා මැතිවරණයේදී උතුරු පළාතට ටෙලෝ සංවිධානය තනිවම තරග කිරීමට බලාපොරොත්තු වෙයි.

මේ පිළිබඳ ටෙලෝ සංවිධානයේ නායක සෙල්වම් අඩෙයිකලනාදන් මන්ත්‍රීවරයාගෙන් විමසූ විට ඔහු කියා සිටියේ ටෙලෝ පක්ෂය තුළින් එවැනි දැවැන්ත ඉල්ලීමක් ඇති බවත් ඒ සම්බන්ධයෙන් මේ දිනවල සාකච්ඡා කරමින් සිටින බවත්ය.

ටෙලෝ සංවිධානය පළාත් සභා මැතිවරණයේදී උතුරු පළාතට තනිවම තරග කිරීමට යම් හෙයකින් තීරණය කළත් ඉන් අදහස් වන්නේ ටෙලෝ සංවිධානය දෙමළ ජාතික සන්ධානයේ හවුල්කාරත්වයෙන් ඉවත්ව යන බවක් නොවන බවද අඩෙයිකලනාදන් මහතා පැවැසීය.

මෙවර මහමැතිවරණය පැවැති සමයේදී ටෙලෝ සංවිධානයට දෙමළ ජාතික සන්ධානයේ තනතුරු දෙකක් ලබා දෙන බවත් ඉන් පක්ෂයේ ප්‍රකාශක තනතුර සෙල්වම් අඩෙයිකලනාදන් මන්ත්‍රීවරයාට ලබා දෙන බවත් මේ දක්වා එම කාරණා ඉටු වී නොමැත.

මේ සම්බන්ධයෙන් දෙමළ ජාතික සන්ධානයේ නායක සම්බන්ධන් මන්ත්‍රීවරයා ද දැඩි උදාසීන තත්ත්වයක් පෙන්නුම් කරන නිසා දෙමළ ජාතික සන්ධානයත් ටෙලෝ සංවිධානයත් අතර කාලයක සිට දැඩි මත ගැටුමක් හටගෙන තිබේ.

එහි ප්‍රතිපලයක් වශයෙන් ටෙලෝ සංවිධානය උතුරු පළාත් සභාවට තනිවම තරග කිරීමට සාකච්ඡා කරමින් සිටින බවත් ඔවුන් එසේ කළත් ටෙලෝ පක්ෂයෙන් ඉවත් කළ ශ්‍රී කාන්තා හා එම්. කේ.ශිවාජිලිංගම් යන දෙදෙනා නොමැතිව ටෙලෝ සංවිධානයට තනිවම ගමනක් යා නොහැකි බව ටෙලෝ සංවිධානයේ හිටපු මහ ලේකම් එස්.ශ්‍රීකාන්තා මහතා ප්‍රකාශ කොට තිබේ.

# බදියුදීන්ට විශ්වාසභංගයක් ආවහම මුස්ලිම් මන්ත්‍රීවරු ඉවත් වුණේ ආණ්ඩුව රකින්නයි

## සමඟි ජනබලවේගයේ මන්ත්‍රී කබීර් හෂීම්

**සුභාෂිණී සේනානායක**

හිටපු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මහතාට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් ඉදිරිපත් වූ පසු මුස්ලිම් මන්ත්‍රීවරුන් ආණ්ඩුවෙන් ඉල්ලා අස්වූයේ ආණ්ඩුව ආරක්ෂා කිරීමට මිස රිෂාඩ් බදියුදීන් මහතා ආරක්ෂා කිරීමට නොවන බව හිටපු එක්සත් ජාතික පක්ෂයේ හිටපු සභාපති සහ මහලේකම් සමඟි ජනබලවේගයේ මන්ත්‍රී කබීර් හෂීම් මහතා ඊයේ 15 පාස්කු කොමිසම හමුවේ කියා සිටියේය.

පාස්කු ප්‍රහාරයෙන් පසුව රිෂාඩ් බදියුදීන් මහතාට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් ඉදිරිපත් වුණා. ඒක ආණ්ඩුවට විශාල බලපෑමක්. මම එක්සත් ජාතික පක්ෂයේ සභාපතිවරයා ලෙස සිංහල මන්ත්‍රීවරුන් මට කිව්වා ඡන්දය ප්‍රකාශ කිරීමට බැරි වේවි කියල. ඡන්ද ප්‍රකාශ කරලා ගමට යන්න බැරි වෙයි කියලා ඔවුන් කිව්වා. මම අගමැති රනිල් වික්‍රමසිංහ මහතාට කිව්වා මේක දාලා තියෙන්නේ අපි පරාජය කරන්න කියලා. රිෂාඩ් බදියුදීන් මහතාට ඇමැති ධුරයෙන් ඉවත් වෙන්න කිව්වම බෑ කිව්වා. ඒ අවස්ථාවේ රතන හාමුදුරුවෝ මාරාන්තික උපවාසයක් කළා. මම අගමැතිවරයා සමඟ කතා කර මම අයින් වෙන්නම් කියලා කිව්වා. මුස්ලිම් ඇමැතිවරුන්ට එරෙහිව මතයක් ගොඩ නැගී තිබුණා. හැමෝම තනතුරුවලින් ඉවත් වුණාම විශ්වාසය ගොඩ නැගෙයි කියලා හිතුවා. රට ගැන එක්සත් ජාතික පක්ෂය ගැන සිතා අපි ඉවත් වුණා යැයි කබීර් හෂීම් මහතා කොමිසම හමුවේ කියා සිටියේය.

එමෙන්ම අන්තවාදීන් සම්බන්ධයෙන් තමන් කැබිනට් මණ්ඩලයට දෙවතාවක් තදින් දැනුවත් කළ බව කියා සිටි ඒ මහතා ත්‍රස්ත සංවිධානයක් වන ෆෙටෝ සංවිධානය සමග කිසිදු සබඳතාවක් නැති බවත් කවුරුත් හෝ එලෙස යෝජනා කරනවා නම් එය සම්පූර්ණයෙන්ම අසත්‍යයක් බවද කියා සිටියේය.

සියලුම මුස්ලිම්වරුන් අන්තවාදීන් නොවන බව කියා සිටි ඒ මහතා තමන් ඉස්ලාම් ධර්මය පිළිපදින ශ්‍රී ලාංකිකයෙක් බවත් තමන්ට සිංහල බෞද්ධයන් සියයට 85ක් ඡන්දය ලබා දෙද්දී සියයට 5.5ක මුස්ලිම් ඡන්ද ලැබුණු බවත් කොමිසම හමුවේ කියා සිටියේය.

1 පිටුවෙන් .. 1 පිටුවෙන් .. 1 පිටුවෙන් .. 1 පිටුවෙන් ..

## මරාගෙන මැරෙන බෝම්බකරුවන් ...

2019 මාර්තු මස 27 වන දා පාණදුර සරික්කමුල්ල ප්‍රදේශයේ නිවසක මොහොමඩ් සහරාන් ඇතුළු පුද්ගලයන් හත් දෙනකුගේ සහභාගිත්වයෙන් පැවැති සාකච්ඡාවකදී එම යෝජනාව ඉදිරිපත් වී ඇති බව විමර්ශනයවලදී අනාවරණය වූ බව කියා සිටි ඒ මහතා ඒ අනුව පළමු ප්‍රහාරය එල්ල කර ඉන් බේරී පළා යාමට උත්සාහ කරන පුද්ගලයන් ඉලක්ක කර දෙවන ප්‍රහාරයත්, පසුව තුවාල ලැබූ පිරිස් රෝහල් ගත කිරීමේ දී තවත් ප්‍රහාරයකුත් එල්ල කිරීමට සැලසුම් කර තිබූ බවත් අනාවරණය වූ බවත් කියා සිටියේය.

පොලිස් ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයට අනුයුක්ත උප පොලිස් පරීක්ෂකවරයකු එම කොමිසම හමුවේ ලබා දුන් සාක්ෂිවලදී මේ බව අනාවරණය විය.

මීට අමතරව නුවරඑළිය ප්‍රදේශයේ විදේශිකයින් බහුලව ගැවසෙන ස්ථානයක් තෝරාගෙන එහිදී තවත් ප්‍රහාරයක් දියත් කිරීමට අවශ්‍ය පසුබිම පිළිබඳ සොයා බැලීමටද එම සාකච්ඡාවේ දී තීරණය වී තිබූ බවත් නවසීලන්තයේ දී මුස්ලිම් ජාතිකයන් ඉලක්ක කර එල්ල වූ ප්‍රහාරයට සහ සිරියාවේ දි අයි එස් සංවිධානයට එරෙහිව එල්ල කරන ප්‍රහාරවලට පලිගැනීමේ අරමුණින් මෙම මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එල්ල කළ යුතු බවට මොහොමඩ් සහරාන් එහිදී පිරිසට සඳහන් කර ඇති බවත් එම නිලධාරියා කොමිසම හමුවේ කියා සිටියේය.

කතෝලික දේවස්ථාන, කැසිනෝ ශාලා,විදේශිකයන් බහුලව වෙසෙන සංචාරක හෝටල් ආශ්‍රිතව එම ප්‍රහාරය එල්ල කළ යුතු බව එම සාකච්ඡාවේ දී යෝජනා වී ඇති බවත් මෙම සාකච්ඡාවේදී සහරාන් ඇතුළු පිරිස ඉදිරියේ දී මරාගෙන මැරීම සම්බන්ධයෙන් කිසියම් දිවුරුමක් ද ලබාදී ඇති බවත් පරීක්ෂණවලදී අනාවරණය වී ඇතැයි ද එම නිලධාරියා අනාවරණය කළේය.

අදාළ දිනයේ සිට (2019.මාර්තු 27සිට) දින පහළොවක් ඇතුළත එම ප්‍රහාරය එල්ල කළ යුතු බවට එහිදී යෝජනා වී තිබූ බව විමර්ශන අනාවරණය කළා. සහරාන්ගේ සහෝදරයා වන රිල්වාන් විසින් සකස් කරන බෝම්බ දින 15 ක් වැනි කාලයක් තුළ කල් ඉකුත් වීම, එලෙස දින පහළොවක් ඇතුළත ප්‍රහාරය එල්ල කිරීමට හේතුවී ඇති අතර එහිදී නිශ්චිතවම අප්‍රේල් විසි එක් වෙනිදාම ප්‍රහාරය එල්ල කළ යුතු බවට යෝජනා වී තිබී නැත. ප්‍රහාරය එල්ල කරන දිනය තීරණය කර දින තුනක් ඇතුළත ස්වයං ඝාතකයන්ට ඒ බව දැනුම් දීමට පියවර ගන්නා බව සහරාන් එහිදී සඳහන් කර තිබේ. අනාවරණය වූ තොරතුරු අනුව ඒ මොහොත වන විටත් පාස්කු මංගල්‍යය පැවැත්වෙන අප්‍රේල් 21 වන දින එම ප්‍රහාරය එල්ල කළ යුතුයැයි සහරාන් දින නියම කොට තිබේ. තම නිවස ආසන්නයේම කොච්චිකඩේ පල්ලිය පිහිටා ඇති බැවින් එහි බොම්බය පුපුරුවා ගැනීමේ වගකීම තමා භාරගන්නා බව එම සාකච්ඡාවට සම්බන්ධ වූ කොච්චිකඩේ පල්ලිය ආශ්‍රිතව බෝම්බය පුපුරුවා ගත් අලවුඩින් අහමද් මුවාත් නමැත්තා සඳහන් කර තිබේ. සහරාන් විසින් ඔත්තුකරුවන් සිව්දෙනකුගෙන් යුක්ත කණ්ඩායමක් පවත්වාගෙන ගොස් තිබෙනවා.

මේ අතර පොලිස් ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයට අනියුක්තව පොලිස් පරීක්ෂකවරයාගේ සාක්ෂි විභාගයේ ඉතිරි කොටස මාධ්‍ය ආවරණයකින් තොරව පැවැත්වීමට විනිසුරු මඩුල්ල නියම කරනු ලැබුවේය.

## කොරෝනා සෑදුණු ...

පසුගිය 13 දා පෙරවරුවේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පැවති මාධ්‍ය හමුවකට සහභාගිවී ඇති බවට සැක කෙරෙන බවත් ඒ සම්බන්ධව තවදුරටත් පරීක්ෂණ කටයුතු සිදුකෙරන බවත් සෞඛ්‍ය අංශ විසින් සනාථ කර ඇත.

මේ හේතුවෙන් එම මාධ්‍ය හමුවට එක්වූ සියලුම මාධ්‍යවේදීන්ගේ තොරතුරු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් මේ වනවිට සෞඛ්‍ය අංශ වෙත ලබාදී තිබෙන බව පවසන එම දෙපාර්තමේන්තුව ඒ අනුව අවශ්‍යතාවක් මතුවන්නේ නම් අදාළ සෞඛ්‍ය උපදෙස් හා මගපෙන්වීම සෞඛ්‍ය අංශ විසින් අදාළ මාධ්‍යවේදීන් වෙත කඩිනමින් ලබාදෙන බවද කියාසිටී.

කොරෝනා වෛරසය ආසාදනය වූ මාධ්‍යවේදියාගේ ඉදිරි සෞඛ්‍ය පරීක්ෂණයන්හි ප්‍රතිපල ලැබෙන තෙක් එම මාධ්‍ය හමුවට සහභාගිවූ සියලු මාධ්‍යවේදීන්ට බාහිර සමාජයට විවෘත නොවී ආරක්ෂිතව නිවෙස් වලට වී රැඳී සිටින ලෙස දැනුම් දී ඇත.

## 20 ගැන ...

විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා 20 වැනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත වේ.

සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ විවාදය පවත්වන ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා විශේෂ පක්ෂ නායක රැස්වීමක් කථානායකවරයාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තු සංකීර්ණයේදී ඊයේ (16) පැවැත්විණ. එම විශේෂ පක්ෂ නායක රැස්වීමේදී විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ විවාදය දින දෙකක විවාදයක් ලෙස පැවැත්වීමට තීරණය කර ඇත.

## රිෂාඩ්ගේ බිරියගෙන් ...

මේ අතර පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බදියුදීන් අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් කණ්ඩායම් හයක් යොදවා ඇතත් ඔහු සිටින ස්ථානයක් අනාවරණය කර ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මේ දක්වා සමත් වී නැත.

## සජිත්-රිෂාඩ් ...

බදියුදීන් මහතා අත්අඩංගුවට ගන්නා ලෙස නියෝග නිකුත් කිරීමෙන් පසුව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා ඔහු සමඟ පැවැත් වූ දුරකතන සංවාදයක් සම්බන්ධයෙන් මෙසේ කරුණු විමසීමට නියමිත බව වාර්තා වේ.

## දෙවැනි වසර සිසුන්ට ...

පෙරේදා(13) මෙම පියවල දෙවන වසර සිසුන් සඳහා පවත්වන ලද විභාගයට පෙනී නොසිටින ලෙස අනෙකුත් සිසුන්ට දැන්වීම සම්බන්ධයෙන් මෙසේ පන්ති තහනම් කර ඇත.

## අනුලා බුලත්සිංහල...

ඇය ඊයේ පෙරවරුවේ ශ්‍රී ජයවර්ධනපුර රෝහලේදී අභාවප්‍රාප්ත වී තිබේ. ප්‍රවීණ ගීපද රචක ලූෂන් බුලත්සිංහල මහතාගේ දයාබර බිරිය වූ අනුලා බුලත්සිංහල මහත්මිය කුවේණී, මහසාර, වේදිකා නාට්‍යවල, හවත්‍රා ටෙලිනාට්‍ය සහ අසන්ධිමිත්තා, නිල්දිය යහන වැනි සිනමාපටවලින් ඇය ප්‍රේක්ෂකයන්ගේ ජනාදරයට පත්වූවාය.

දයානන්ද ගුණවර්ධනයන්ගේ මධුරජවනිකා, දයාවයමන්ගේ නෙයිනගේ සුදුව ලූෂන් බුලත්සිංහලගේ තාරාවෝ ඉගිල්ලෙති වේදිකා නාට්‍යවල ඇය රඟපාමින් ගයනා කළ ගීත තවමත් රසිකරසිකාවියන්ගේ මතකයේ ඇත. විජේරත්න වරකාගොඩ සමඟ රඟහල දැන් ඇත අඩඅඳුරේ ගායනය මුලින්ම ඉදිරිපත් කළේද බුලත්සිංහල මහත්මියයි.

අනුලා බුලත්සිංහල මහත්මියගේ අවසන් කටයුතු අද(17) සවස 5.00ට බොරැල්ල සුසානභූමියේදි සිදුකිරීමට නියමිත අතර ඇයගේ මෘත දේහය අද පෙරවරු 10.00සිට ජයරත්න මල්ශාලාවේ තැන්පත් කරති බේ.

## මිනුවන්ගොඩ ...

නිරෝධායන මධ්‍යස්ථානයන්හි සිටින පුද්ගලයන් 58ක් ඔවුන්ගේ ආශ්‍රිතයන් 3ක් ලෙස මෙම 61 දෙනා වාර්තා වී තිබේ.

පසුගිය මාර්තු 11 වැනිදා සිට මේ දක්වා සමස්ත කොරෝනා ආසාදියන් 5305 ක් වාර්තා වී ඇති බවත් ඉන් 3385 ක් පූර්ණ සුවය ලබා රෝහල්වලින් පිටව ගොස් ඇති බවත් වසංගත රෝග විද්‍යා අංශය සඳහන් කරයි.

ආසාදිතයෝ 1907 ක් රෝහල්ගතව ප්‍රතිකාර ලබති.

මෙරට කොරෝනා ආසාදිතයන් හඳුනා ගැනීම සඳහා මේ වන විට පී.සී.ආර්. පරීක්ෂණ 350,000 කට වැඩි සංඛ්‍යාවක් සිදු කර ඇති බව සෞඛ්‍ය අංශ පවසයි.

# මදුරන්කුලිය ජනතාවගේ සිහින සැබෑ වෙයි සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාවට නැංවෙයි



මහින්ද අලුත්ගෙදර

මදුරන්කුලිය ජනතාවගේ සිහින සැබෑ කරමින් ඔවුන්ගේ ඉල්ලීම් ඉතා කෙටි කලකින් ඉටු කිරීමට ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතා පියවර ගෙන තිබේ.

මදුරන්කුලිය ආදර්ශ මහා විද්‍යාලයීය ක්‍රීඩාපිටිය, ජීවනගම - කජුවත්ත මාර්ගය සහ කොළඹ - පුත්තලම ප්‍රධාන මාර්ගයේ මදුරන්කුලිය - මහකුඹුක්කඩවල හරහා ආඬිගම දක්වා කොටසේ සංවර්ධන වැඩ අවසන් අදියරට පැමිණ තිබේ.



ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පසුගිය සැප්තැම්බර් 19 වැනිදා පුත්තලම දිස්ත්‍රික්කයේ කළ චාරිකාවේ දී ජනතාව කළ ඉල්ලීම් ඉටු කරනු වස් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවිණ.

ජනාධිපතිවරයා මදුරන්කුලිය ආදර්ශ මහා විද්‍යාලයට ගිය අවස්ථාවේ දී සිසුන් කළ ඉල්ලීම යුද හමුදා ඉංජිනේරු බළකාය වෙත යොමු කරන ලද අතර එතැන් සිට දින 18ක් වැනි කෙටි කාලයකදී ක්‍රීඩාපිටියේ ඉදිකිරීම්වලින් සියයට 90ක පමණ වැඩ අවසන් කර තිබේ.

වර්ෂා ජලයට යටවීමෙන් ක්‍රීඩාංගණය සේදී යමින් තිබුණු අතර පස් කියුබ් 2200ක් අතුරා එය ගොඩ කර, විධිමත් කානු පද්ධතියක් සහිතව සංවර්ධනය කර තිබේ. ක්‍රීඩාංගණයේ අනාරක්ෂිත ගොඩනැගිල්ල ඉවත් කරන ලෙස ද ජනාධිපතිවරයා උපදෙස් දුන් අතර දැනටමත් ගොඩනැගිල්ල කඩා ඉවත් කර තිබෙන බවද නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කර තිබෙන බවද ජනාධිපති මාධ්‍ය අංශය පවසයි.

ප්‍රදේශයේ ජනතාව ජනාධිපතිතුවරයාගෙන් කළ ඉල්ලීමකට අනුව ජීවනගම - කජුවත්ත දක්වා මාර්ගයේ කි.මී 4.6ක් වු කොටස කාපට් අතුරා සංවර්ධනය කෙරෙමින් පවතී. ඊට වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 100කි. මදුරන්කුලිය - තොඩුවාව සහ කල්පිටිය - පුත්තලම මාර්ග යා කෙරෙන මාර්ගය අබලන් වීම නිසා දීර්ඝ කාලයක් පුරා ප්‍රදේශයේ ජනතාව ගැටලු රැසකට මුහුණ දුන්හ. කල්පිටිය, තලවිල ශාන්ත ආනා දේවස්ථානය වෙත පැමිණෙන සංචාරකයන්ට ද කෙටි මාර්ගයක් ලෙස මේ මාර්ගය භාවිත කළ හැකිය.

කොළඹ - පුත්තලම ප්‍රධාන මාර්ගයේ මදුරන්කුලිය මහකුඹුක්කඩවල හරහා ආඬිගම දක්වා මාර්ගය අබලන්වී තිබීම ගැන ජනතාව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා දැනුවත් කළහ. ජනාධිපතිවරයාගේ උපදෙස් අනුව එහි ඉදිකිරීම් කඩිනමින් ආරම්භ කෙරුණු අතර කි.මී 9.7ක මාර්ග කොටස කාපට් අතුරා සංවර්ධනය කෙරෙමින් පවතී.

අධික වර්ෂා කාලයට මාර්ගයේ ඇතැම් ස්ථාන ජලයෙන් යට වන අතර එය මීටර් 05ක් පළලට සංවර්ධනය කෙරේ. වැය කෙරෙන මුදල රුපියල් මිලියන 250කි.



# 19 අහෝසි කර, 20 ගෙන ඒම ජනතා අවශ්‍යතාවක්

● මන්ත්‍රී රෝහණ දිසානායක

චන්දිමා කරුණාරත්න

19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිසා පසුගිය අවුරුදු පහේදී රටට සිදු වූ හානියෙන් රට නැවත ගොඩගැහීමට වත්මන් ආණ්ඩුවට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදු වී තිබෙන බවත් 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කර 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම ජනතාවගේ අවශ්‍යතාවක් බවත් පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ දිසානායක මහතා පැවැසී ය.

ඒ මහතා මේ බව පැවැසුවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු මාධ්‍ය මධ්‍යස්ථානයේදී ඊයේ (16) පැවැති මාධ්‍ය හමුවට සහභාගී වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රෝහණ දිසානායක මහතා මෙසේ ද පැවසීය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ගම්වල ජනතාව සමග සාකච්ඡා කිරීමට 'ගම සමග පිළිසඳරක' වැඩසටහන ක්‍රියාත්මක කළා. ඒ නිසා ගම්වල ජනතාව සමග සාකච්ඡා කරමින් ඔවුන්ගේ ගැටලු ගැන සාකච්ඡා කරන්න අවස්ථාව ලැබුණා. ජනාධිපතිතුමාගේ පැමිණීමෙන් පසුව දැන් මාතලේ සීඝ්‍රයෙන් සංවර්ධනය වෙනවා. ජල අවශ්‍යතාවන්ට, මහා මාර්ග, පාසල් පද්ධතියට විසඳුම් ලැබුණා. ප්‍රදේශයේ ගැටලු රැසකට විසඳුම් ලැබුණා. ජනාධිපතිවරයාගේ මෙම වැඩසටහන නිසා ගම සංවර්ධනය වීමේ ක්‍රියාවලිය ඉතා ඉක්මනින් සිදු වෙනවා. ඒවාගේම ජනාධිපතිවරයා ගමට පැමිණෙන විට ගමේ මන්ත්‍රීවරු, රාජ්‍ය නිලධාරීන් එම ස්ථානයේ සිටියා නම් එහි දී ගන්නා තීන්දු තීරණ පහසුවෙන් ලබාගැනීමට හැකිවනවා කියා මම හිතනවා.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් අතර සාකච්ඡාවක් පසුගියදා පැවැත්වුණා. එහිදී 20වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගේ මතය හෙළි කළා. එය අපි සියලු දෙනාටම හොඳ අවස්ථාවක්.

19වැනි ව්‍යවස්ථා සංශෝධනය මේ රට අකර්මණ්‍ය කළා. ඒ නිසා රටේ ආර්ථිකය කඩා වැටුණා. රටේ සාමූහිකත්වය නැති වුණා. ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අතර තිබූ සුහදත්වය ගිලිහී ගියා. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය නිසා පසුගිය අවුරුදු 5 පුරාවට මේ රටට නැති වූ දේවල් නැවත ලබා ගැනීමට අපේ ආණ්ඩුව විශාල පරිශ්‍රමයක් දරන්න සිදු වී තිබෙනවා.



2015 මහින්ද රාජපක්ෂ මහතා රට බාරදෙන විට මේ රටේ ආර්ථික සංවර්ධන වේගය සියයට 7.5යි. නමුත් ගෝඨාභය රාජපක්ෂ මහතා රට බාරගන්න විට දී එය සියයට 2.3යි. ඒ නිසා ජනතාවගේ අපේක්ෂාවන් මෙන්ම මේ රට ගොඩනැගීමේ වගකීම, ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම අපිට බාර දී තිබෙනවා. එය මේ ආණ්ඩුව සිදු කරනවා.

නව ව්‍යවස්ථාවක් ගෙන ඒමට යම් කාලයක් යනවා. එතෙක් මේ රට ගමන් කිරීමට අවශ්‍ය වන රටට උචිත සංශෝධනයන් 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය හරහා ගෙන එන්න බලාපොරොත්තු වෙනවා. රටක් ලෙස එය ඉතාම වැදගත් කටයුත්තක්.

20වන ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම නවත්වන්න කියා සමහරු කියනවා. නමුත් 19 හරහා මේ රටට කිසිදු හොඳක් සිදුවී නැහැ. ස්වාධීන කොමිෂන් සභාවලින් , මැතිවරණයක්වත් පවත්වන්න බැරි වුණා. අපේ සෑම මැතිවරණයකදීම 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය අවශ්‍ය බවත් ඒ සඳහා අපිට බලය දෙන්න කියාත් ප්‍රකාශ කළා. ඒ සඳහා ජනතාව අපිට බලය දී තිබෙනවා. ඒ නිසා 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කර, 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම ජනතාවගේ අවශ්‍යතාවයක්.

කෝවිඩ්-19ත්, 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් දෙකම අපේ රටට හානියක්. ඒ නිසා 20 වන ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධව එල්ලවන කුමන්ත්‍රණ පරාජය කර තුනෙන් දෙකක බලයෙන් සම්මත කරගත යුතුයි.

කොරෝනා වසංගත තත්ත්වය තිබියදී පවා අපේ රටේ ශිෂ්‍යත්ව විභාගය ඉතාම සාර්ථකව පැවැත්වූවා. මේ දිනවල උසස් පෙළ විභාගය පවත්වනවා. බී ලූනු වලට වෙළෙඳපොළට හොඳ මිලක් ඇවිත් තිබෙනවා. අත්‍යවශ්‍ය භාණ්ඩවල බදු අඩු කර තිබෙනවා. වී නිෂ්පාදනය වර්ධනය කරන්න වැඩපිළිවෙළ සකස් කර තිබෙනවා. පසුගිය ආණ්ඩුවෙන් 'ගම්පෙරළිය' වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කළ ද ගමට වැඩක් කෙරුනේ නැහැ. නමුත් අපේ ආණ්ඩුව හැම ගමකටම දැන් ලක්ෂ 20ක් වෙන් කරන්න කටයුතු කර තිබෙනවා.

සජිත්, රනිල් පිලට බලය තිබියදී මොළය තිබ්බෙ නැහැ. ඒ නිසා රටට යහපත් වැඩ කොටසක් කරන්න බැරි වුණා. එදා ජනාධිපතිවරණයේ දී පවා සජිත් පාර්ශවයට වැඩි ඉඩකොටසක් ලැබුණා. නමුත් ගෝඨාභය රාජපක්ෂ මහතා ජයග්‍රහණය කළා. ජනතාව බුද්ධිමත්ව කටයුතු කරනවා. ඒ නිසා මේ රටේ ජනතාවට ප්‍රායෝගිකව වැඩකරන්න පුළුවන් පරිසරයක් අවශ්‍යයි.

**ශ්‍රී ලංකා පොදුජන අධ්‍යාපන සේවා සංගමයේ සභාපතිනී වසන්තා හඳපාන්ගොඩ මහත්මිය -**

පසුගිය අවුරුදු පහ පුරා අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුරු, විදුහල්පති වැටුප් ප්‍රශ්නය විසඳා ගන්න බැරි වුණා. නමුත් වත්මන් ආණ්ඩුව බලයට පත්වීමත් සමග මේ ගැටලුව විසඳන බවට ප්‍රතිඥාවක් දුන්නා. ඒ වෙනුවෙන් අපි සංගමයක් විදිහට යෝජනාවලියක් සකස් කර තිබෙනවා. එම වාර්තාව මහාචාර්ය ජී.එල්. පීරිස් අධ්‍යාපන ඇමැතිවරයාට ලබා දුන්නා. එය ක්‍රියාත්මක කරන්න කියා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. ඒ අනුව ගුරුවරුන්ට විදුහල්පතිවරුන්ට තෘප්තිමත් වැටුපක් ලබා ගැනීමට අවස්ථාව හිමි වෙනවා.

මාසිකව ගරු, විදුහල්පති වැටුප් සඳහා රුපියල් බිලියන 4.51 පමණත් වාර්ෂිකව රුපියල් බිලියන 54කට ආසන්න ප්‍රමාණයක් වැය වෙනවා. රට සංවර්ධනය කිරීමේ දී රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය නංවාලීම අත්‍යවශ්‍ය කාරණාවක්.

# ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ පානීය ජල ගැටලුව විසඳන්න අගමැති මහින්ද අගමැති මෝදිගේ සහාය ඉල්ලයි

මහින්ද අලුත්ගෙදර

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ පානීය ජල අවශ්‍යතාවය සඳහා ලබා දිය හැකි සහාය සම්බන්ධයෙන් සොයා බලන ලෙස අගමැති මහින්ද රාජපක්ෂ මහතා ඉන්දියාවට දැනුම් දෙයි.

මෙරට වියළි කලාපයේ පානීය ජලය නොමැතිකම විශේෂයෙන් බරපතළ ගැටලුවක් බව පෙන්වා දෙන අගමැතිවරයා ඒ සඳහා ලබා දියහැකි සහාය පිළිබඳ සොයා බලන ලෙස ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස්වරයා වෙත දන්වයි.

ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා පෙරේදා (15) පස්වරුවේ අගමැති මහින්ද රාජපක්ෂ හමු වූ අතර අරලියගහ මන්දිරයේ එම හමුව පැවැත්විණි. දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක් සහ ඉදිරියේ දී සහයෝගීතාව ඇති කර ගත හැකි ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් මේ සාකච්ඡා පැවැත්විණි. මූලික වශයෙන් මෙම හමුව පසුගිය මාසයේ දී ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි සහ අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරුන් අතර අන්තර්ජාලය ඔස්සේ පැවැති සමුළුව පිළිබඳව පසුවිපරමක නිරතවීම අරමුණ වී තිබිණි.

අගමැති මහින්ද රාජපක්ෂ මහතා නැවත අගමැතිධුරයට පත්වීමෙන් පසු ද්විපාර්ශ්වික සාකච්ඡාවක් ලෙස අන්තර්ජාලය ඔස්සේ වීඩියෝ තාක්ෂණයෙන් පැවැති පළමු සමුළුව පිළිබඳව දෙරටේම නායකයන් අතිශය සතුටට පත්වූ බවද මෙම හමුවේදී හෙළි විය.

සෑමට සුරක්ෂිත පානීය ජලය සැපයීම මෙන්ම සනීපාරක්ෂාව පිළිබඳව අවධානය යොමු කළයුතු ප්‍රමුඛ ක්ෂේත්‍රයක් බව මෙම හමුවේ දී අගමැති මහින්ද රාජපක්ෂ මහතා පෙන්වා දුන්නේය.

පාසල්වල ජල අවශ්‍යතා, සනීපාරක්ෂක අවශ්‍යතා, වැසි ජලය එක්රැස් කිරීම, දුෂ්කර ජීවන තත්ත්වයන් පවතින ප්‍රදේශවල වැසිකිළි තනාදීම සහ අපද්‍රව්‍ය පොහොර බවට පරිවර්තනය කළහැකි ව්‍යාපෘති ඇතුළුව දෙරට අතර සහයෝගයෙන් ක්‍රියාත්මක කළ හැකි ක්ෂේත්‍ර කිහිපයක ව්‍යාපෘති පිළිබඳ ඉන්දීය මහකොමසාරිස්වරයා මෙහිදී අවධානය යොමු කළේය.

නිදන්ගත වකුගඩු රෝග පිළියම් යෙදීම ඇතුළුව රටේ ඇතැම් ප්‍රදේශවල පවතින සුරක්ෂිත පානීය ජලය නොමැතිකම පිළිබඳව ශ්‍රී ලංකා රජයේ ප්‍රධාන අවධානය යොමු වී තිබෙන බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා මෙහිදී පෙන්වා දුන්නේය.

සෑම නිවෙසකටම පානීය ජලය සැපයීම අරමුණු කරගත් ඉන්දීය රජයේ වැඩපිළිවෙළ වන අගමැති නරේන්ද්‍ර මෝදි මහතාගේ "ජාල් ජීවන් මෙහෙවර - Jal Jeevan Mission" (ජීවිතය උදෙසා ජලය - Water for Life Mission) වැඩසටහන සමග දෙරට අතර ද්විපාර්ශ්වීය සහයෝගයෙන් කටයුතු කිරීමේ හැකියාව ඇති බව මහ කොමසාරිස් බාග්ලේ මහතා මෙහිදී විශ්වාසය පළ කළේය. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ පානීය ජලය නොමැතිකම විශේෂයෙන් බරපතළ ගැටලුවක් බව පෙන්වා දුන් අගමැතිවරයා ඒ සඳහා ලබා දියහැකි සහාය පිළිබඳව සොයා බලන ලෙස මහ කොමසාරිස්වරයාට දැනුම් දුන්නේය. මෙරට ඖෂධ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් ඒ පිළිබඳ සොයා බලා ඖෂධ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පර්යේෂණ හා නිෂ්පාදන පහසුකම් ඇති කිරීමට ඉන්දීය අයෝජකයන් දිරිමත් කරන්නැයි ද ඒ මහතා මෙම හමුවේ දී ඉල්ලා සිටියේය.

# ශ්‍රී ලංකාවේ වැඩබලන චීන තානාපති ඇමැති අජිත් කබ්රාල් අතර හමුවක්



ශ්‍රී ලංකාවේ වැඩබලන චීන තානාපති හූ වෙයි සහ මුදල්, ප්‍රාග්ධන වෙළෙඳපොළ හා ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල් මහත්වරුන් අතර සාකච්ඡාවක් කොළඹදී පැවැති අයුරු. රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් ආර්.එම්.ඒ. රත්නායක, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන්, ශ්‍රී ලංකාවේ චීන තානාපති කාර්යාලයේ දේශපාලන අංශ ප්‍රධානී ලූවෝ චොං මහත්වරු ද මේ අවස්ථාවට එක්ව සිටියහ.

# ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් විදේශ ඇමැති දිනේෂ් හමු වෙයි



ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා ඊයේ (16) පෙරවරුවේ විදේශ අමාත්‍යාංශයේදී විදේශ ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා හමු විය. ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි හා ශ්‍රී ලංකාවේ අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරුන් අතර පසුගිය ද පැවැති දුරකතන සංවාදයේ දී මතු කරන ලද කරුණුවල ප්‍රගතිය පිළිබඳව මෙම හමුවේ දී විශේෂයෙන් සාකච්ඡා කෙරිණි.

# විලච්චිය ඔයාමඩුවේ ඇරැඹෙන ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා සඳහා ඉඩම් වෙන් වෙයි

නොච්චියාගම ගුණරත්න පෙරේරා

අනුරාධපුර විලච්චිය ඔයාමඩුව ප්‍රදේශයේ ආරම්භ කිරීමට යෝජිත ඖෂධ නිෂ්පාදනය කර්මාන්ත ශාලා කීපයක් සඳහා අවශ්‍ය ඉඩම් ලබාදීම ඊයේ (16) දින සිදු විය.

ඖෂධ සැපයුම් හා නියාමනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ඉදිකිරීමට යෝජිත ඖෂධ නිෂ්පාදන කර්මාන්තශාලා කීපයක් ආරම්භ කිරීම සඳහා රාජ්‍ය ඇමැති චන්න ජයසුමන මැතිතුමා එම ඉඩම් ලබා දෙන ලෙස ඉඩම් අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර තිබුණි.

ඒ අනුව අදාළ ඉඩම් පරීක්ෂා කර ලබාදීමට අවශ්‍ය පියවර ගැනිම සදහා ඉඩම් අමාත්‍ය එස්.එම්. චන්ද්‍රසේන මහතා හා රාජ්‍ය ඇමැති මහාචාර්ය චන්න ජයසුමන මහතා ඊයේ ඔයාමඩුව ප්‍රදේශයට ගොස් එම භූමිය පරීක්ෂා කළේය.

අනතුරුව එම ඉඩම් නීත්‍යනුකූලව ලබා දිම සදහා අවශ්‍ය කටයුතු සිදු කිරිමට අදාළ නිලධාරීන්ට උපදෙස් දෙමින් ඉඩම් ඇමැතිවරයා එම අවස්ථාවේදිම කටයුතු කරනු ලැබිය .

අදාළ ඉඩම් ලැබිමත් සමඟ මෙම කර්මාන්ත ශාලා ඉදිකිරීම කඩිනමින් ආරම්භ කිරිමට කටයුතු කරන බව රාජ්‍ය ඇමැති මහාචාර්ය චන්න ජයසුමන මහතා මෙහිදී පැවසීය

# නිරෝධායන රෙගුලාසි කඩන පිරිස් වරෙන්තු නැතුව අත්අඩංගුවට ගන්න අවසර තිබෙනවා

## පොලිස් මාධ්‍ය ප්‍රකාශක

**රක්ෂණ ශ්‍රියන්ත**

සෞඛ්‍ය ඇමැතිනිය විසින් ප්‍රකාශයට පත් කළ කොවිඩ් 19 වයිරසය පැතිරීම පාලනය සඳහා නව නිරෝධායන නීති ඇතුළත් විශේෂ ගැසට් පත්‍රය අනුව එම විධි විධාන සහ අනෙකුත් රීතීන් උල්ලංඝනය කරමින් කටයුතු කරන පුද්ගලයන් අධිකරණයෙන් ලබා ගත් වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීමට හැකියාව ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පවසයි.

සෞඛ්‍ය ඇමැතිනිය විසින් නිරෝධායන සහ රෝග වැලැක්වීමේ ආඥා පනතට අදාළව අති විශේෂ ගැසට් පත්‍රයක් නිකුත් කර ඇති අතර එම ගැසට් පත්‍රයේ අදාළ විධි විධාන, සෞඛ්‍ය සිරිත් සහ අනෙකුත් නීති උල්ලංඝනය කරමින් කටයුතු කරන්නේ නම් ඒ තැනැත්තාට එරෙහිව නිරෝධායන සහ රෝග වැලැක්වීමේ ආඥා පනත යටතේ මෙන්ම දණ්ඩ නීති සංග්‍රහය යටතේ වරදකරුවකු වන්නෙකුට මාස හයක සිර දඬුවමක් සහ රුපියල් දස දහසක දඩයකින් දඬුවම් කිරීමට අධිකරණයට හැකියාවක් ඇති බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පෙන්වා දෙයි.

මේ ගැසට් පත්‍රයට අනුව පොදු ස්ථානවලට පැමිණෙන අය සැම විටම මුහුණු ආවරණයක් පැළඳිය යුතු අතර දුරස්ථ භාවයද තබා ගත යුතු යැයිද, පොදු ස්ථාන යනුවෙන් සඳහන් වන්නේ සම්ප්‍රදායික දුම්රිය සහ බස් නැවතුම්පොළ පමණක් නොවන බවත්, යම් උත්සවයක් පැවැත්වෙන ස්ථානයක්, යම් කණ්ඩායමක් හැටියට රැස්ව සිටින ස්ථානයක්, මුදල් ගෙවා ඇතුළු වන ස්ථාන පොදු ස්ථානයක් ලෙසට සලකා බැලෙන බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පෙන්වා දෙයි.

මේ ගැසට් පත්‍රය මගින් ශ්‍රී ලංකාවම ආසාධිත බල ප්‍රදේශයක් ලෙසට ප්‍රකාශයට පත් කර ඇති බවත්, එවැනි අවස්ථාවකදී කර්මාන්ත ශාලා, වෙනත් සේවා සපයන ආයතන, රජයේ කාර්යාල, පුද්ගලික කාර්යාල පවත්වාගෙන යාමට යම් යම් කොන්දේසි යටතේ හැකියාව පවතින බවද ඒ මහතා ප්‍රකාශ කරයි.

යම් ප්‍රදේශයක කර්මාන්ත ශාලාවක් හෝ ආයතනයක් පවත්වාගෙන යන්නේ නම් සාමාන්‍ය දිනකදී සියයක් සේවය කරන්නේ නම් වර්තමානය වන විට සෞඛ්‍ය බලධාරීන් විසින් සේවය කළ යුතු ප්‍රමාණය එම ප්‍රමාණයමද ඊට වඩා අඩුවෙන්ද යන්න තිරණය කලයුතු වන බවද කියා සිටියේය. සෞඛ්‍ය බලධාරීන්ගේ තීරණයන්ට අනුව සේවකයන් වැඩිපුර සිටින්නේ නම් ඔවුන් දිනකට හෝ දින දෙකකට වරක් සේවයට යොදවා ගැනිමේ හැකියාව ඇති බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටී. එසේම සැමවිටම උෂ්ණත්වය පරික්ෂා කිරීමද, අත් පිරිසිදු කර ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීමද, සැම කෙනෙක්ම මුහුණු ආවරණයක් පැළඳීමද, දුරස්ථභාවය තබා ගැනීමද යන සිරිත් වලට කාර්යලය හෝ කර්මාන්ත ශාලාව ඇතුළ අනුගත විය යුතු බවද එම ස්ථානයට පැමිණෙන පුද්ගලයන් සහ පිටව යන පුද්ගලයන් පිළිබඳ ලේඛනයක් තාබා ගත යුතු බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශක වරයා පෙන්වා දෙයි.

එසේම වෙළෙඳ සල් සහ සුපිරි වෙළෙඳ සල් වලට මේ ආකාරයෙන් රෙගුලාසියක් පනවා ඇති බවද එහිදී විශේෂයෙන්ම අදාළ රීතීන්ට අනුව පුද්ගලයන් ප්‍රමාණයක් පමණක් තබා ගත යුතු බවත්, මීටරයක පරතරය පවත්වා ගැනිම අත් සේදීම, මුඛ ආවරණ පැලදීමද අනිවාර්ය බවද මුදල් ගෙවන කවුන්ටර ආසන්නයේ සහ ඇතුලු වීමේදී මීටරයක පරතරය සලකුණු කර තිබීම අත්‍යවශ්‍ය බවද කියා සිටී. එයට පරිභාහිරව යම් පාර්ශවයක් ක්‍රියා කරන්නේ නම් පාරිභෝගියා හෝ ව්‍යාපාරිකයා විසින් ඒ සම්බන්ධව පොලිසියට හෝ සෞඛ්‍ය අංශ වෙත පැමිණිලි කිරිම කළ යුතු බවද කියා සිටියේය.

සාකච්ඡා සහ සම්මන්ත්‍රණ සූදානම් කිරීමේදී සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් අනුව ක්‍රියාකර උපරිම සංඛ්‍යාවක් පමණක් තබා ගත යුතු අතර ඊට එහා වැඩි සංඛ්‍යාවක් සහභාගී කරගැනිම වරදක් බවට පත් වෙන අතර ගැසට් නිවේදනයට අනුව පොදු ප්‍රවාහන වලදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ උපදෙස් වලට අනුව පොදු ප්‍රවාහන සේවාවල අය කටයුතු කළ යුතු බවද කියා සිටියේය.

ඊට අමතරව නිරෝධායන මධ්‍යස්ථාන, නිරෝධායන ඇඳිරි නීතිය සහ නිවාස තුළ සිදු කරන නිරෝධායන ඇඳිරි නීතිය සම්බන්ධයෙන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් වන බවත් ඊට පරිභාහිරව කටයුතු කරන අයවලුන්ට එරෙහිවත් නිරෝධායන සහ රෝග වැලැක්වීමේ ආඥා පනත සහ අපරාධ නීතිය අනුව නඩු පැවරීම සිදු කිරීමට හැකියාව ඇති බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශක වරයා කියා සිටියි.

මේ ගැසට් පත්‍රය අනුව කිසි විටකත් පොලිසිය ජනතාව තලා පෙලීමට කටයුතු නොකරන අතර, මේ කරුණු පළිහක් ලෙස යොදා ගනිමින් මේ රටේ ජනතාව කොවිඩ් වසංගතයෙන් මුදවා ගැනීමට සක්‍රියව දායකත්වය ලබාදෙමින් කටයුතු කරන බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා වැඩිදුරටත් සඳහන් කරයි.

# නව කම්කරු කොමසාරිස් ජෙනරාල් ලබන සතියේ වැඩ අරඹයි

**අනුර ප්‍රේමලාල්**



නව කම්කරු කොමසාරිස් ජෙනරාල් ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා ලබන 19 දින සිය ධුරයේ රාජකාරි ආරම්භ කිරීමට නියමිතය.

බදුල්ල ස්ප්‍රින්වැලි විද්‍යාලය, බදුල්ල මධ්‍ය මහා විද්‍යාලය සහ කොළඹ ආනන්ද විද්‍යාලයේ ආදි සිසුවකු වන ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහ කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරියෙකි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් නීති උපාධිය ලබා, ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් නීතිඥ විභාගය සමත්වී ඇත. ඔහු රුසියාවේ ඉන්ටර්නැෂනල් ෆවුන්ටමෙන්ටල් යුනිවර්සිටි වෙතින් වෙරළ සංරක්ෂණ පිළිබඳ ආචාර්ය උපාධිය සමත්විය. 2000දී මෙරට රාජ්‍ය පරිපාලන සේවයට ඇතුළත්ව ඌව පළාත් සභාව, බියගම සහකාර ප්‍රාදේශීය ලේකම්, පාර්ලිමේන්තුවේ සභා නායක කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ලෙස කටයුතු කර ඇත. එතුමා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කැපි පෙනෙන වැඩ කොටසක් කළ අයෙකි. ඒ මහතා මෙම පත්වීම භාරගන්නේ කම්කරු දෙපාර්තමේන්තුවේ 23 වන කම්කරු කොමසාරිස් ජනරාල් ලෙසයි. ඒ මහතා සිය අභිනව තනතුරේ රාජකාරි භාරගන්නා අවස්ථාවට කම්කරු අමාත්‍ය නිමල් සිරිපාලද සිල්වා මහතාද අමාත්‍යාංශයේ ලේකම් මාපා පතිරණ මහතාද සහභාගි වනු ඇත.

# වසර පුරාම ප්‍රමිතියට මාළු ලබා දෙන්න රජය මිලියන 200ක් වෙන් කරයි

**බුද්ධිකා ඉඹුලාන**

ජනතාවට ප්‍රමිතියෙන් යුත් මසුන් තොග වර්ෂය පුරාම සාධාරණ මිලට ලබා දීම සඳහා ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතාගේ ඉල්ලීම පරිදි රජය විසින් රුපියල් මිලියන 200 ක් වෙන් කර ඇත.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත් වු ජීවන වියදම පාලනය කිරීම පිළිබඳ ජනාධිපති කාර්ය සාධක රැස්වීමේදි ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා මහතා විසින් මෙම ඉල්ලීම ඉදිරිපත් කර තිබිණි.

මත්ස්‍ය අස්වැන්න වැඩි වශයෙන් ලැබෙන කාලවල එම මසුන් තොග සාධාරණ මිළට ලබා ගෙන ගබඩා කිරීමෙන් එම ආහාර ජනතාවට සාධාරණ මිළට ලබා දිය හැකි බව ඇමැති ඩග්ලස් දේවානන්දා විසින් මෙම රැස්මේදී කරුණු පෙන්වා දී ඇත.

ඇමැතිවරයාගේ මෙම යෝජනාව පිළිබඳව අවධානය යොමු කළ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා, ධීවර සංස්ථාවට රුපියල් මිලියන 200ක් වෙන් කිරිමට පියවර ගෙන තිබේ.

උතුරු පළාතේ ඔක්තෝබර් සිට පෙබරවාරි කාලය තුළත්, දකුණේ අප්‍රේල් සිට සැප්තැම්බර් මාස දක්වාත් කාලගුණය විපර්යාස හේතුකොටගෙන මත්ස්‍ය අස්වැන්න අඩුවෙන් ලැබේ. මත්ස්‍ය අස්වැන්න වැඩි කාල වලදි එම අස්වැන්න මිලදී ගෙන ශීත ගබඩාවල තබා මත්ස්‍ය අස්වැන්න අඩුවන කාලවලදි ඒවා අඩු මිළට ජනතාවට ලබා දෙන ක්‍රමවේදයක් සකසන ලෙස මෙහිදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඇමැති ඩග්ලස් දේවානන්දා මහතාට උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව වෙන් කළ මිලියන 200 ධීවර සංස්ථාවට ලබා දී මෙසේ මත්ස්‍ය අස්වැන්න වැඩි සැප්තැම්බර් වකවානුවේදි මසුන් තොග මිළදි ගෙන දෙසැම්බර් මස එන උත්සව සමයේදි ජනතාවට පහසු මිලට ලබා දෙන බව ධීවර ඇමැතිවරයා කියයි.

# ශ්‍රී ලංකාව හා පාකිස්තානය අතර හවුල් ව්‍යාපාර ඇරැඹීමේ අවස්ථාව තිබෙනවා

## පාකිස්තාන මහ කොමසාරිස්

**රක්ෂණ ශ්‍රියන්ත**

දෙරටටම වාසිදායක වන සේ පේෂකර්ම - සිමෙන්ති - සීනි - ඖෂධ වැනි කර්මාන්ත ආශ්‍රිතව ශ්‍රී ලංකා - පාකිස්තාන හවුල් සමාගම් ඇරඹීමේ හැකියාව පවතින බවත් ඒ සඳහා පාකිස්තාන ආයෝජකයන් කැමැත්තෙන් සිටින බවත් පාකිස්තාන මහ කොමසාරිස් විශ්‍රාමික මේජර් ජනරාල් මුහම්මඩ් සාද් කතක් මහතා පැවැසීය.

ඒ සඳහා ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමේ දී ආයතනික සහ නීතිමය බාධාවන් පවතින බවත් එවැනි බාධාවන් ඉවත් කර දීමේ හැකියාවක් වත්මන් කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මහතාට තිබෙන බව තම විශ්වාසය බවත් ඒ මහතා වැඩිදුරටත් පවසා සිටියේය.

ඊයේ (15) 73/1, ගාලු පාර, කොළඹ 03 යන ස්ථානයේ පිහිටි කර්මාන්ත අමාත්‍යාංශයේ දී පාකිස්තාන මහ කොමසාරිස්වරයා කර්මාන්ත අමාත්‍යවරයා හමු වූ අවස්ථාවේ දී මෙම අදහස් පළ විය.

එහි දී අමාත්‍ය විමල් වීරවංශ මහතා පවසා සිටියේ එවැනි බාධාවන් පැවතීම පිළිබඳව තමන් කනගාටු වන බවය. ඒවා ජය ගනිමින් ඒවාට පිළියම් යෙදිය හැකි බැවින් අදාළ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගෙන් ද සමන්විත ශ්‍රී ලංකා - පාකිස්තාන් ද්විපාර්ශ්වික කමිටුවක් පිහිටුවීමට ඉදිරියේ දී අමාත්‍ය මණ්ඩලය සමඟ සාකච්ඡා කරන බවය.

දෙරට අතර වාර්ෂිකව ඩොලර් බිලියන 01ක ආනයන - අපනයන වෙළෙඳාමක් සිදු කළ හැකිව තිබිය දී සාමාන්‍යයෙන් වාර්ෂිකව සිදු කෙරෙන්නේ ඩොලර් මිලියන 450 - 500 අතර වෙළඳාමක් බවත් එය දෙරටටම වාසිදායක වන සේ ඉහත අගය දක්වා වැඩි කර ගත හැකි බවත් ද මෙහි දී ශ්‍රී ලංකාවේ පාකිස්තාන මහ කොමසාරිස්වරයා පෙන්වා දුන්නේය.

වත්මන් රජය සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව යමින් ශ්‍රී ලංකාවේ කර්මාන්ත ගොඩගැනීම සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීමේ දී කලාපීය හා අන්තර්ජාතික සැපයුම් ජාලය හා සම්බන්ධ වෙමින් එය කළ යුතු බවත් එහි දී පාකිස්තානය වැනි මිත්‍රයකුගේ සහයෝගය ඉතා වැදගත් බවත් මෙහි දී අමාත්‍යවරයා අවධාරණය කළේය.

පාකිස්තානය, ශ්‍රී ලංකාවේ සැම දුෂ්කර අවස්ථාවකදීම සිටි මිත්‍රයකු බවත් ඒ මිත්‍රත්වය වර්තමානයේ මෙන්ම අනාගතයේ දී ද ඉතාමත් ශක්තිමත්ව පවත්වාගෙන යා යුතු බවත් අමාත්‍යවරයා මෙහි දී සඳහන් කළේය.

මෙම අවස්ථාවට පාකිස්තාන මහ කොමසාරිස් කාර්යාලයේ දෙවන ලේකම් (දේශපාලන) අයේෂා අබු බකර් ෆහඩ්, වෙළඳ හා ආයෝජන අංශයේ ප්‍රධානී, අස්මා කාමල් යන මහත්මීහු සහ අමාත්‍ය උපදේශක සුනිල් හෙට්ටිආරච්චි, අමාත්‍ය සම්බන්ධීකරණ ලේකම්, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සභාපති අනුෂ්ක ගුණසිංහ යන මහත්වරු ද එක්ව සිටියහ.



# පොලොන්නරුව රෝහලේ ප්‍රතිකාර ගනිමින් සිටි කාන්තාවකට කොරෝනා

**පොලොන්නරුව දිස්ත්‍රික් සමූහ - එම්. පී සරත්**

පොලොන්නරුව මහ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටි කාන්තාවක කොරෝනා වයිරසය ආසාදනය වී ඇතැයි සෞඛ්‍ය අංශ ඊයේ (16) අනාවරණය කළේය.

අරලගංවිල, කාශ්‍යපපුර ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 47 හැවිරිදි දෙදරු මවක් වන මෙම කාන්තාව වෙනත් අසනීපයක් සඳහා රෝහල්ගතව නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටියදී සිදුකළ පී.සී.ආර් පරීක්ෂණයකින් පසුව මේ බව තහවුරු වූ බව පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ඩබ්ලිව්. ඒ. කුමාරවංශ මහතා පැවැසීය. පසුගියදා ගම්පහ මිනුවන්ගොඩ ප්‍රදේශයේ ආයුර්වේද වෛද්‍යවරයෙකුගෙන් ප්‍රතිකාර ලබාගෙන ඇති අතර එම ස්ථානයට පැමිණි බස් රථයේදී හෝ ආපන ශාලාවේදී මෙම වෛරසය ශරීර ගත වී ඇති බවට සැක කරන බව කුමාරවංශ මහතා කීවේය.

මෙම කාන්තාව ප්‍රතිකාර ලැබූ 22 වාට්ටුව විෂබීජහරණය කර එහි සිටි අනෙක් රෝගීන් පී.සී.ආර් පරික්ෂණයට යොමුකළ බව කුමාරවංශ මහතා ප්‍රකාශ කළේය. එම කාන්තාව ආගිය තැන් සහ ඇසුරු කළ පුද්ගලයන් සම්බන්ධයෙන් සොයා බලා විමර්ශන සිදු කිරීම සෞඛ්‍ය කණ්ඩායම් දෙකක් යොදවා මේ වන විට සිදු කෙරෙන බව පොළොන්නරුව ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක,වෛද්‍ය ඩබ්ලිව්.කේ.ඩබ්ලිව්.එස්.කුමාරවංශ මහතා ප්‍රකාශ කළේය.

# සෑම ආසනයකම දෙසැම්බර් වන විට පාලම් ව්‍යාපෘතිය බැගින් අරඹනවා

**නිමල් රාජපක්ෂ**

කොවිඩ් 19 වසංගත තත්ත්වයෙන් ශ්‍රී ලාංකික ජනතාව ආරක්ෂා කොටගෙන රටේ සංවර්ධන කටයුතු ඉදිරියට ගෙන යැම රජයේ අරමුණයි. ඒ අනුව දෙසැම්බර් මස පළමු වැනිදා වන විට ලංකාවේ සැම ආසනයකම පාලම් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලැසුම් කර ඇතැයි ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය නිමල් ලාන්සා මහතා පවසයි..

රාජ්‍ය ඇමතිවරයා මෙසේ අදහස් පළේ පෙරේදා (15) දින කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම ආසනයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කළ අවස්ථාවේදීය.

මෙහිදී අදහස් දැක්වූ නිමල් ලාන්සා ඇමැතිවරයා, යහ පාලන රජය විසින් ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ ආරම්භ කළ මාර්ග කිලෝ මීටර් 790 ක් අතරමග නතර වෙලා තිබුණා. එයින් වැඩිම ප්‍රමාණයක් තියෙන්නෙ කළුතර දිස්ත්‍රික්කයේ. නීතිපති දෙපාර්තුමේන්තුවෙන් උපදෙස් දීලා තියෙනවා එම මාර්ග සඳහා යළි ටෙන්ඩර් කැඳවලා ඉදිකිරීම් ආරම්භ කරන්න කියලා. ඒ අනුව ඉදිරි මාස දෙක ඇතුළත එම මාර්ග වල ඉදිකිරීම් ආරම්භ කරනවා.ලංකාව පුරා පවතින ඒ දඬු, වැල් පාලම් හා කුඩා පාලම් වෙනුවට නව ග්‍රාමීය පාලම් ඉදිකිරීම සඳහා යෝජනා 9,000 ක් පමණ මේ වන විට අමාත්‍යාංශය වෙත ලැබී තියෙනවා. ඒවා ප්‍රමුඛතා ගත කොට ඉදිරි අවුරුදු හතරක කාලය තුළ ඉදිකිරීම රජයේ අරමුණයි. ඒ අනුව සැම ආසනයකම ලබන දෙසම්බර් මාසය වනවිට පාලම් ව්‍යාපෘති ආරම්භ කිරීමට නියමිතයි.

කිලෝ මීටර් ලක්ෂයක් සංවර්ධනය කිරීමේ ඉලක්කය සාර්ථක කර ගැනීමට ලබන වසරේ කිලෝ මීටර් 30,000ක් ඉදිකිරීමට කටයුතු කරන ලෙස ජනාධිපතිතුමා උපදෙස් ලබා දී තිබෙනවා.

ආසියනු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන් ව්‍යාපෘතිය යටතේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 5 ක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 162ක මුදලක් වෙන් කර තිබේනවා .මේ යටතේ කෙලෙස්ගමුව, වෙනිවැල්පිටිය හා ලෙනවර තිබ්බටුගොඩ යන මාර්ග කාපට් අතුරා සංවර්ධනය කරනු ලැබූ බවද නිමල් ලන්සා රාජ්‍ය ඇමතිවරයා පැවසුවේය.

මෙම අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රී ලලිත් එල්ලාවල මහතා, රෝඩ් ව්‍යාපෘති අධ්‍යක්ෂක ජෙනිෆා වීරකෝන් මහත්මිය ඇතුළු පිරිසක් සහභාගි වී සිටියහ.

# නැඟෙනහිර ඉඩම් ගෙන බදු ගෙවීම පැහැර හරින සමාගම්වලට නඩු පවරන්න

## ආණ්ඩුකාර අනුරාධා යහම්පත්

**මහින්ද අලුත්ගෙදර**

දීර්ඝ කාලීන බදු පදනම මත ලබාගෙන ඇති නැගෙනහිර පළාතේ ඉඩම්වල බදු ගෙවීම පැහැර හරින සමාගම්වලට එරෙහිව නඩු පැවැරීමට පියවර ගන්නා බව නැගෙනහිර පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත් මහත්මිය පවසයි.

මෙලෙස බදු පැහැර හැරීම හේතුවෙන් රජයට විශාල මුදලක් අහිමි වි ගොස් ඇති බවද ඒ මහත්මිය පෙන්වාදෙයි.

විවිධ ක්‍රම යටතේ වාර්තා ඉදිරිපත් කරමින් පළාතේ ඉඩම් ලබාගෙන ඇති සමාගම් ඒවායේ කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු නොකර රජයේ බදු ගෙවිම් ද පැහැර හරිමින් සිටින බව පෙරේදා (15) පැවැති ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්විමේ දී ඇය හෙළි කළාය.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ද නැගෙනහිර පළාතේ ඉඩම් අක්කර 200ක් පමණ මෙසේ දීර්ඝ කාලීන බදු පදනම යටතේ ලබාගෙන රජයට අයවිය යුතු රුපියල් මිලියන 230ක බදු මුදලක් ගෙවීම පැහැර හරිමින් සිටින බවද මෙහිදි අනාවරණය විය.

"හැමදාම මේවා කරන්න දෙන්න බෑ. අපේ පළාතටයි මේ ආදායම අහිමි වෙන්නේ මේ පළාතේ සංවර්ධනයට යොදවන්න තියෙන මුදල් ටිකයි මේ අහිමි වෙනනේ. අපි හිඟ මුදල් ඉල්ලමු. එහෙම නැත්නම් ඒවා ගෙවන්නේ නැති ආයතනවලට නඩු දාමු. පළාතට වගකිව යුතු මිනිසුන් හැටියට අපිටත් වගකිමක් තියෙනවා මේ ගැන හොයලා බලන්න. පළාතේ වටිනා ඉඩම් ටික මෙහෙම දෙන්නේ ආයෝජනයක් වෙන්න ඕන නිසයි. ඒක සිද්ධ වෙන්නේ නැත්නම් අපි මේ ආයතන වලට විරුද්ධව නඩු දාමු යැයි"ද මෙහිදි ආණ්ඩුකාරවරිය කිවාය.

මේ අතර මහවැලි අධිකාරිය විසින් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ වැලි කැණිම් සඳහා ලබා දි ඇති බලපත්‍ර නිසා මහවැලි ගඟට විශාල හානියක් සිදුවෙමින් පවතින බවද ආණ්ඩුකාරවරිය මෙහිදි පෙන්වා දුන්නාය. මින් ඉදිරියට මහවැලි ගඟේ වැළි කැණිම් සඳහා කිසිදු බලපත්‍රයක් නිකුත් නොකරන ලෙසත් දැනට ලබාදි ඇති සියලු බලපත්‍ර පිළිබඳ වාර්තාවක් ඉදිරි සම්බන්ධීකරණ කමිටුවට ලබාදෙන ලෙසත් ආණ්ඩුකාරවරිය මහවැලි නිලධාරින්ට නියෝග කළාය.

මේ අවස්ථාවට මහා සංඝරත්නය, පාර්ලිමේන්තු මන්ත්‍රී කපිල නුවන් අතුකෝරල, පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. තවුෆික්, ප්‍රධාන ලේකම් තුසිත පි. වනිගසිංහ, දිස්ත්‍රික් ලේකම් අසංක අබේවර්ධන, ආණ්ඩුකාර ලේකම් එල්.පී. මදනායක මහත්වරුන් සහ ආරක්ෂක, අධ්‍යාපන, විදුලිබල, සෞඛ්‍ය, වාරිමාර්ග, කෘෂිකර්ම ඇතුළු බොහෝ ක්ෂේත්‍ර නියෝජනය කරමින් නිලධාරීහු පිරිසක් ද එක්ව සිටියහ.

# චීනයෙන් ආනයනය කළ ටින් මාළු බහාලුම් 25ක් ප්‍රමිතියෙන් තොරයි

## වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම් භද්‍රානි ජයවර්ධන

**මානෙල් පුෂ්ප කුමාරි**

මේ වසරේ දී චීනයෙන් ආනයනය කරන ලද ටින් මාළු බහාලුම් 25 ක් ප්‍රමිතියෙන් තොර ඒවා බවට තහවුරු වීමෙන් පසු එම ටින් මාළු බහාලුම් 25 ප්‍රතිඅපනයනය කිරීමට කටයුතු කළ බව වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම් භද්‍රානි ජයවර්ධන මහත්මිය ප්‍රකාශ කළාය.

(15) දා වොක්ෂෝල් වීදියේ පිහිටි වෙළෙඳ අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ පැවැති මාධ්‍ය හමුවකට සහභාගි වූ එම අමාත්‍යාංශයේ ලේකම්වරිය මේ අදහස් පළ කළාය.

ටින් මාළු කන්ටේනර් දහසක් ආනයනයකරු විසින් ආනයනය කර ඇති අතර එම ටින් මාළු ප්‍රමිතියෙන් තොර ඒවා බවට තහවුරු වීමෙන් අනතුරුව ආනයනයකරුට එය දැනුම් දී ඇත. ආනයනයකරු විසින් ඉදිරිපත් කළ අභියාචනයක් සලකා ටින් මාළු තොගයේ සාම්පල් වැඩි ප්‍රමාණයක් දෙවනවර පරීක්ෂාවට ලක්කර ප්‍රමිතියෙන් තොර ටින් මාළු තොගය ප්‍රතිඅපනයනය කරීමට කටයුතු කර ඇත. දෙවනවර පරීක්ෂාවේ දී ටින් මාළුවල ප්‍රමිතියේ ගැටළුවක් නොතිබූ බැවින් ඉතිරි තොගය වෙළෙඳ පොළට නිකුත් කිරීමට අවසර හිමි වී තිබේ. රේගු මාධ්‍ය ප්‍රකාශක අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සහතිකය මත ටින් මාළු කන්ටේනරය මුදා හැර ඇත.

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විස්සයි දහනවයයි දෙකම හොඳ නෑ

## මහාචාර්ය නවරත්න බණ්ඩාර

**අනුර ප්‍රේමලාල්**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විස්සද දහනවයද හොඳ කියාලා බැලුවොත් ඒ දෙකම ගැන ගැටලු තිබෙන බව මහාචාර්ය නවරත්න බණ්ඩාර මහතා ප්‍රකාශ කරයි.

ඒ මහතා මේ බව සඳහන් කළේ ඉකුත් (09) සමාජ හා සාමයික කේන්ද්‍රයේ පැවැති 20ට එරෙහි වෘත්තීය සමිති ව්‍යාපාරය සංවිධානය කර තිබූ සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය පවත්වමින්ය. මෙහිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කුමකටද,ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කා වෙනුවෙන්ද , 20වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ කියැවීමට අත්වැලක් යන ග්‍රන්ථයක්ද එළි දැක්විණි.

එහිදි තවදුරටත් අදහස් දැක්වූ මහාචාර්ය වරයා මෙසේද කීය: මුලින්ම ඇතිවෙන්නේ සිවිල් අයිතිවාසිකම් දෙවනුව තමයි දේශපාලන අයිතිවාසිකම් ඇතිවෙන්නේ. ව්‍යවස්ථාවක් කියන්නේ පාලනයේ ව්‍යාකරණයයි. එය ජනතාව හා පාලකයන් අතර ඇතිවන එකඟතාවක්. පාලකයන් ව්‍යවස්ථාවට යටත්විය යුතුයි. එමෙන්ම ජනතා පරමාධිපත්‍ය ජනතාවට තිබෙන්නේ කියලා ජනතාවට නීති කඩකරන්නත් බැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක පරමාර්ථ වෙන්නේ පුද්ගල නිදහස, අයිතිවාසිකම් ශක්තිමත් කරමින් පාලකයන් බලයට සීමාවන් දමමින් පාලකයෝත් පාලිතයෝත් දෙගොල්ලන්ම නීතියට යටත් කිරීමයි. එතකොට කවුද පාලනය කරන්නේ නීතියයි.1978 සිට අපේ ව්‍යවස්ථාව දහනව වතාවක් සංශෝධනය කරලා තියෙනවා. අලුත් එක පැමිණියාම එය විසි වතාවක් වෙනවා. අපිට ව්‍යවස්ථාවක් අවශ්‍ය වෙන්නේ ශිෂ්ට සම්මත ආකාරයක සමාජ ජීවිතයක් සඳහා.වෙන මොනවා නැතත්.විධායක ජනාධිපති නීතියට උඩිනුයි සිටින්නේ. 2015දී අපි සිතුවා මේ සැරේනම් වැඩේ හරි කියලා මන්ද ගෙදර යන ජනාධිපති කෙනෙක් සිටින නිසා නමුත් ඒක සිදුවුණේ නැහැ. රාජ්‍ය අංශයේ විගණනය තිබිය යුතුයි. පුද්ගලික අංශයේ නම් ඒ අය විගණනය කර ගන්නවා. ප්‍රසම්පාදනය ගැනත් අවධානය තිබිය යුතුයි.

අනෙක් කොමිෂන් සභා මේවා ස්වාධීන කොමිෂන් සභා නොවේ ඒවා මහජන කොමිෂන් සභා ලෙසයි හැඳින්විය යුත්තේ. මේවා තිබිය යුත්තේ ජනතාවගේ අයිතිවාසිකම්,පරිපාලනය,අධිකරණ බලය මේවා ජනතාවගේ ආරක්ෂාවට තමයි තිබෙන්නේ. ජනතාවගේ බලය රැකගන්න අල්ලස,දූෂණය නවතා ගැනීමට තමයි මේවා තියෙන්නේ. පාර්ලිමේන්තුවේ බලය තිබිය යුතුයි. එය නැතිවි යනවිට වෘත්තීය සමිති ඇතුළු සිවිල් බලය නැතිවි යනවා. අද ඉඩම්වලට ලෝකයේ විශාල ඉල්ලුමක් ඇතිවී ගෙන එනවා. කෙසෙල්, ස්වභාවික පොහොර භාවිතයෙන් එළවළු වගා කරන්න. ඒ නිසා අපේ වෘත්තීය සමිති ව්‍යාපාරය ගැඹුරින් මේවා දෙස බලන්න නිකම් ලිබරල් වාදි ලෙස බලන්න එපා. විස්ස හොඳයි දහනවය හොඳයි කිය කියා ඉන්න එපා. දහනවය හොඳටම හොඳත් නැහැ. දෙකම ගැන හොඳ කියන්න බැහැ. මෙහිදි දේශනය තවදුරටත් පැවැත්විණි.

තවද වෘත්තීය සමිති නියෝජිතයින් වන සිල්වෙස්ටර් ජයකොඩි, ජෝශප් සිල්වෙස්ටර්, රවි කුමුදේශ් ඇතුළු කිහිප දෙනකුමට අදහස් දැක්වූහ.



# පුනරීන්, මන්නාරම, මොනරාගල සුළං - සූර්ය බලාගාර කඩිනම් කරන්න

## රාජ්‍ය ඇමැති දුමින්ද දිසානායක

**චන්දිමා කරුණාරත්න**

පුනරීන්, මන්නාරම සහ මොනරාගල ඉදිකිරීමට නියමිත සුළං හා සූර්යබල උද්‍යානයන්හි වැඩකටයුතු කඩිනම් කරන්නැයි සූර්යබල ,සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය ඇමැති දුමින්ද දිසානායක මහතා උපදෙස් දෙයි.

අදාළ ප්‍රදේශවල රාජ්‍ය ආයතනවල පියසි සූර්ය බලාගාර බවට පත් කිරීමටත්, සූර්ය හා සුළං බල උද්‍යාන ස්ථාපිත කිරීමට සුදුසු ඉඩම් සොයාගැනීම හා ඒවා අත්පත් කර ගැනීම, අදාළ බලාගාර ස්ථාපිත කිරීමේ ශක්‍යතා අධ්‍යයනයන් සිදුකිරීම සම්බන්ධව කඩිනමින් පියවර ගත යුතු බවත් අනාවරණය කළේ ය.

සූර්යබල ,සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යංශයේදී පෙරේදා (14) පැවැති නිල සාකච්ඡාවකට සහභාගී වෙමින් රාජ්‍ය අමාත්‍යවරයා මේ බව ප්‍රකාශ කළේ ය.

පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් යොදාගැනීම , විදුලිබිල අවම කරගැනීම , විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා ස්ථිරසාර විසඳුම් ඉදිරිපත් කළ යුතු බවත් ඒ පිළිබඳව මුළු රටම දැනුවත් කළ යුතු බවත් පැවැසූ ඒ මහතා ඒ වෙනුවෙන් උපරිමයෙන් සූර්යාලෝකය ලැබෙන ප්‍රදේශයන් තෝරාගනිමින් ඉදිරි වැඩපිළිවෙළ දියත් කළ යුතු බවත් ප්‍රකාශ කළේ ය.



ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව යමින් වසර 2023වන විට ජාතික විදුලිබල පද්ධතියට පුනර්ජනනීය බලශක්ති දායකත්වය සියයට 70 දක්වා වර්ධනය කිරීමේ වැඩපිළිවෙලට සමගාමීව පුනරීන්, මන්නාරම සහ මොණරාගල ඉදිකිරීමට නියමිත සුළං හා සූර්යබල උද්‍යානයන්හි වැඩකටයුතු කඩිනම් කළ යුතු බව එහිදී පෙන්වා දුන්නේ ය.

පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් හරහා ලබාගත හැකි ප්‍රතිලාභ සම්බන්ධව ජනතාව දැනුවත්වී නොමැති බවත් බලශක්ති සංරක්ෂණ ක්‍රමවේදයන් අනුගමනය කිරීම ඉතාම අල්පබවත් පෙන්වා දෙන රාජ්‍ය අමාත්‍යවරයා එම කටයුතු සම්බන්ධයෙන් ජනතාව මනාව දැනුවත් කළ යුතු බවත් පියසි මත සවිකරනු ලබන සූර්ය බලාගාරයන්හි වාසිසහගත බව ප්‍රායෝගිකව සනාථකර පෙන්විය යුතු බවත් කීවේ ය.

එම අවස්ථාවට සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අසංක රොද්‍රිගු, විදුලිබල අමාත්‍යංශයේ ලේකම් වසන්තා පෙරේරා, රාජ්‍ය අමාත්‍යංශයේ ලේකම් හේමන්ත සමරකෝන් යන මහත්ම මහත්මීහු ඇතුළු අමාත්‍යංශයේ හා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නිලධාරීහු පිරිසක් සහභාගී වූහ.

# නෞකා සම්බන්ධ පාඨමාලාවක් ත්‍රිකුණාමලයේදී නිමාවට පත් වේ

**මහින්ද අලුත්ගෙදර**

නෞකා වෙත ප්‍රවිෂ්ට වීම, සෝදිසි කිරීම සහ අත්අඩංගුවට ගැනීමේ ක්‍රමෝපායන් සම්බන්ධ පාඨමාලාව ත්‍රිකුණාමලයේ දී නිමාවට පත්ව තිබේ.

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ සම්බන්ධ කාර්යාලය හා එක්ව ශ්‍රී ලංකාවේ නීතිය බලගැන්වීමේ ආයතනයන්හි පුද්ගලයන් සඳහා නෞකා වෙත ප්‍රවිෂ්ට වීම, සෝදිසි කිරීම සහ අත්අඩංගුවට ගැනීමේ ක්‍රමෝපායන් සම්බන්ධයෙන් පවත්වනු ලැබූ පාඨමාලාව ත්‍රිකුණාමලය විශේෂ යාත්‍රා බළඝණ මූලස්ථානයේ දී සාර්ථකව නිමාවට පත්වූ බව නාවික හමුදා මාධ්‍ය අංශය පවසයි.

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ සම්බන්ධ කාර්යාලයේ ගෝලීය සාගරික අපරාධ වැඩසටහන යටතේ ශ්‍රී ලංකා නාවික හමුදාව හා එක්ව පසුගිය සැප්තැම්බර් 28 වන දින සිව්වන වරට ආරම්භ කරන ලද නෞකා වෙත ප්‍රවිෂ්ට වීම, සෝදිසි කිරීම සහ අත්අඩංගුවට ගැනීමේ ක්‍රමෝපායන් සම්බන්ධ මෙම විශේෂ පාඨමාලාව මඟින් නෞකා වෙත ප්‍රවිෂ්ට වීමේ ක්‍රියාපටිපාටිය මෙන්ම මත්ද්‍රව්‍ය හඳුනාගැනීම්, පරීක්ෂා කිරීමේ ක්‍රමෝපායන් සහ මත්ද්‍රව්‍ය හුවමාරු කිරීමේ ක්‍රම සම්බන්ධයෙන් ද දැනුම ලබාදීමට කටයුතු කර තිබේ.



සති දෙකක් පුරා පැවැති මෙම පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලීසිය සහ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් තිස් දෙනෙකුගෙන් යුත් පුහුණුවන්නන් කණ්ඩායමක් සහභාගී වූ අතර, නීති විරෝධි මත්ද්‍රව්‍ය ජාවාරම පිටුදැකීමේ මෙහෙයුම් සඳහා දායක වන පාර්ශවකරුවන් ලෙස ශ්‍රී ලංකා පොලීසියේ සහ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මෙම පාඨමාලාව සඳහා සහභාගී වූ ප්‍රථම අවස්ථාව ද මෙය වෙයි.

# එදිනෙදා රැකියාවල නිරත දසදහස් ගණනකගේ ජීවනෝපාය අහිමි වෙලා

## හිටපු මන්ත්‍රී අකිල විරාජ් කාරියවසම්

**මැදකොළඹ සමූහ**
**ආරියරත්න ගනේගොඩ**

කොවිඩ් 19 වසංගතය නිසා අද රට තුළ එදිනෙදා රැකියාවල් කරන දසදහස් ගණනකගේ රැකියාවල් අහිමි වීමෙන් ඔවුනගේ දරු පවුල්වලට දිවි පෙවෙත රැක ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇතැයි හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එක්සත් ජාතික පක්ෂයේ මහලේකම් අකිල විරාජ් කාරියවසම් මහතා පැවසීය.

සිරිකොත පක්ෂ මූලස්ථානයේදී ඊයේ (14) පැවති මාධ්‍ය හමුවකදී ඒ මහතා මේ බව පැවසීය.

එහිදී ඒ මහතා මෙසේ ද කීය.

දැනට රටේ ප්‍රදේශ කීපයකම පවතින සහ දිනෙන් දින ඉහළ යන කොවිඩ් 19 ආසාදිතයන්ගේ සංඛ්‍යාව පිළිබඳවත් බ්‍රැන්ඩික්ස් ආයතනයට ඉන්දියාවේ සිට පැමිණි සේවක සේවිකාවන් පිළිබඳ විස්තරයක් රටේ ජනතාවගේ දැන ගැනීමට සැලැස්වීම වත්මන් ආණ්ඩුවේ යුතුකමක්. මේ වන විට කොළඹ, ගම්පහ, කුරුණෑගල දිස්ත්‍රික්ක තුළත් කුලියාපිටිය ඇතුළු තවත් ප්‍රදේශ ගණනාවකින්ම කොවිඩ් 19 ආසාදිතයන් හමු වී තිබෙනවා.

රටේ ජනතාව මේ වන විට සෑහෙන හිරවීමකට ලක් වී සිටිනවා. ශිෂ්‍යත්ව විභාගය ද පැවැති මේ අවස්ථාවේදී ක්‍රමවත් වැඩපිළිවෙළකින් සිදු කිරීමට ආණ්ඩුවේ උපදෙසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ බලධාරීන් ගුරුවර ගුරුවරියන් ද මව් දෙමාපියන්ද කටයුතු කිරීම පිළිබඳ සතුටු විය හැකි වුවත් පී. සී. ආර්. පරීක්ෂණ සිදු කිරීමත් ඉතා වටිනා අතර, ඉන්දියාවේ සිට මෙරටට පැමිණි බ්‍රැන්ඩික්ස් සේවක සේවිකාවන්ට එම ආයතනයේම නිරෝධායනයකට ලක් නොකොට කර්මාන්තශාලාවට ඇතුළුවීමට ඉඩ ලබා දුන්නේ කාගේ අනුමැතියකට දැයි අකිල විරාජ් කාරියවසම් මහලේකම්වරයා ප්‍රශ්න කර සිටියේය.

මේ පිළිබඳව සෞඛ්‍ය බලධාරීන් ඉතා කඩිනමින් පියවරක් ගත යුතු වුවත්, රටේ සෞඛ්‍ය අමාත්‍යවරිය මුනිවත රකිමින් සිටීම ඉතාමත් කනගාටුවට කරුණක් බව ද එජාප මහලේකම් මාධ්‍යවේදීන් හමුවේ සඳහන් කර සිටියේය.

මේ අවස්ථාවේ රජය ඉදිරිපත් කිරීමට යෝජිත 20 වන සංශෝධනයට එරෙහිව නඩු දෙකක් තම පක්ෂය විසින් පවරා තිබෙන බවත්, තවත් මාධ්‍යවේදියකුගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් එජාප මහලේකම්වරයා ප්‍රකාශ කළේය. තමා අධ්‍යාපන අමාත්‍යවරයාව සිටියදී පාසල් පන්තිවලට 1, 2, 3, සහ 4 යනුවෙන් එක් පන්තියකට 35 දෙනෙකුගෙන් සමන්විත පන්ති රට පුරාම ආරම්භ කළ බවත්, රටේ දිස්ත්‍රික්ක 25 න්ම තෝරාගන්නා ලද පාසල් සඳහා අවශ්‍ය ජලය, වැසිකිළි සමග ක්‍රීඩා නිලධාරීන් සේවාවන් ද ලබා දුන් බවත් පාසල්වලට තමා වැසිකිළි පමණක් 45,000 ක ප්‍රමාණයක් ලබා දුන්නේ යැයි තවත් මාධ්‍යවේදියකුගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් අකිල විරාජ් කාරියවසම් මහතා කියා සිටියේය.

20 වන සංශෝධනයට එරෙහිව නඩු ප්‍රමාණය 40 කට ආසන්න යැයි ද ඒ පිළිබඳව කතානායකවරයාට වාර්තාව යැවීමට පෙර මාධ්‍ය එළිදැක්වූයේ කෙසේද? යන්න තවත් මාධ්‍යවේදියෙකු විසින් නඟන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් තමාත් ඒ බව මාධ්‍ය මඟින් දුටුවත් මෙය කොහොම වුණ සිද්ධියක් දැයි තමාට සිතා ගැනීමට අපහසු බව ද එජාප මහලේකම් නීතිඥ අකිල විරාජ් මහතා කියා සිටියේය.

අද රට තුළ එදිනෙදා රැකියාවල් කරන පිරිස් දසදහස් ගණනකට කොවිඩ් 19 ප්‍රශ්නය නිසා රැකියා අහිමිවීමෙන් දරු පවුල් දහස් ගණනකට දිවිපෙවෙත ගෙවා ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇති බවත්, ඒ සමගම එදිනෙදා බඩුවල මිල පමණක් නොව පොල් ගෙඩියක් රුපියල් 100 කට මිල දී ගැනීමට අහිංසක ජනතාවට සිදු වී තිබෙන බවත්, රජය මේ පිළිබඳව පුළුල් පැහැදිලි කිරීමක් ජනතාවට ලබා දිය යුතු බවත් එජාප මහලේකම් අකිල විරාජ් කාරියවසම් මහතා පැවසීය.

# ‘වාරි සෞභාග්‍යයා’ වැව් ප්‍රතිසංස්කරණ ජාතික ව්‍යාපෘතියට ත්‍රිවිධ හමුදාවේ සහාය

**චන්දිමා කරුණාරත්න**

“වාරි සෞභාග්‍යයා“ වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ ජාතික ව්‍යාපෘතියට ත්‍රිවිධ හමුදාවේ පූර්ණ සහය හිමිවේ.

වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති “වාරි සෞභාග්‍යයා“ විශේෂ කාර්ය සාධන බලකායේ මූලික මෙහෙයුම් කමිටු රැස්වීමේදී රටපුරා ඇති වැව්, අමුණු හා කෘෂි වාරි පද්ධති 5000ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ජාතික වැඩසටහන සඳහා ත්‍රිවිධ හමුදාවේ සහය ලබාගැනීමේ තීරණය ගැනිණි.

මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය සිරිපාල ගම්ලත්, ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍ය අනුරාධ ජයරත්න, ත්‍රිවිධ හමුදාපතිවරු ඇතුළු ආරක්ෂක ප්‍රධානීන්, වාරි මාර්ග අමාත්‍යාංශයේ ලේකම්, රාජ්‍ය අමාත්‍යාංශවල ලේකම්වරු, වාරි මාර්ග සහ මහවැලි ආයතනවල අධ්‍යක්ෂ ජනරාල්වරු ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙම කමිටු රැස්වීමට සහභාගී වූහ.



වාරිමාර්ග දෙපාර්තමේන්තුව , ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වැව් ප්‍රතිසංස්කරණ ජාතික ව්‍යාපෘතියේ ප්‍රධාන පාර්ශවකරුවන් වේ.

එහි සමාරම්භක අවස්ථාව වෙනුවෙන් ප්‍රතිසංස්කරණය කළ යුතු වැව් 100ක් හඳුනාගෙන එම ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් සිදුකළ යුතු බවට තීරණය වූ අතර එම කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරුන්ගේ පූර්ණ මගපෙන්වීම මත ත්‍රිවිධ හමුදාවේ දායකත්වයෙන් සිදු කෙරේ.

ප්‍රතිසංස්කරණය කළ යුතු වැව් හඳුනාගැනීම සඳහා වැව් පිහිටි ගම්මානවල ආගමික සිද්ධස්ථාන, පාසල් ප්‍රජාව, ගොවිජන සහ තරුණ සංවිධානවල සාමාජිකත්වය සහිතව ග්‍රාමීය කමිටුවක් ස්ථාපිත කිරීමටත්, එම කමිටුවේ මගපෙන්වීම හා ශ්‍රම දායකත්වය ලබාගනිමින් ප්‍රතිසංස්කරණය කරන වැව් ආශ්‍රිතව රුක් රෝපණ වැඩසටහනක්ද සැලසුම් කර ඇත.

ඒ අනුව ජල පෝෂිත ප්‍රදේශ සංරක්ෂණය කිරීමේ ක්‍රියාවලියට කුඹුක් , මී වැනි ගස් රෝපණය කිරීමටත් තීරණය කෙරිණි.

මෙම සියලු කටයුතු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ‘සෞභාග්‍යයේ දැක්ම‘ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව ක්‍රියාත්මක කෙරේ.

# ලෝක ආතරයිටීස් දිනය සැමරේ

පසුගිය 12 දාට යෙදුණු ලෝක ආතරයිටීස් දිනය නිමිත්තෙන් ආතරයිටීස් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැති අතර රෝග විනිශ්චය කිරීමේ හා ප්‍රතිකාර කිරීමේ අවශ්‍යතාව පිළිබව අවධානය යොමු කෙරිණි.

‘වැඩක නිරත වීමට කාලයයි‘ (Time to work) යන්න තේමාව යටතේ ලොව පුරා සෞඛ්‍ය සංවිධාන ලෝක ආතරයිටිස් දිනය වෙනුවෙන් විශේෂ උත්සව පවත්වන ලදී. ඒ අනුව අධ්‍යාපන සම්මන්ත්‍රණ මඟින් දැනුවත් කිරීම සහ ආතරයිටිස් රෝගයෙන් මීදීමට පුද්ගලයන් දිරිමත් කිරීම සිදුකෙරිණි.

ලොව පුරා මිලියන 350ක ජනතාවකට මෙම රෝගය වැළඳී ඇත. ආතරයිටිස් සහ ඒ ආශ්‍රිත තත්වයන් නිසා සෑම වසරකම වෛද්‍ය වියදම් ඩොලර් බිලියන 156 කට වඩා වැඩි අතර මෙම රෝගය වසරකට රෝහල්ගත කිරීම් මිලියනයකට ආසන්න ප්‍රමාණයක් පවතී.

ආතරයිටිස් සාමාන්‍යයෙන් සන්ධි දැවිල්ල ලෙස ද හැඳින්වෙන අතර ආතරයිටිස් වර්ග 100 කට වඩා තිබෙන බව මේ වන විට සොයාගෙන තිබේ.

මේ අතරින් වඩාත් සුලභ ආතරයිටීස් වර්ග දෙක වන්නේ ඔස්ටියෝ ආතරයිටිස් සහ රූමැටොයිඩ් ආතරයිටිස් වේ.

# පාරිසරික හානි දන්වන්න විශේෂ දුරකතන අංක

**අමෝදා ජයමහ**

පරිසර අමාත්‍යංශය විසින් පාරිසරික හානි දැනුවත් කිරීම සඳහා විශේෂ දුරකතන අංක ත්‍රිත්වයක් හඳුන්වා දී ඇත.

ඒ අනුව පරිසර අමාත්‍යාංශයේ 1991, මධ්‍යම පරිසර අධිකාරියේ 1981, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ 1921 දුරකතන අංකත්, අමාත්‍යවරයාගේ පෞද්ගලික දුරකතනය වන 070-755-5666 යන දුරකතන අංකයට වට්ස්ඇප් පණිවිඩයක්,කෙටි පණිවිඩ හා පරිසර හානීන් සිදුවන ආකාරය සඳහන් වන වීඩියෝපට යොමු කරන ලෙස අමාත්‍යවරයා විසින් මහජනතාවගෙන් ඉල්ලා සිටියේ ය.

මෙම දුරකථන අංක හරහා පරිසර අමාත්‍යාංශයේ නිළධාරීන්ව ඍජුව සම්බන්ධ කර ගනිමින් පරිසර හානීන් පිළිබඳ දැනුම්වත් කිරීමට හැකි බව පරිසර අමාත්‍යංශයේ ඊයේ (15) විශේෂ මාධ්‍ය හමුවක් කැඳවමින් අමාත්‍යවරයා කීවේ ය.

එමෙන්ම ඇතැම් සමාජ මාධ්‍ය තුළ පරිසර හානිවීම් ලෙස හුවා දක්වමින් පළ වන තොරතුරු බහුතරයක කිසිදු සත්‍යතාවයක් නො මැති බවත්, ඇතැම් ගොවින් විසින් වසර ගණනාවක් වගා නොකර අත්හැර දමා ඇති අක්කර 10-15 තරම් විශාල පුද්ගලික ඉඩම් වගාව සඳහා සුද්ද කරන විට ඒවා ද වන විනාශයන් ලෙස සඳහන් කරමින් පුවත් පළ කරන අවස්ථා ද තමන් නිරීක්ෂණය කළ බව ඇමැතිවරයා කියා සිටියේය.




කෙසේ වුවද යම් අයෙක් පරිසර හානියක් සිදු කරන්නේ නම් ඊට එරෙහිව තමන් මෙන්ම රජයද ගත හැකි ඉහළම නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවත්, පරිසර හානි කරන්නන්ට එරෙහිව දැනට ඇති දඩුවම් වැඩි කිරීම සඳහා පරිසර පනත කඩිනමින් සංශෝධනයට ලක් කරන ලෙස විශය භාර අමාත්‍යවරයා ලෙස නීතිපතිවරයාගෙන් තමා ඉල්ලීම් කර ඇති බවත් මහින්ද අමරවීර මහතා පැවසුවේ ය.

සැබැවින්ම සිදු කරන ලද පරිසර හානි කිරීම් පහක් (05) වාර්තා වී තිබූ අතර ඒ සියලු දෙනාට එරෙහිව රජය නීතිය ක්‍රියාත්මක කර තිබෙන බව ද ඒ මහතා පැවසී ය.

පරිසර හානි ලෙස සඳහන් කරමින් රජයට අපහාස කිරීම් වැඩ පිලිවෙළක් විපක්ෂය විසින් ගෙන යන බවද අමාත්‍යවරයා මෙහි දී වැඩිදුරටත් කීවේ ය.

ඡායාරූපය - **විපුල අමරසිංහ**

# ග්‍රාමීය මාර්ග සංවර්ධනය මඩකළපුවේ සාර්ථකව ක්‍රියාත්මකයි

**මඩකළපුව සංචාරක**
**පී.ටී.ඒ. ලතීෆ්**

ග්‍රාමීය ජනතාවට තව පහසුගම් ගමන් මාර්ගය ලබාදීම සඳහා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සංකල්පයකට අනුව දිවයින පුරා ක්‍රියාත්මක වෙන කිලෝමීටර් එක්ලක්ෂ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ කටයුතු දැනට මඩකළපු දිස්ත්‍රික්කයේ දී ඉතා සාර්ථකව ක්‍රියාත්මහවන යනබව මාර්ග සංවර්ධන අධිකාරිය පවසයි

ග්‍රාමීය මාර්ග සංවර්ධනයක්‍රීම විශේෂ ව්‍යාපෘති යටතේ කිලෝමීටර් විසිදෙකක් නව මාර්ගයේ ඇති කිරීම සඳහා මාර්ග සංවර්ධන අමාත්‍යංශය ඇමැති ජොන්ස්ටන් මහතාගේ අනුමැතියෙන් රුපියල් කෝටි 562 මුදල් වෙන් කරවා තිබේ. මෙම මුදලින් නව මාර්ග ඉදිකිරීම කටයුතු දැනට මාර්ග සංවර්ධන අධිකාරියේ මඩකළපු දිස්ත්‍රික් කාර්යාලය මගින් පවත්වාගෙන යන බව සඳහන්.



මෙම විශේෂ ව්‍යාපෘතියකට අනුව කිලෝමීටර් එකට නව ග්‍රාමීය මාර්ගයක් සංවර්ධනයක්‍රීම සඳහා මාර්ග සංවර්ධන කටයුතු රාජ්‍ය ඇමැති වියාලෙන්දිරන් මහතා අතින් උත්සවාකාරයෙන් ආරම්භ කරවන ලදී.

රුපියල් කෝටි 3 කින් ඉදිකිරීමට නියමිතය මෙම නව මාර්ගය අවසන් වීමෙන් පසු එම ප්‍රදේශයට අයත් තම්බලවත්ත, පාලමුනේ කනේසපුරම්, සන්කර්පුරම් ආදී ගම්මානවලට අයත් පවුල්5000 ක්

දිගු කාලකසිට දමන්ගේ අත්‍යවශ්‍ය ආහාර සහ දෛනික අවශ්‍යතා සඳහා ප්‍රවාහනයේදී මුහුණ දුන් විශාල ගැටලුවලට විසඳුම ලැබෙනබව ප්‍රදේශයේ වාසීහු පවසති.

# වකුගඩු රෝගියා පිහිට පතයි

ගොතටුව ,අඹගහවත්ත අංක 226,ලිපිනයෙහි පදිංචි මනෝජ් ප්‍රියංක සිල්වා ,දරුනු වකුගඩු රෝගයකින් පෙළෙයි.ඔහුගේ ජීවිතය බේරාගැනීමට ඕ පොසිටිව් හෝ බී පොසිටිව් වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බව ඔහුට ප්‍රතිකාර කරන වෛද්‍යවරුන් නිර්දේශ කර ඇත.

මනෝජ් වෙනුවෙන් වකුගඩුවක් පරිත්‍යාග කළ හැකි පින්වතකු වේ නම් දුරකතන අංක 0778099297 හෝ 0777 184572 වෙත දන්වන මෙන් ඉල්ලීමක් කරයි.

# තුරුසවිය අරමුදල් සහ රබර් සංවර්ධනය පිළිබඳ සාකච්ඡාවක්

තුරුසවිය අරමුදල් වැඩසටහන සහ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ පසුගිය මස ප්‍රගතිය මෙන්ම ඉදිරි වැඩ සැලැස්ම පිළිබඳ වැවිලි රාජ්‍ය අමාත්‍යංශයේදී සකච්ඡාවවක් පැවැත්වීය.

මෙහිදී රබර් ගොවින්ගේ තුරුසවිය සමිති බලගැන්විම,ප්‍රමිතිගත දුම් ගෙයක් සදාගැනිමට අධාර හා අනුබලදීම තුලින් ඉහළ වටිනාකමක් දෙන නිෂ්පාදන එක් දිනක් තුලින් ලබාගැනීම,ගොවින්ගේ ප්‍රධාන අදායම් මාර්ගයට අමතර ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් සඳහා පුහුණු පැවැත්විම,රබර් වෙන්දේසිය වැඩසටහන් සෑම දිස්ත්‍රික්කයම පැවැත්විම ඇතුළු කරුණු රාශියක් පිළිබඳ සකච්ඡා විය මේ සදහා රාජ්‍ය අමාත්‍ය කනක හේරත් මහතා, රාජ්‍ය ඇමැති ලේකම්, තුරුසවිය වැඩසටහනේ නිලධාරින්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරින් පිරිසක් ද එක්වී සිටියහ

මෙහිදී අදහස් දක්වමින් තුරුසවිය අරමුදලේ සහ රබර් දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් ප්‍රකාශ කළේ ගුණාත්මක තත්වයේ රබර් රොටි නිෂ්පාදනය කිරීම සඳහා තාක්ෂණිකව වැඩි දියුණු කරන ලද දුම් ගෙයක් නිර්මාණය කර ඇති බවයි. දැනට භාවිත වන සාමාන්‍ය දුම්ගෙයක් මගින් නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියට දින කිහිපයක් ගත වුවත් තාක්ෂනය දියුණු කරන ලද මෙම දුම්ගෙය මගින් එක් දිනක් තුල ප්‍රමිතිගත රබර් රොටියක් නිෂ්පාදනය කර හැකිය.

මෙවැනි දුම්ගෙයක් නිර්මාණය කරගැනීම සඳහා රු.,150,000 ආධාර මුදලක් තුරුසවිය අරමුදලින් ලබා දේ.

සාමාන්යෙන් දුම්ගෙයක් නිර්මාණය කරගැනීම රු 160,000 පමණ මුදලකට නිර්මාණය කරගත හැකි අතර අවශ්‍ය තාක්ෂණික සහයෝගය තුරුසවිය අරමුදලින් ලබාදේ.

මෙවැනි දුම්ගේවල් 400 ඉදිකිරීමේ ව්‍යාපෘතියක් දැනටමත් ක්‍රියාත්මක අතර මේ වන විට මේවයින් 175 ක පමණ ප්‍රමාණයක වැඩ අවසන් කර නිෂ්පාදන ක්‍රියාවලියට දායකත්වය සපයයි.

# නුසුදුසු තෙල් වර්ග වෙළෙඳපොළෙන් ඉවත් කරන්න වැඩපිළිවෙළක් ඕනෑ

## පාරම්පරික පොල්තෙල් නිෂ්පාදකයන්ගේ සංගමය

**අනුර ප්‍රේමලාල්**

දේශීය පොල්තෙල් කර්මාන්තයත්, ආහාරයට නුසුදුසු තෙල් වර්ග වෙළෙඳපොළෙන් ඉවත් කිරීම සඳහා වහාම ජාතික වැඩපිළිවෙළක් නිර්මාණය කරගැනීම සඳහා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අතුළු රජයේ මැදිහත්වීමක් අවශ්‍ය බව සමස්ත ලංකා පාරම්පරික පොල්තෙල් නිෂ්පාදකයන්ගේ සංගමයේ කැඳවුම්කරු බුද්ධික ද සිල්වා මහතා ප්‍රකාශ කරයි.

ඒ මහතා මේ බව සඳහන් කළේ පසුගියදා (14) කොළඹ 02, නිපොන් හෝටලයේදී පැවැති එම සංගමය කැඳවා තිබූ මාධ්‍ය හමුවකට එක්වෙමින්ය. එහිදි වැඩිදුරටත් කතා කළ කැඳවුම්කරු මෙසේද කීය. පාරම්පරික පොල්තෙල් කර්මාන්තකරුවන් රැක ගැනීමත්, රටේ ජනතාවට පිරිසිදු පොල්තෙල් ආහාරය සඳහා අවස්ථාව උදා කිරීම සඳහා අපේ සංගමය සකස් කළ යෝජනාවලියක් මේවන විට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත ලබාදී සාකච්ඡාවක් ඉල්ලා තිබෙන අතර එම අවස්ථාව උදාවනතුරු අපේ සංගමය මග බලා සිටිනවා. මේවනවිට ෆාම් ඔයිල් හා ආදේශක තෙල් ආනයනය කිරීම ඒවාට බදුසහන ලබාදීම නිසා දේශීය පොල්තෙල් කර්මාන්ත කරුවන් තුන්සිය පනහක්, හාරසීයක් හා ඒ ආශ්‍රිත රැකියා කරන සේවකයින් ඉන් රැකෙන පවුල් වල සාමාජිකයින් ලක්ෂ හතරක් පමණ අසරණවී සිටින බව කිව යුතුයි. මෙම ෆාම් ඔයිල් හෝ ආදේශක තෙල් ගෙන්වන බහුජාතික සමාගම් හතරක් පමණ සිටිනවා. ඒ නිසා අපේ දේවල් රැකගෙන ජනතාවගේ සෞඛ්‍යට හිතකර පොල්තෙල් ආහාරයට ලබාදීමට රජයේ මැදිහත්වීම අනිවාර්ය වෙනවා. දැනට මේ ක්ෂේත්‍රයේ තිබෙන්නේ යල්පැන ගිය නීති ඒවා වහාම වෙනස් විය යුතුයි. ඉකුත් මැතිවරණවලදී අපිට අසන්න ලැබුණේ දේශිය ව්‍යාපාරිකයා, කර්මාන්තකරුවන්, කර්මාන්ත ආරක්ෂා කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට වත්මන් ආණ්ඩුව ක්‍රියාකරන බවයි. නමුත් තවමත් ඒ සඳහා පියවරක් නොගෙන තිබෙන බව තමයි කියන්න තියෙන්නේ. කර්මාන්ත ඇමැතිවරයාවත් අපි දැනුවත් කළා. ඇමැතිගෙන් හොඳ ප්‍රතිචාරයක් තිබුණාට එයාට පමණක් මේ කළ නොහැකි බව තමයි කියන්න තියෙන්නේ.



ෆාම් වගාව නවත්වන්න කියලා කිව්වට එය නෛතිකව සිදු විය යුතුයි. ඒ සඳහා 2014 දී ගැසට් එකක් නිකුත් කරලා තියෙනවා ෆාම් ගස් හෙක්ටයාර් විසිදහසක් වවන්න කියලා අවසර දීලා තියෙනවා. එය නීතියෙන්ම තහනම් කළ යුතුයි.

අමිල ප්‍රභාත් වනසිංහ-අනුරාධපුර අතිරේක

# නිසි මිලක් නැතිව ගලෙන්බිඳුණුවැව ලූනු කිලෝ ලක්ෂ 3ක් ගෙවල්වල



මේ වනවිට ලොකු ලූනු අස්වනු අලෙවි කර ගැනීමට නොහැකි වීමෙන් ගොවීන් දැඩි ලෙස අසීරුතාවට පත්ව සිටිති. ලොකු ලූනු සඳහා පනවා තිබු බද්ධ ඉවත් කිරීමත්, මුළු මිල පහළ බැසීමත් නිසා මෙම තත්ත්වය ඇතිව තිබෙන අතර ගලෙන්බිඳුණුවැව ප්‍රදේශයේ ලොකු ලූනු වගාකළ ගොවින්ද සිය අස්වැන්න අලෙවි කර ගැනීමට නොහැකි වීමෙන් අසීරුවට පත්ව සිටිති. මේ අනුව ගලෙන්බිඳුණුවැව ප්‍රදේශයේ ගැටලාව,දුටුවැව,නිකවැව,මයිලගස්වැව ඇතුළු ප්‍රදේශවල ගොවින් පසුගිය කන්නයේ විශාල වශයෙන් ලූනු වගා කර ඇති අතර මේ වනවිටත් එම ලූනු වගාවල අස්වනු නෙළමින් පවති.

මෙවර ලූනු වගාව සඳහා ගොවින්ට බීජවලට විශාල මුදලක් වැය කිරීමට සිදුවූ බවත් නිසි වෙලාවට පොහොර, තෙල්, ලබා ගැනීමට නොහැකි වූ නිසා ලොකු ලූනු අස්වැන්න නෙළීම පසුවු බව පෙන්වා දෙන ගොවියෝ සඳහන් කර සිටින්නේ ලූනු කිලෝවක නිශ්පාදන මිල රුපියල් අසූපහකට වැඩි බවත් රුපියල් සියයක මුලදලකට වෙළෙඳපොළට අලෙවි කිරීමට සිදුවීමෙන් තමන් මහත් අපහසුතාවට පත්ව සිටින බවය. එමෙන්ම ගලෙන්බිඳුණුවැව ගොවින් ලූනු කිලෝ ලක්ෂ තුනකට ආසන්න ප්‍රමාණයක් සිය නිවෙස්වල තබා ගනිමින් සිටි. ඒ අනුව තමන්ගේ අස්වනු සඳහා නිසි මිලක් ලබා දෙනමෙන් ගොවි ජනතාව බලධාරීන්ගෙන් ඉල්ලා සිටිති.එමෙන්ම රුපියල් දෙසිය විස්සක පමණ මුදලකට ලොකු ලූනු මිලදි ගත් වෙළෙන්දෝ මේ වනවිට අසීරුතා රැසකට මුහුණ පා සිටිති.

දිනමිණ දසත දස අත ම එක තැන

එස්.පී.විජේරත්න - කටුගස්තොට සමූහ

## බොක්කාවෙල රෝහල රෝගීන්ගෙන් පිරිලා

බොක්කාවල රෝහල රෝගීන්ගෙන් පිරී ඇති බවත් එයට හේතුව මහනුවර මහ රෝහලේ සායනයකට යන රෝගීන්ගෙන් ළගම ඇති රෝහල කුමක්දැයි විමසා, බොක්කාවල රෝහල කියා පැවසුවොත් ඒ අදාළ රෝගියාගේ සායනික වාර්තාව බොක්කාවල රෝහලට මාරු කිරීමට එම වෛද්‍යවරු කටයුතු කරන නිසා බොක්කාවල රෝහලේ රෝගීන් වැඩිවෙමින් පවතිනවා යැයි පූජාපිටිය ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි නන්දා විජේකෝන් මහත්මිය කීවාය. එම ප්‍රාදේශීය සභාවේ මාසික රැස්වීමට සහභාගි වෙමින් ඒ මහත්මිය එසේ කීවාය .එහිදි මන්ත්‍රීවරිය මෙසේද පැවැසුවාය.

ඒකට විකල්පය මොකක්ද කියල සොයන්නේ නැතිව අනවශ්‍ය ලෙස රෝගින් මාරු කිරීම තුළින් රෝහලේ තදබදය වැඩි වෙනවා. ඊට විකල්පයක් ලෙස ඒ සඳහා අවශ්‍ය වෛද්‍යවරු,කාර්ය මණ්ඩලය වැනි අඩුපාඩු සපුරන්නේ නෑ. මේ පිළිබඳ ආණ්ඩුකාර, පළාත් පාලන කොමසාරිස්, දැනුවත් කරන ලෙසද මන්ත්‍රීවරිය සභාපති අනුර ප්‍රනාන්දු මහතාගෙන් ඉල්ලීමක් කළාය.තවද මහනුවර මහ රෝහලේ හෝ වෙනත් රෝහලකින් රෝගින් බොක්කාවල රෝහලට අනුදැනුමකින් තොරව එවනවා නම් අනිවාර්යෙන්ම රෝහලට සියලුම පහසුකම් සලසා දෙන ලෙසත් එසේ නැතිනම් මීට වඩා විශාල ප්‍රශ්න ගොඩකට රෝහලේ රෝගීන් හා අවට ප්‍රදේශවාසීන්ට මුහුණ දීමට සිදුවන බවත් ඇය වැඩිදුරටත් කියා සිටියාය.

සම්පත් ප්‍රියනන්දන - බළන්ගොඩ විශේෂ

## වසර 100ක් පරණ අඩි 100ක් දිග වලේබොඩ කම්බි පාලම ඇලවෙලා



ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපති ශ්‍රී ලාල් සෙනරත්

බළන්ගොඩ ප්‍රාදේශිය සභා මන්ත්‍රී ශාමන්ත අබේරත්න

ඉඹුල්පේ පහළ වලේබොඩ ප්‍රදේශය සහ බළන්ගොඩ සීතගල ප්‍රදේශය යා කෙරෙමින් ජනතාවට එගොඩ මෙගොඩ යෑම සඳහා වලවේ ගඟට ඉහළින් ඉදිකර ඇති කම්බි පාලමේ ප්‍රධාන කම්බි දිරාපත් වීම හේතුවෙන් පාලම කඩා වැටීමට ආසන්නව එක පැත්තකට ඇලවී ඇති බව ජනතාව පවසති.

වසර සියයකට වඩා පැරණි පහළ වලේබොඩ කම්බි පාලමෙහි කම්බි දිරාපත් වීම හේතුවෙන් ඒ මතින් ගමන් කිරීම දැඩි අවදානම් තත්ත්වයකට පත්ව ඇති බවට ප්‍රදේශවාසීහු පෙන්වා දෙති.දිගින් අඩි සියයකට වැඩි එම කම්බි පාලම වලවේ ගඟට අඩි පනහක් පමණ ඉහළින් ඉදිකර ඇත.

මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ බළන්ගොඩ ප්‍රාදේශිය සභා මන්ත්‍රී ශාමන්ත අබේරත්න මහතා - දිනකට පාසල් දරුවන් ඇතුළු පන්සියකට වැඩි පිරිසක් පහළ වලේබොඩ අවදානම් කම්බි පාලම මතින් එගොඩ මෙගොඩ යනවා.මේ පාලම වසර විස්සකට ආසන්න කාලයක් ප්‍රතිසංස්කරණය කරල නැහැ.ඒ වගේම ප්‍රදේශයේ තේ වගාව ජීවිකාව කරගත් ජනතාවක් ජීවත් වෙන අතර ඔවුහු විශාල පිරිසක් අමු තේ දළු කර මතින් එගොඩ මෙගොඩ රැගෙන යන්නේ මේ අවදානම් පාලම උඩින්.කම්බි දිරාපත් වීම හේතුවෙන් පාලම කඩා වැටීමට ආසන්නව එක දිශාවකට ඇල වෙලා තිබෙනවා. ජීවිත හානියක් වීමට පෙර කම්බි පාලම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා බලධාරින්ගේ කඩිනම් අවධානය යොමු විය යුතුයි.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභාපති ශ්‍රී ලාල් සෙනරත් මහතා මෙසේ කීය- පහළ වලේබොඩ කම්බි පාලම ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍යයි. විධායක ඉංජිනේරු කාර්ය සමග එක්ව ඒ සඳහා ඇස්තමේන්තුවක් සකස් කර තිබෙනවා . එය ටෙන්ඩර් කැඳවා ඇති අතර කොන්ත්‍රාත්කරුවකු එම ටෙන්ඩර ලබා ගත් පසු පාලම කඩිනමින් පිළිසකර කළ හැකියි.

ඇම්.පී චන්ද්‍රපාල - තංගල්ල විශේෂ

## කෝවිඩ් මැඩලන්න හම්බන්තොටදී සාකච්ඡා





හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ කෝවිඩ් වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා ගතයුතු පියවර පිළිබඳ සෞඛ්‍ය අංශයේ සහ ආරක්ෂක අංශවල නිලධාරින් සමග සාකච්ඡාවක් ඉකුත්දා ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්වුණි. මේ සාකච්ඡාවට රාජ්‍ය ඇමැති ඩී.වී.චානක, දිස්ත්‍රික් සංවර්ධන කොමිටියේ සභාපති වෛද්‍ය උපුල් ගලප්පත්ති හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් එච්.ඩී.කරුණාරත්න යන මහත්වරු ඇතුළු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්,ආරක්ෂක අංශවල නිලධාරින් ඇතුළු රාජ්‍ය නිලධාරිහු විශාල පිරිසක් සහභාගී වූහ.

කපිල සෝමරත්න - පාණදුර සමූහ

## අන්සතු ඉඩම්වලට හොර ඔප්පු ලියා බන්ධනාගාරයට

කළුතර දිසාවේ පෞද්ගලික සහ රජයේ ඉඩම් කැබලිවලට හොර ඔප්පු ලියා ගැණුම්කරුවන් රවටා එම ඉඩම් රුපියල් කෝටි ගණන්වලටඅලෙවි කර මුදල් වංචා කරන සංවිධානාත්මක කල්ලියක ක්‍රියාකාරින් දෙදෙනකු හොරණ විශේෂ අපරාධ සහ වංචා විමර්ශන ඒකකයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට පියවර ගෙන තිබේ.

ඉකුත් සතියේ පොලිස් ඒකකයට ලැබුණු පැමිණිල්ලක් මත ක්‍රියාත්මක වු පොලිස් නිලධාරීන් මොරගහහේන මිල්ලෑව තක්ෂිලා පෙදෙසේ සිදුවී ඇතැයි කියන මහා පරිමාණයේ ජාවාරම ගැන සියලු තොරතුරු සොයා ගැනීමෙන් පසු අදාළ හොර ඔප්පු කල්ලියේ ක්‍රියාකාරින් දෙදෙනකු අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේදී රහසිගතව කළුතර දිසාවේ ක්‍රියාත්මක වන හොර ඔප්පු කල්ලියේ තොරතුරු සොයා ගෙන ඇත. මේ කල්ලිය විසින් අනුන්ගේ ඉඩම්වලට හොර ඔප්පු සකස් කරන්නේ නීතිඥවරයකුගේ සහාය ඇතිව බව අනාවරණය වේ. දැනටමත් මොරගහහේන මිල්ලෑව තක්ෂිලා උයන පෙදෙසේ පෞද්ගලික ඉඩම් කැබලි 11ක් පමණ හොර ඔප්පු සකසා ගැණුම්කරුවන්ට අලෙවි කර රුපියල් එක් කෝටි පනස් ලක්ෂයක පමණ මුදලක් උපයා ගෙන ඇති බව දැනට අත්අඩංගුවට ගෙන සිටින සැකකරුවන් දෙදෙනාගෙන් අනාවරණය කර ගැනීමට පොලීසියට හැකිවී ඇත.

මේ අතර බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල පෙදෙසේ තිබෙන රජයේ ඉඩම් කැබලිවලට හොර ඔප්පු සකස් කර අලෙවි කරන පුද්ගලයකු ගැනද පාණදුර විශේෂ අපරාධ සහ වංචා විමර්ශන අංශය විසින් පරීක්ෂණ පවත්වයි.

මීගහකිවුල සමූහ

## රිදීමාලියද්ද අන්නාසිගලයාය ගමට පාරක් දෙනවද?

අහල වලූ



රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අන්නාසිගලයාය ගම්මානයට නිසි මාර්ග පහසුකම් නැත. ගම්මානයට පිවිසීම සඳහා ඉදිකර ඇති ප්‍රධාන මාර්ගය ගල් ගැලවී විනාශයට පත්ව අඩි පාරක තත්ත්වයට පත්ව ඇතැයිද එම ගම්මු පවසති. ගම්මානයට ඒමට නිසි මාර්ගයක් නොමැති වීම හේතුවෙන් මේ ගම්මානවල පදිංචි පවුල් 60ක පමණ පිරිසකට කිලෝමීටර් හතරක් පමණ පා ගමනින් මඟ ගෙවාගෙන ප්‍රධාන මාර්ගය වෙත ඒමට සිදුව ඇතැයිද ද එම ගම්මු පවසති. මේ හේතුවෙන් ගම්මානයේ පාසල් දරුවන් ඇතුළු ගොවිතැනින් ජීවත් වන බහුතරයක් ජනතාව දැඩි පීඩාවකට පත්ව සිටිති.

වසර ගණනාවකට පෙර ඉදි කළ මාර්ගයේ පිළිසකර කටයුතු අවසන් කර නොමැති අතර මේ වන විට මාර්ගය සෝදාපාළුවට ලක්ව විශාල වළවල් හෑරී කැලෑවට යටවී ඇතැයි ද ඔවුහු පවසති.

මාර්ගයේ බොහෝ ස්ථානවල පැති කානු මෙන්ම බෝක්කු සවි කර නොමැති අතර සුළු වර්ෂාවකදී පවා ජලය මහ පාරේ ගලා යමින් එය මඩගොහොරුවක් වන බව ද ගම්මු පවසති. මේ හේතුව නිසා ගමේ අයකු රෝගී වූ විට කඳක බැඳ ඔසවාගෙන යෑමටද සිදුව ඇත. ගමේ බහුතරයක් දෙනා ගොවිතැනින් ජීවත් වන අතර ගමේ ගොවි නිෂ්පාදන නගරය වෙත රැගෙන ඒමට නොහැකි වීමෙන් ඒවා විනාශයට පත් වන බව ද ගම්මු පවසති.

දශක ගණනාවක් තිස්සේ තම ගමට එන මාර්ගය ඉදිකර දෙන්නැයි ගම්වැසියෝ ඌව පළාත් සභාවට ද දැනුම් දී ඇතත් ඊට නිසි ප්‍රතිචාරයක් ලැබී නැතැයි ද ඔවුහු පවසති.

ජී.එස්.තැලිගම - කිරිඳිවැල සමූහ

## කුකුළන් ගෙන ගිය ලොරිය අනතුරක



පුත්තලමේ සිට හංවැල්ල සමනබැද්ද පෞද්ගලික කුකුළු ගොවිපළකට කුකුළන් ගෙන යමින් සිටි ලොරියක් පූගොඩ පොලිස් වසමේ පැපිලියවල මංසංදිය ආසන්නයේ විදුලි රැහැන් කණුවක ගැටීමෙන් ලොරියට සිදුවූ අනතුර නිසා රියැදුරු ඇතුළු තිදෙනා ලොරිය තුළ සිරවී සිට ඇත.

එම කඳුගැටය නඟින අවස්ථාවේ එම ලොරිය ලිස්සා පසු පසට ගොස් මාර්ගය ආසන්නයේ තිබූ ට්‍රාන්ස්පෝමරය සහිත විදුලි රැහැන් කණුවේ ලොරියේ ඉදිරිපස කොටස ගැටීමෙන් රියැදුරු ඇතුළු තිදෙනා ලොරිය තුළ හිරවී ඇත. එම අවස්ථාවේ ඇති වූ ශබ්දය ඇසීමෙන් ගම්වාසීන් එම ස්ථානයට පැමිණ රියැදුරු සහ එක් අයකු ඉදිරිපස වීදුරුව බිඳ දිවි බේරාගෙන තිබූ නමුත් තවත් එක් අයෙක් බේරා ගැනීමට තිබූ අපහසුතාව නිසා 119 අමතා, ගිලන්රථ සේවාවද ලබාගෙන පූගොඩ පොලීසියත්, ලංකා විදුලිබල මණ්ඩලයත් එක්ව විදුලි රැහැන් මාර්ගය විසන්ධි කර එම හිරවී සිටි පුද්ගලයා බේරා ගෙන ඇත. අනතුරුව තිදෙනාම වතුපිටිවල රජයේ රෝහලට ඇතුළත් කර ඇත. මේ තිදෙනා පැපිලියවල ප්‍රදේශයේම පදිංචි අය බව හදුනාගෙන ඇත. පූගොඩ පොලිසියේ රථවාහන අංශයේ උප පොලිස් පරීක්ෂක අත්තනායක, පො.කො.55554 සංජීව යන නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ කරගෙන යති.

පී.අයි.ආර්. ගරුසිංහ වැල්ලවාය විශේෂ

## හොරෙන් පස් ඇද්ද ටිපර් රථ තුනක් අත්අඩංගුවට

දඹගල්ල පොලිස් බල ප්‍රදේශයට අයත් කොල්ලදෙණිය පාසල ඉදිරිපිටදී බලපත්‍ර නොමැතිව පස් ප්‍රවාහනය කරමින් තිබු පස් ටිපර් රථ තුනක් අත්අඩංගුවට ගැනීමට මොනරාගල විෂ මත්ද්‍රව්‍ය වැටලීම් ඒකකයේ නිලධාරිහු පිරිසක් සමත් වුහ. මේ පස් ටිපර් රථ තුන සමග සැකකරුවන්තිදෙනකු අත්අඩංගුවට ගෙන ඇති අතර ඔවුන් දඹගල්ල පොලිස් ස්ථානයට භාරදෙන ලදි. මේ වැටලීමට විෂ මත්ද්‍රව්‍ය ඒකකයේ උප පොලිස් පරීක්ෂක ජයසුරිය, පොලිස් සැරයන් නිමල් (34380),දිසානායක(40705),පොලිස් කොස්තාපල් නිමල්(71782), කුමාර(74720), චමින්ද(69244), මුබාරක්(88489), සුගුනන්(8960) යන පිරිස විසින් සිදු කරන ලදි.

දයාරත්න බණ්ඩාර - කෑගල්ල දිස්ත්‍රික් සමූහ

## පොදු ළිදේ ජල මෝටරය සොරාගෙන

මාවනැල්ල නගරයේ පොදු ළිදේ සවිකර තිබු ජල මෝටරය සොරකම් කරගෙන ගියේ යැයි සැකපිට නගරයේ පළතුරු වෙළෙඳ සල් හිමියකු මාවනැල්ල පොලීසිය විසින් අත් අඩංගුවට ගෙන තිබේ.

දින කීහිපයක සිට මේ ජල මෝටරය අතුරුදන් වී ඇති බවට ප්‍රාදේශිය සභාවේ කාර්මික නිලධාරියා විසින් සභාපති වෙත දැන්වීමෙන් පසු පොලීසියට පැමිණිලි කර ඇත. පසුව පොලීසිය හා ප්‍රාදේශීය සභාවේ සේවකයන් විසින් සොයා බැලීමේදී අදාළ පලතුරු වෙළෙන්දා ගෙන ගොස් ඇති බවට සොයා ගෙන ඇත. ඒ අනුව අත්අඩංගුවට ගත් පලතුරු වෙළෙන්දා මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් ඉදිරිපත් කිරීමට නියමිතය.

ඇම්.පී චන්ද්‍රපාල - තංගල්ල විශේෂ

## මාගම්පුර අපි සංවිධානයේ ලේ දන්දීමේ වැඩසටහනින්...



මාගම්පුර අපි සංවිධානය මඟින් සංවිධාන කරනු ලැබු ලේ දන්දීමේ වැඩසටහනක් තංගල්ල ඇන්නපිටිය පුරාණ විහාරස්ථානයේදී පැවැත්වුණි.මාගම්පුර අපි සංවිධානයේ සාමාජික සාමාජිකාවෝ විශාල පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.එහිදී හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, වරාය ගුවන් සේවා රාජ්‍ය ඇමැති ඩී.වී. චානක මහතා ලේ පරිත්‍යාග කරන අයුරු.

බී.එම්.විජේසුරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

## යාන් ඔය ව්‍යාපෘතියේ වැලි කැණීමට යොදාගත් උපකරණ සොරාගෙන

හොරොව්පතාන වාහල්කඩ යාන් ඔය ජලාශ ව්‍යාපෘතියේ වැලි කැණීම සඳහා භාවිතා කිරීමෙන් පසුව අනාරක්ෂිතව ගබඩා කර තිබූ යන්ත්‍ර රැසක අමතර කොටස් ඇතුළු රුපියල් කෝටියක උපකරණ තොගයක් සොරා ගත් බවට සැක කෙරෙන සිවිල් ආරක්ෂක සෙබළකු සොරාගත් ලක්ෂ තුනකට අධික උපකරණ තොගයක් සමග අත්අඩංගුවට ගත්බව හොරොව්පතාන පොලීසිය පවසයි.

මෙසේ අත්අඩංගුවට ගත් සැකකාර සිවිල් ආරක්ෂක සෙබළා මාවතවැව කපුගොල්ලෑව ලිපිනයේ පදිංචි තිස්පස් හැවිරිදි අයකු වන අතර ඔහු කැබිතිගොල්ලෑව දිසා මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව රුපියල් ලක්ෂය බැගින් වු ශරිර ඇප දෙකක් මත මුදාහැර තිබුණි. යාන් ඔය ජලාශය ඉදි කෙරෙන සමයේ නීත්‍යනුකූලව එහි වැලි ගොඩ දැමීම සිදු කළ අතර නාරම්මල දෙකටන ප්‍රදේශයේ පදිංචි අයෙක් විසින් සිදු කළ පැමිණිල්ලකට අනුව සැකකාර සිවිල් ආරක්ෂක සෙබළා මෙසේ අත්අඩංගුවට ගෙන තිබේ.සැකකරු විසින් සොරකම සිදුකළේ ද යන්න පිළිබඳ පොලීසියට සැක මතුවී තිබෙන අතර පැමිණිල්ල සම්බන්ධයෙන්ද පොලීසියට සැක මතුවී තිබේ. කොන්ත්‍රාත්කරු විසින් සැකකාර සිවිල් ආරක්ෂක සෙබළාට අයත් ඉඩමක් මීට වසර දෙකකට පමණ පෙර කුලී පදනම මත ලබා ගෙන වැලි කියුබ් නවසීයක් ගොඩ දැමීම සඳහා භාවිතා කළ බැකෝ යන්ත්‍ර, වැලි සේදීමේ යන්ත්‍ර ඇතුළු යන්ත්‍රෝපකරණ රැසක් ගබඩා කර තිබී ඇති අතර සැකකාර සිවිල් ආරක්ෂක සෙබළා සහ වැලි කොන්ත්‍රාත්කරු කලක සිට හිතවතුන්ව සිට ඇති බව පොලීසිය සිදුකළ පරීක්ෂණවලදි අනාවරණය වී තිබේ.

වැලි ගබඩාවේ මුරකරු ලෙස සැකකරුගේ පියා යොදවා ඒ සඳහා වැටුපක් ගෙවා ඇති අතර වරින් වර ප්‍රදේශයට පැමිණි කොන්ත්‍රාත්කරු 2019 වසර වන විට වැලි තොගය විකුණා අවසන් කර ඇති බව පොලීසිය සිදුකළ පරීක්ෂණවලදි අනාවරණය වී තිබේ.

ගලේවෙල මධ්‍යම සමූහ

## හොරෙන් විදුලිය ගත්තාට දඩ

නීත්‍යනුකූලව විදුලි රැහැනක් ලබා දී තිබියදී වෙනත් විදුලි රැහැන් මාර්ගයකට අනවසරයෙන් තත් සම්බන්ධ කර වංචනික ලෙස විදුලිය පරිභෝජනය කිරීමේ චෝදනාවට වරදකරු වූ පුද්ගලයන් දෙදෙනකුට රුපියල් 50,000/= බැගින් රුපියල් ලක්ෂයක දඩ මුදලක් ගෙවන ලෙසට දඹුල්ල මහේස්ත්‍රාත් කෝසල ඉලංගසිංහ මහතා විසින් නියෝග කරන ලදි.මීට අමතරව 2017 වසරේ සිට මෙසේ අනවසරයෙන් විදුලිය පරිභෝජනය කිරීම නිසා ලංකා විදුලිබල මණ්ඩලයට සිදුකළ අලාභය වෙනුවෙන් රුපියල් 317,100.75/=ක මුදලක් ගෙවීමටද මහේස්ත්‍රාත්වරයා ඔවුන්ට නියම කළේය.ලංකා විදුලිබල මණ්ඩලයේ දඹුල්ල විදුලි ඉංජිනේරු කාර්යාලයේ විමර්ශන නිලධාරී බී.එම්.ප්‍රියන්ත, කාර්මික ශිල්පී ඊ.ඩී.සී.ප්‍රසන්න යන මහත්වරුන් මේ වැටලීම සිදුකළ අතර ගලේවෙල පොලිස් ස්ථානයේ කාන්තා පොලීස් සැරයන් 5559 සුමනාවතී මහත්මිය හා පො.කො.රි 11614 සිදත් මහතා එම නිලධාරීන්ට සහාය වූහ.

# තුර්කියේ ‘ෆෙටෝ’ ත්‍රස්තවාදී සංවිධානයත් මාත් අතර කිසිම සම්බන්ධයක් නෑ

## පාර්ලිමේන්තු මන්ත්‍රී කබීර් හෂීම්

## සියලු මුස්ලිම්වරු ඉස්ලාම් අන්තවාදියෝ නොවේ

**සුභාෂිණී සේනානායක**

ඉස්ලාම් අන්තවාදීන් ගැන කරුණු මම දෙවතාවක් කැබිනට් මණ්ඩලයට කිව්වා. තදින් ක්‍රියා කරන්න කියා ඉල්ලුවා. මගේ ලේකම්වරයාට එල්ල කළ වෙඩි ප්‍රහාරය ගැනත් මට ඇති ජීවිත තර්ජන ගැනත් කියා මට ආරක්ෂාව දෙන්න කියලා ඉල්ලුවා. ඒ අවස්ථාවේ හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා ආරක්ෂක මණ්ඩලයට පැමිණ කරුණු කියන්න අවස්ථාවක් දෙන්නම් කිව්වාට ප්‍රහාරය තෙක් එම අවස්ථාවත් මට ආරක්ෂාවත් ලැබුනේ නැතැයි හිටපු එක්සත් ජාතික පක්ෂ මහලේකම් හිටපු සභාපති සහ සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී කබීර් හෂීම් මහතා පෙරේදා (15) පාස්කු කොමිසම හමුවේ කියා සිටියේය.

මම කිහිප අවස්ථාවකදීම මේ තර්ජන ගැන දැනුවත් කළා. මාවනැල්ලේ මගේ බල මණ්ඩලය රැස්වෙන අවස්ථාවක පළමු බුදු පිළිම හානි කිරීම අනත්වාදීන් විසින් සිදුකරනු ලැබූ බව කියා සිටියේය. තවද තමන් විසින් සිය නමක් මහා සංඝරත්නය උදෙසා දානමය පින්කමක් සහ රුපියල් මිලියන 10 බැගින් විහාරස්ථාන 76කට මුදල් ආධාර පිරිනැමීමක් සිදු කරන උත්සවයට පෙර දින රාත්‍රියේ දෙවන බුදු පිළිමය හානි කර තිබුණු බවත් අන්තවාදීන් මෙය සිදු කළ බවත් එහිදි හොදාකරවම අන්තවාදීන්ගේ වැඩක් බව තමන් දැනගත් බවත් කබීර් හෂීම් මහතා කියා සිටියේය.

“වනාවිල්ලුව පුහුණු කඳවුර සහ පුපුරන ද්‍රව්‍ය සොයා ගැනිමට සහාය වූ මගේ ලේකම්වරයාට සහරාන් ගේ කල්ලියේ අය වෙඩි තිබ්බා.මගෙන් සී.අයි.ඩී එක ඉල්ලුවා දෙමළ කතා කරන්න දන්න අයකු ඒ පළාත ගැන සොයා බලන්න දෙන්න කියලා මම තස්ලිම්ව දුන්නා.තස්ලිම් සමාජශීලි කවුරු සමගත් හොදින් ඉන්න කෙනෙක්. ඒ නිසා මම එයාව දුන්නා. තස්ලිම්ට වෙඩි තිබ්බාම කවුරුවත් ඔහු ගැන සොයා බැලුවේ නැහැ. මම තනියම වසර එක හමාරක් ඔහුව බලා ගත්තා. ඔහුව වරක් රෝහලෙන් පවා එළියට දැම්මා. මම පුදුම වෙහෙසක් වෙලා ඔහුව බලා ගත්තා ස්වාමිනි” යැයිද ඒ මහතා කියා සිටියේය.

එමෙන්ම අන්තවාදීන් සම්බන්ධයෙන් තමන් කැබිනට් මණ්ඩලය දෙවතාවක් තදින් දැනුවත් කළ බව කියා සිටි ඒ මහතා ත්‍රස්ත සංවිධානයක් වන ෆෙටෝ සංවිධානය සමග කිසිදු සබඳතාවක් නැති බවත් කවුරුත් හෝ එලෙස යෝජනා කරනවා නම් එය සම්පූර්ණයෙන්ම අසත්‍යයක් බවත් කියා සිටියේය.

සියලුම මුස්ලිම්වරුන් අන්තවාදීන් නොවන බව කියා සිටි ඒ මහතා තමන් ඉස්ලාම් ධර්මය පිළිපදින ශ්‍රී ලාංකිකයකු බවත් තමන්ට සිංහල බෞද්ධයන් සියයට 85ක් ඡන්දය ලබා දෙද්දී සියයට 5.5ක මුස්ලිම් ඡන්ද ලැබුණු බවත් කොමිසම හමුවේ කියා සිටියේය.

එමෙන්ම අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පසුව හිටපු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මහතාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් වූ බව කියා සිටි පසු මුස්ලිම් මන්ත්‍රිවරුන් ආණ්ඩුවෙන් ඉල්ලා අස්වූයේ ආණ්ඩුව ආරක්ෂා කිරීමට මිස රිෂාඩ් බදියුදීන් මහතා ආරක්ෂා කිරීමට නොවන බව ද ඒ මහතා කියා සිටියේය.

“රිෂාඩ් බදියුදීන් මහතාට එරෙහිව ඉදිරිපත් වු එම විශ්වාස භංග යෝජනාව පැවැති ආණ්ඩුවට විශාල බලපෑමක් එල්ල කළ බව මම දැන ගත්තා. එක්සත් ජාතික පක්ෂයේ සභාපතිවරයා ලෙස කටයුතු කළ මට පක්ෂය නියෝජනය කරන සිංහල බෞද්ධ මන්ත්‍රිවරුන් පැමිණ පැවසුවේ විශ්වාස භංගය වේලාවෙ ආණ්ඩුව වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ නොකර ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටිමට සිදුවන බව දැනුම් දුන්නා. රිෂාඩ්ට පක්ෂව ඡන්දය දීලා ගමට යන්න බෑ කියලා ඔවුන් කිව්වා. මොකද ඒ වෙද්දී ඔවුන්ට තම ඡන්දායකයන්ගෙන් විශාල බලපෑමක් එල්ල වෙලා තිබුණෙ, ඡන්ද ප්‍රකාශ කරලා ගමට යන්න බැරි වෙයි කියලා අපෙ මන්ත්‍රිවරුන් කිව්වා. මම පක්ෂ සභාපති ලෙස එවකට අගමැති රනිල් වික්‍රමසිංහ මහතාට කිව්වා මේක දාලා තියෙන්නේ අපිව ආණ්ඩුවක් විදියට පරාජය කරන්න කියලා. ඉන්පසු මම රිෂාඩ් බදියුදීන් මහතා හමුවෙලා කතා කළා,ඔහුට ඇමැති ධූරයෙන් ඉවත් වෙන්න කිව්වම බෑ කිව්වා. ඒ අවස්ථාවේ රතන හාමුදුරුවෝ මාරාන්තික උපවාසයක් ආරම්භ කරලා තිබ්බා. මුස්ලිම් මැති ඇමතිවරුන්ට එරෙහිව විශාල ජනමතයක් ගොඩ නැගෙමින් තිබුණා. යැයි කියා සිටි ඒ මහතා හැමෝම තනතුරුවලින් ඉවත් වුණාම විශ්වාසය ගොඩ නැගෙයි කියලා හිතුවා. අපි ඉවත් නොවුණා නම් විපක්ෂය විශ්වාස භංගය ජය ගන්න තිබුණා.අප සමග රිෂාඩ් ඇමති ධූරයෙන් ඉල්ලා අස්වීම එක්ක විපක්ෂයට ඔවුන් ගෙනා විශ්වාසභංග යෝජනාව ඉවත් කරගන්න සිද්ධ වුණා.

මම ඒ මොහොතේ පක්ෂයෙ සභාපති,මට වගකීමක් තිබුණා ඡන්දයක් ආසන්නයේ පක්ෂය ආරක්ෂා කරන්න, මම ඒ වෙලාවේ ඉවත් වුණේ එක්සත් ජාතික පක්ෂය ගැන සහ රට ගැන සිතලා” යැයි කබීර් හෂීම් මහතා කියා සිටියේය.

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනිතිඥවරිය-** ඔබ සමස්ත ලංකා මුස්ලිම් ලීගේ සභාපතිවරයාද? එහි නිර්මාතෘවරුන් කවුද ?

**කබීර් හෂීම් මහතා-**

ඔව්. එහි නිර්මාතෘවරුන් වන්නේ ටීබී ජායා මහතා. කලීල් මහතා වගේම මගේ පියාත් එහි සභාපතිවරයා වුණා. එක්සත් ජාතික පක්ෂය හදන විට සිංහල මහා සභාව, දෙමළ කොංග්‍රසය වගේම මුස්ලිම් ලීගයත් එක් වුණා. එය එක්සත් ජාතික පක්ෂයට අනුබද්ධිත සංවිධානයක් ලෙස ක්‍රියාත්මක වුණා.පසුගිය වසර 10-15 තුළ එය ක්‍රියාත්මක මට්ටමේ නැහැ.නමට පමණයි එහි ක්‍රියාකාරිත්වය තිබුනේ.

**රජයේ ජ්‍යේෂ්ඨ අධිනිතිඥවරිය-** තවුහිද් ජමාත් සංවිධානය ඇතුළු අන්තවාදී සංවිධාන මාවනැල්ලේ ක්‍රියාත්මක වුණා නේද මදුසා පාසල් ස ඔවුන්ගේ පල්ලි තිබුණා නේද ඔබ මේවා ගැන දැනුවත් වෙලා සිටියද,

**කබීර් හෂීම් මහතා-** මම දේශපාලඥයෙක්. මම මගේ සාමාන්‍ය දැනුමෙන් දැනගත්තා ජමාතේ ඉස්ලාම් තවුහිද් ජමාත් යන කණ්ඩායම් සිටින බව. ඊට වැඩි යමක් මා දැනගෙන සිටියේ නැහැ. ඔවුන්ගේ කටයුතු හෝ ක්‍රියාකාරිත්වය මා දැන සිටියේ නැහැ. මදුසා පාසල් කියන්නේ දහම් පාසල්. මමත් පල්ලි වලට යනවා.මගේ ආගම අනුව පල්ලි වර්ගීකරණයක් කරන්නේ නැහැ.පාරේ යනවිට පල්ලියක් දැක්කම මම පල්ලියට ගිහින් වදිනවා.ඒ පල්ලිය ගැන මම සොයන්න යන්නේ නැහැ.

රජයේ ජ්‍යේෂ්ඨ අධිනිතිඥවරිය- ඔබ දන්නවාද ඔබේ ලේකම් තස්ලිම් මහතා ඇඳක රඳවා සාක්ෂි දීමට මෙම කකොමිසමට පැමිණි බව

**කබීර් හෂීම් මහතා-** ඔව්

## පාස්කු දා ප්‍රහාරය පිළිබඳ කරුණු සොයා බලන ජනාධිපති කොමිසම

**රජයේ ජ්‍යේෂ්ඨ අධිනිතිඥවරිය-** ඔබට ඊබ්‍රාහිම් මවුලවි හමු වී තිබෙනවාද? ඔහුගේ ළමයි දෙන්නා වනාතවිල්ලුව සිද්ධියට සම්බන්ධ බව දැන සිටියාද?. ඔහු ඔබට දුරකතනයෙන් කතා කළාද ?

**කබීර් හෂීම් මහතා-** ඔව් . ඔහුගේ දරුවන් දෙන්න සැඟව සිටින බවට මට ආරංචි වුණා මම මුස්ලිම් කණ්ඩායමක් යැව්වා. ඔවුන් ඉදිරිපත් කරන්න කියලා. මට ඔහු කතා කළේ නැහැ. ඔහු සොයන්න ගිය කණ්ඩායම මට විස්තර කිව්වා.

**රජයේ ජ්‍යේෂ්ඨ අධිනිතිඥවරිය-** 2018-12-29 දින ඊබ්‍රාහිම් මවුලවි පොලිසියට ඉදිරිපත් වෙන්න ගියාම ඔබ එය වැළැක්වූවා කියා බුද්ධි වාර්තාවක තිබෙනවා. ඔබ මොනවාද ඒ ගැන කියන්නේ

**කබීර් හෂීම් මහතා-**

මම එය ප්‍රතික්ෂේප කරනවා.සම්පූර්ණ බොරුවක්. ස්වාමින් වහන්සේලා සිංහල බෞද්ධ ප්‍රජාව කිව්වේ අර ළමයි දෙන්නට ඉදිරිපත් වෙන්න කියලයි. ඔහුව අත්අඩංගුවට ගත්තේ ප්‍රහාරයෙන් පසුව.

**කොමිසම-**

හජ්ජුල් අක්බර් අත්අඩංගුවට ගත්තාම ඔබ ආරක්ෂක ලේකම්වරයාට කතා කළා කියලා කිව්වා. එතකොට සිටියේ හේමසිරි ප්‍රනාන්දු මහතා නෙමෙයි නේද?.

**කබීර් හෂීම් මහතා-** මම රුවන් විජේවර්ධන මහතාට සහ හිටපු ලේකම්වරයෙකුට කතා කළා. ප්‍රහාරයට පසුවයි කතා කළේ. එවිට මට කිව්වා විමර්ශන යනවා කියලා.

රජයේ ජ්‍යේෂ්ඨ අධිනිතිඥවරිය- ස්වයංඝාතකයකු ලෙස ක්‍රියා කර තිබෙන කවර හෝ පුද්ගලයකුගෙන් ඔබට දුරකතන ඇමැතුමක් ලැබී තිබෙනවාද?

**කබීර් හෂීම් මහතා-** පසුගිය දෙසැම්බර් මස සීඅයිඩී යෙන් මට එන්න කියලා තිබුණා.හකීම් කියා පුද්ගලයෙක් බෝම්බ පිපිරෙන්න දින කිහිපයකට පෙර තත්පර 174ක් කතා කර තිබුණා කියලා ප්‍රශ්න කළා. හරියට කවුද කතා කළේ කියලා මතකයක් නැහැ. ඔහු කියා තිබුණා පාරක් හදන්න කතා කළා කියලා. ඇමැතිවරයකු වූ මට විවිධ පුද්ගලයන් කතා කළා.

**රජයේ ජ්‍යේෂ්ඨ අධිනිතිඥවරිය-** අන්තාවදය උගන්වන මද්‍රසා පාසල් නියාමනය කරන්න ක්‍රමවේදයක් තිබෙනවාද?.

**කබීර් හෂීම් මහතා-** ඕනැම රටක ක්‍රම විධි තිබෙනවා.මුසිලිම් කටයුතු අමාත්‍යාංශය ආගමික කටයුතු අමාත්‍යාංශය හෝ ආගමික කටයුතු දෙපාර්තමේන්තුව ඒ රාකාරිය කළ යුතුයි කියන එකයි මගේ මතය වන්නේ.

**රජයේ ජ්‍යේෂ්ඨ අධිනිතිඥවරිය-** ඔබ අන්තවාදීන් සහ ගොඩ නැගෙමින් තිබෙන ඔවුන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ආණ්ඩුව දැනුවත් කළාද?.

**කබීර් හෂිම් මහතා**

මම කැබිනට් මණ්ඩලයට දෙවතාවක් ඉතා තදින් දැනුවත් කළා.

එම අවස්ථාවේදී හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා කිව්වේ මා කියූ කරුණු අවධානයට ගත් බවයි. මම මගේ ලේකම්වරායට සිදු වූ වෙඩි ප්‍රහාරය සහ මට ඇති ජීවිත තර්ජන ගැන කිව්වා. මට ආරක්ෂාව දෙන්න කියලා ඉල්ලුවා. මම කැබිනට් මණ්ඩලයේ දී දැනුවත් කළා මාගේ ආරක්ෂාව පවා වැඩි කරන්න කියලා. මොකද මාව ඉලක්ක කරගන්න බැරි නිසා තමයි අන්තවාදීන් මගෙ ලේකම්වරයා ඉලක්ක කරගෙන ප්‍රහාරයක් එල්ල කළේ . නමුත් මගෙ ආරක්ෂාව එහෙම වැඩි කිරිමක් සිද්ධ වුණෙ නැහැ. ආරක්ෂක මණ්ඩල රැස්වීමෙදි අන්තවාදය සම්බන්ධයෙන් සාකච්ඡා කරන අවස්ථාවක මෙම අන්තවාදී ක්‍රියාකාරකම් ගැන ඔබ දන්නා කරුණු පිළිබඳ ආරක්ෂක ප්‍රධානීන් දැනුවත් කිරීම සඳහා කැඳවීමක් සිදුකරන්නම් කියලා හිටපු ජනාධිපතිතුමා කිව්වා. ප්‍රහාරය තෙක් නිළ වශයෙන් මට කැඳවීමක් සිදු කළේ නෑ ස්වාමිනි.

**රජයේ ජ්‍යේෂ්ඨ අධිනිතිඥවරිය-** විදේශ සමාගම් වල කොටස් ඔබට තිබෙනවාද

**කබීර් හෂීම් මහතා-** මට ස්කිල්ස් ඉන්ටර්නැෂනල් ආයතනයේ කොටස් තිබෙනවා. නමුත් මම ඇමැතිවරයෙක් ලෙස වැඩ භාර ගත්තාම මගේ කොටස් මම මගේ බිරිඳට පැවරුවා. මම පසුගිය කාලය පුරාම මේ කිසිම දේකට සම්බන්ධ වෙලා නැහැ. මට ඔය කියන සමාගම් වල කොටස් නැහැ.

**රජයේ ජ්‍යෂ්ඨ අධිනීතිඥවරිය-** මෙම කොමිසම හමුවේ සාක්ෂි ලබා දුන් විදේශ කටයුතු අමාත්‍යාංශයට අනුයුක්ත නිලධාරිනියක් සඳහන් කර තිබෙනවා මෙරට යම් යම් ආයතන සහ සංවිධාන වලට තුර්කියේ ක්‍රියාත්මක FETO ත්‍රස්ත සංවිධානය සතු මුදල් යොදවා තිබෙන සංවිධාන සහ ආයතන තහනම් කිරීමට පියවර ගන්න කියලා තුර්කි තානාපති ඉල්ලීමක් කර ඇති බව. එහෙත් එවැනි සංවිධාන සහ ආයතන තහනම් කිරීම සඳහා ඔබ සහ තවත් මුස්ලිම් දේශපාලනඥයෙකු බලපෑම් එල්ල කර තිබෙනවා කියලා මේ කොමිසම හමුවේ සාක්ෂි ලබා දුන් පුද්ගලයන් සඳහන් කර තිබෙනවා, ඒ ගැන මොකද්ද ඔබතුමාට කියන්න තියෙන්නේ

**කබීර් හෂීම් මහතා-** තුර්කිය තුළ ක්‍රියාත්මක 'ෆෙටෝ' නම් ත්‍රස්තවාදී සංවිධාන සමඟ මට කිසිදු සබඳතාවයක් නැහැ. මට දේශපාලනික වශයෙන් පහර ගැසීම අරමුණු කරගනිමින් මෙවැනි අසත්‍ය ප්‍රචාර සිදු කර තිබුණා. තුර්කිය හා සම්බන්ධ කිසිදු ආයතනයක කොටස් හෝ ගනු දෙනු මා සතුව නැහැ.මීට පෙර අවස්ථාවක හිටපු අමාත්‍ය වසන්ත සේනානායක මහතාද මේ ආකාරයේම ප්‍රකාශයක් සිදු කළා. මේ චෝදනාව ඉතාම අපැහැදිළි චෝදනාවක්,මේ පරීක්ෂණවලට මම බලපෑම් කරලා තියෙන්නේ කොහොමද කියන එකවත් මම හරි හැටි තවම දන්නේ නැහැ, මට මේ තුළින් ලොකු අසාධාරණයක් වෙලා තිබෙනවා, ඒ ගැන මට කතා කරන්නවත් තැනක් හරියට තිබුණෙ නැහැ මැතිවරණය ඉලක්ක කරගෙන තමයි මේ ප්‍රකාශ සිදු කෙරුණේ. **මගේ මැතිවරණයටත් එය බලපෑවා.**

**රජයේ ජ්‍යේෂ්ඨ අධිනිතිඥවරිය-** පකිස්තානයට ඔබේ ආයතනය සම්බන්ධද?

**කබීර් හෂීම් මහතා-** පකිස්තානයටත් මේ සංවිධානය විසුරුණා.දැන් ඒවා ක්‍රියාත්මක නැහැ.

අනෙකුත් සාක්ෂිකරුවන් වෙනුවෙන් පෙනී සිටින නිතිඥවරුන්ගෙන් ප්‍රශ්න විමසීමට ඇද්දැයි කොමිසම විමසා සිටි අවස්ථාවේ නැහැ යැයි පිළිතුරු දීමෙන් අනතුරුව තමන්ට කිසිවක් කීමට ඇද්දැයි කබීර් හෂීම් මහතාගෙන් විමසා සිටියේය.

එවිට කබීර් හෂීම් මහතා මෙසේ අදහස් ප්‍රකාශ කළේය.

තුර්කි සිද්ධිය පිළිබඳව වැරදි චිත්‍රයක් ගියා. ෆෙටෝ සංවිධානය සමග මම ආයෝජනය කළා කියලා ප්‍රචාරය වුණා. මේක අමාත්‍යාංශයකින් කියලා තිබුණේ.දැන් වුනත් මගෙන් ප්‍රශ්න කරනවා නම් මට පිළිතුරු දෙන්න පුළුවන්. මගේ කිසිම සම්බන්ධයක් නැහැ. මම ඉස්ලාම් ධර්මය පිළිපදින ශ්‍රී ලාංකිකයෙක්. මම අවුරුදු විසි ගණනක් නියෝජනය කරන මගේ කොට්ඨාසයේ මට සිංහල ඡන්ද සියයට 85ක් ලැබෙනවා. මුස්ලිම් ඡන්ද ලැබෙන්නේ සියයට 5.5යි .මම නැවත වතාවක් පළමුවැනියා ලෙස ඡන්ද ලබා ගෙන තිබෙනවා.

මේ ඡන්ද බහුතරය මට ලබා දුන්නේ සිංහල බෞද්ධයන්. මගේ ලේකම් සී.අයි.ඩියට භාර දී මේ විමර්ශනයට උදව් කරන්න කිව්වා.ඒ ළමයට වෙඩි තිබ්බා සහරාන්ගේ කණ්ඩායමෙන්. ඒ ළමයගේ ෆොටෝ එකක් කවුරු හරි ගත්තා ඒක ගත්තේ සීඅයි.ඩියද කියන්න මම දන්නේ නැහැ. ඒ ෆෝටෝ එක අන්තර්ජාලයේ ගියාමයි ඒ ළමයව අත්අඩංගුවට ගත්තේ. නැත්නම් කුවුරුවත් දන්නේ නැහැ ඒ ළමයි ගිය බව.ඔහු වෙඩි වැදි වසර එක හමාරක් ලෙඩ ඇදේ හිටියා. මම වියදම් කළේ. කුවුරුවත් තඹ සතයක්වත් දුන්නේ නැහැ. රෝහලෙන් පවා පිටතට දැම්මා.මම රාගම පුනරුත්ථාපන රෝහලට ගෙනාවා. එහි ප්‍රතිකාර අවසන් වුණාම දිගන රෝහලට ගෙනිච්චා. මම වැදලා වගේ රෝහලේ තබා ගත්තේ.සියලුම මුස්ලිම්වරුන් අනත්වාදීන් නෙවෙයි.මේක කොමිසම දැන ගන්න ඕන. තස්ලිම්ට වෙඩි තිබ්බේ මට වෙඩි තියන විදිහට. මට යම් ආරක්ෂාවක් තිබූ නිසා ඒක කරගන්න බැරි වුණා.අදත් මට අනතුරක් තිබෙනවා.මගේ ආගම දකුණු අතින් දෙන දේ වම් අතින් ගන්න හොඳ නැහැ කියලයි තියෙනනේ. නැව්ගල ආරාමය හැදුවේ මගේ මවුපියන්ගේ අක්කර හයක. කරන්ගල පන්සල, ගල්ගම්ව විදුහල, අස්මඩල සුසාන භූමිය සමූපකාරය හදලා තියෙන්නේ මගේ මුවුපියන්ගේ ඉඩම්වල. සාමසර කනදේ අවතැන් අයට නිවාස හදන්න මගේ අම්මගේ අක්කර 28ක් දුන්නා. වෙසක් කලාප කළා. පන්සල් 105කට ලක්ෂ ගණනින් මුදල් ආධාර දුන්නා. මම ඉගෙන ගත්තේ මහනුවර ත්‍රිත්ව විදුහලේ. අපි කවුරුත් එකයි අන්තවාදීන් සුළුතරයක් ඉන්නේ. ඒක පාඩමක් විදියට ගන්න ඕන. සහරාන් ඉස්ලාම් භක්තිකයෙක් නෙවෙයි කියලා පාර්ලිමේන්තුවේ අවස්ථා ගණනාවක මම කියලා තිබෙනවා ඔවුන්ට විරුද්ධව මම ජනාධිපතිතුමාව අගමැතිතුමාව ආණ්ඩුව දැනුවත් කළා. ශ්‍රී ලංකිකයකු ලෙස ජීවිත පරදුවට තබා මම තීරණ ගත්තා.ඒ වෙනුවෙන් මම ඉදිරියටත් සටන් කරන බව මේ ගරු කොමිසම හමුවේ කියනවා.

**කොමිසම -**

2015 අංක 04 දරන සාක්ෂිකරුවන් සහ වින්දිතයන්ට පහසුකම් සහ ආරක්ෂාව සපයා දීමේ පනතේ 25-4 වගන්තියට ප්‍රකාරව සාක්ෂිකරුට පහසුකම් ලබා දෙන ලෙස සාක්ෂිකරුවන් සහ වින්දිතයන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරියට නියෝග කරනවා.

පළමු වරට සාක්ෂි දුන් කබීර් හෂීම් යන සාක්ෂිකරු මුදා හරින්න යැයි කොමිසමේ සභාපතිවරයා නියෝග කර සිටියේය.


**1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29D වගන්තිය යටතේ විකුණුම් දැන්වීම**

S&S SINCE 1892

**මහජන බැංකුව - ගොඩකවෙල ශාඛාව**

PEOPLE'S BANK

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලන් කෝරළේ, මැද පත්තුවේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොඩකවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩකවෙල ග්‍රාමසේවක වසමේ ගොඩකවෙල ගමේ පිහිටි "වැව්හේන වත්ත හෙවත් වැවේ වත්ත" නමැති අවසරලත් මානක එම්.එම්. ඩී.එස්. ශාන්ත මහතා විසින් 2016.09.01 දින මැන සම්පාදිත අංක 6754 පිඹුරේ සඳහන් උතුරට – පාරද, නැගෙනහිරට එස්.පී. ඒකනායකට අයිති ඉඩමද, දකුණට රජයේ ඉඩමද, බස්නාහිරට පිඹුරු අංක 1817 හි කැබලි අංක 1 (පාර) සහ කැබලි අංක 4 ද යන මායිම් තුළ පිහිටි ඉඩම

**ඉඩමේ ප්‍රමාණය : අක්. 00 රූඩ් 01 පර්. 20 (රූඩ් එකයි පර්චස් විස්සයි)**

එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේත් සමග

**මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින්**

**2020 නොවැම්බර් මස 03 වෙනි අඟහරුවාදා දින**

**පෙ. ව. 11.00 ට මහජන බැංකුව**

**ගොඩකවෙල ශාඛා පරිශ්‍රයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.**

**මෙම වෙන්දේසිය COVID 19 ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලවම පවත්වනු ලැබේ.**

**වෙන්දේසිය පිළිබඳ දැන්වීම**

කරුණාකර 2019.02.01 වන දින රජයේ ගැසට් පත්‍රයද, දිනමිණ, ඩේලි නිවුස් සහ තිනකරන් පුවත්පත්ද බලන්න.

**දේපළ වෙත පිවිසීම**

ගොඩකවෙල නගරය මැදින් ඇති පල්ලෙගම පාරේ (බලංගොඩ පාරේ) මීටර් 450 ක් පමණ යනවිට පාරේ දකුණු පස හෝටල් පරිශ්‍රය සහිත දේපළ පිහිටා ඇත.

**ගෙවීමේ ක්‍රමය**

මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

01. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්)
02. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාර) සහ කොමිස් මුදල මත අදාළ බදු
04. ලිපිකරුගේ හා නිවේදකගේ ගාස්තුව රු. 1,500.00
05. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු සහ නොතාරිස් ගාස්තු

ගැනුම් මිලෙන් 90% (සියයට අනූව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත මහජන බැංකුව ගොඩකවෙල ශාඛාවේ කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන : 045-2240570, 047-2240170

ඉහත සඳහන් කළ පරිදි දින 30 ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුවේ.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් අදාළ විස්තර ප්‍රාදේශීය කළමනාකරු, මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, නව නගරය, රත්නපුර ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන : 045-2223084, 045-2232108

**"ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ / අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"**

**ෂොක්මන් සහ සමරවික්‍රම**

*එකම රටක්. එකම වෙන්දේසිකරුවෙක්.*
*වසර 128 ක සේවා විශිෂ්ටත්වය සමගින්*

**ප්‍රධාන කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය**
**24, ටොරින්ටන් පාර, මහනුවර.**
**දුරකථන : 081-2227593**
**දුරකථන /ෆැක්ස් : 081-2224371**
**ඊමේල් : schokmankandy@sltnet.lk**

125 Years

**නගර කාර්යාලය**
**6A, ෆෙයාර් ෆීල්ඩ් ගාර්ඩන්ස්, කොළඹ 8.**
**දුරකථන : 011-2671467, 011-2671468**
**දුරකථන/ෆැක්ස් : 011-2671469**
**ඊමේල් : schokman@samera1892.com**

**වෙබ් අඩවිය : www.sandslanka.com**



# ප්‍රසම්පාදන දැන්වීම

## ශික්ෂණ රෝහල - කුරුණෑගල

මෙම රෝහලේ අධ්‍යක්ෂ කාර්යාලය දීර්ඝ කිරීම – ඉතිරි වැඩ නිම කිරීම කොන්ත්‍රාත්තුව ඉටු කිරීම සඳහා ICTAD / CIDA වලංගු සාමාජිකත්වය දරන ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගෙන් 2020.11.04 දින පෙ.ව. 10.00 දක්වා ටෙන්ඩර් කැඳවනු ලබන අතර, ටෙන්ඩර් විවෘතය එදින එම වේලාවට අධ්‍යක්ෂ නිල කාර්යාලයේදී සිදු කෙරේ. එම අවස්ථාවට ඔබට හෝ ඔබගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැක.

2020.11.02 දින ප.ව. 3.00 දක්වා සතියේ රාජකාරී දිනයන්හිදී නොමිලේ ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි අතර, එදින එම වේලාව තෙක් පහත ලිපි ලේඛන ඉදිරිපත් කර ලංසු ලේඛන ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැක.

1. **අධ්‍යක්ෂ, ශික්ෂණ රෝහල, කුරුණෑගල වෙත ඉදිරිපත් කරන ලිඛිත අයදුම්පතක්**
2. **එක් වැඩ විෂයයක් වෙනුවෙන් ආපසු නොගෙවන රු. 2500 ක මුදලක් රෝහල් මුදල් අයකැමි වෙත ගෙවා ලබාගත් රිසිට්පත**
3. **සහතික කරන ලද පිටපතක් සමග ICTAD / CIDA ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත**

ටෙන්ඩර්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි වැඩ විෂයෙහි නම පැහැදිලිව සටහන් කරන ලද ඔබගේ ටෙන්ඩර්පත **සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, ශික්ෂණ රෝහල, කුරුණෑගල** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලීමට හැකි අතර, මේ පිළිබඳ වැඩි විස්තර අවශ්‍ය වෙතොත් 037-2233906 මගින් අංක 2800 අමතා ලබාගත හැක.

**සභාපති,**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,**
**ශික්ෂණ රෝහල, කුරුණෑගල.**



# දැන්වීමයි

2007 අංක 07 දරන සංශෝධිත සමාගම් පනතේ 34 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීමට අපේක්ෂිතය.

සමාගමේ නාමය :
**නුවන්දිකා සිරිවර්ධන පදනම**

ලියාපදිංචි කාර්යාල ලිපිනය :
**අංක 1046/3/බී, පොතුආරාව පාර, මාලබේ.**


අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් :
**ග්‍රෙගරීස් පාට්නර්ස්**
**සමාගම් ලේකම්වරු**
**53/3, ග්‍රෙගරී පාර, කොළඹ 07.**

සමාගමේ යෝජිත අරමුණු සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අනුමත කොට ඇති අතර, ඒවා පහත සඳහන් පරිදි වේ :

- අඩු ආදායම්ලාභී පිළිකා රෝගීන් සඳහා ඖෂධ හා අනෙකුත් වෛද්‍ය උපකරණ ලබාදීම.
- අඩු ආදායම්ලාභී පිළිකා රෝගීන්ගේ පවුල් සඳහා, එම පවුල්වල ළමුන් සඳහා අවශ්‍ය සෞඛ්‍යාරක්ෂණය, අධ්‍යාපනය හා අනෙකුත් අවශ්‍යතා ලබාදීමද ඇතුළත්ව, ඔවුන්ගේ දෛනික නඩත්තු කටයුතු / අවශ්‍යතා සඳහා ආධාර ලබාදීම.
- පිළිකා රෝගයෙන් පෙළෙන අයගේ පවුලේ සාමාජිකයන් සඳහා උපදේශන සේවා ලබාදීම.
- පිළිකා රෝගයෙන් පෙළෙන අයවලුන් කෙරෙහි අසාධාරණ වෙනස්කම් සිදුකිරීම් වැළැක්වීම සඳහා මාධ්‍ය වේදිකා ඔස්සේ දැනුවත් කිරීම් වැඩසටහන් හා සම්මන්ත්‍රණ පැවැත්වීම.
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා දිරිගැන්වීම උදෙසා දේශපාලනික න්‍යාය පත්‍රවලින් තොරව පෘථුල වූ ජාතික වැඩසටහනක් සංවර්ධනය කිරීම.
- ආගමික ආචාර විධි රකින සමාජයක් උදෙසා ආගමික වටිනාකම් හා දැනුම සම්බන්ධයෙන් සමාජය බලගැන්වීම.
- අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්හට ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සංවර්ධනය උදෙසා අවශ්‍ය ආධාර හා පරිත්‍යාග ලබාදීම.
- රටෙහි ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව වෙත වෛද්‍ය ප්‍රතිකාර හා උපදෙස් ලබාදීම අරමුණු කොටගත් වෛද්‍ය සායන සඳහා අනුග්‍රහය දැක්වීම.
- රටෙහි ග්‍රාමීය පෙදෙස්වල ආගමික ස්ථාන හා වන්දනීය ස්ථාන සංවර්ධනය සඳහා ආධාර ලබාදීම.
- වැඩිහිටි නිවාසවල වෙසෙන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්හට හා අනාථ නිවාසවල වෙසෙන ළමයින්ගේ සුබසිද්ධිය සඳහා ආධාර ලබාදීම.
- අවශ්‍ය ආධාර ලබාදීම තුළින් පරිසරයෙහි පවත්වා ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා දැනුවත් කිරීම මතු කර ගැනීම.










මොනරුන්ගෙන් ආරක්ෂා වන ලෙස සකසාගත් වගාවක් සහ කොරටුවක්

# වහාම විසඳුමක් සෙවිය යුතු

# පිටබැද්දර මොනර කරදර



මොනරුන් නිසා හානි වූ කුඹුරක්

"ශ්‍රේෂ්ඨ රජතුමනි, නුඹ ගැබ සියොතුන්ට සහ මිහිමත සිවුපාවුන්ට ඔබට මෙන්ම මේ දේශයේ ඕනෑම ඉසව්වක ජීවත් වීමට සහ ඇවිදීමට සමාන අයිතියක් ඇත. මිනිසුන්ට අයත් භූමිය අනෙක් සියලු සතුන්ට ද අයත්ය. ඔබ ඒවායේ ආරක්ෂකයා පමණි"

මහින්ද මහ රහතන් වහන්සේ විසින් දේවානම්පියතිස්ස රජතුමාට වදාළේ මෙම පාඩමයි.

අපේ මුතුන්මිත්තන් ලෝකය මිනිසුන්ගේ වාසයට පමණක් නොවන බැවු හොඳින් වටහාගෙන සිටියත්, එය අපේ නාගරීකරණය කේන්ද්‍ර කරගත් තාක්ෂණය අවධාරණය කරන සංස්කෘතිය විසින් වේදනාත්මක වුව ද නැවත ඉගෙන ගත යුතු තත්ත්වයකට පත්ව ඇත. මීට සියවස් කීපයකට ඉහත මිනිසුන් හා සත්ත්වයන් අතර පැවතියේ ගැටලු කිහිපයකි. එහෙත් වර්තමානය වන විට මිනිසා හා සතුන් අතර ගැටුම ලෝකයේ විසඳුම් සෙවිය යුතු තේමාවක් බවට පත්ව ඇත.

මිනිස් වන සත්ත්ව ගැටුම මෙහි දී විශේෂ වේ. ඒ යටතේ ලෝකයේ මිනිස් සර්ප ගැටුම, මිනිස් වෘක ගැටුම, මිනිස් කිඹුල් ගැටුම, මිනිස් හිම වලස් ගැටුම, මිනිස් අලි ගැටුම, මිනිස් රිළා ගැටුම, මිනිස් මොනර ගැටුම වැනි තේමාවන් පදනම් කරගත් ගැටුම් නිර්මාණය වී ඇත.

කෙසේ වෙතත් එකිනෙකට වෙනස් ජීවීන් විශේෂ දෙකක වාසභූමි ඡේදනය වන තැන ගැටුමක් ඇති වේ. අපේ රටේ වියළි කලාපය ආශ්‍රිතව වර්තමානය වන විට බහුලව අසන්නට ලැබෙන අලි මිනිස් ගැටුම එයට ආසන්නතම උදාහරණය ලෙස දැක්විය හැකිය.

ඊටත් වඩා බරපතළ ව්‍යසනයක් ලෙස වර්ධනය වී පවතින මිනිස් මොනර ගැටුම, අලි මිනිස් ගැටුම තරමටම සමීප නොවන්නේ ශ්‍රී ලංකාවේ මොනරුන් හෝ මොනර හානිය පිළිබඳව සංගණනයක් හෝ සමීක්ෂණයක් මෙතෙක් සිදු වී නැති හෙයිනි.

අතීතයේ වියළි කලාපයේ වනපෙත් ළඳු කැළෑ ආශ්‍රිතව පමණක් දක්නට ලැබුණු මොනර ගහනයෙන් කොටසක් දැන් මෙරට ග්‍රාමීය ප්‍රදේශවල සුලභව දැක ගත හැකි අතර නොසිතූ ලෙස හීලෑ වූ මෙම සත්ත්වයා නාගරික ප්‍රදේශ තුළ දක්නට ලැබීම තවදුරටත් දුලබ දසුනක් නොවේ.

මොනරා අපේ ගම්බිම්වලට හෝ නගරයට හෝ පැමිණීම ගැටලුවක් නොවේ. ඒහෙත් ඔවුන් තම වාසභූමි සඳහා ග්‍රාමීය කෘෂිකාර්මික බිම්, විශේෂයෙන් වී වගාබිම් සහ කොරටු වගාබිම් තෝරා ගැනීම උග්‍ර ගැටලුවක් බවට පත්ව ඇත. එබැවින් බොහෝ කෘෂිකාර්මික ප්‍රදේශවල වෙසෙන ජනතාවගේ දුක් අඳෝනාව වනුයේ මෙනරුන් නිසා තම වගාබිම් තවදුරටත් පවත්වාගෙන යෑමේ දුෂ්කරතාවක් ද පවතින බවය. ඇතැම් ගොවීන් මොනර හානිය ඉවසනු නොහී තම කුඹුරු බිම් පුරන්වීමට ඉඩ හැර බලා සිටින තත්ත්වයක් උදා වී ඇත.

අප විසින් මාතර පිටබැද්දර ප්‍රදේශයේ සිදු කළ නිරීක්ෂණ චාරිකාවේදී පෙනීගියේ එම ප්‍රදේශවාසීන් ද මොනර උවදුර නිසා අධික හෙම්බත් තත්ත්වයකට පත්ව ඇති බවයි.

ප්‍රදේශවාසීන් සමඟ සිදු කළ අදහස් විමසුමේදී ඔවුන් පැවසුවේ රතු මුකුණුවැන්න, බණ්ඩක්කා, කරවිල හැර අනෙක් සියලුම කොරටු බෝග, ගෙවතු වගාවන් හා කුඹුරු බිම්වලට මොනරුන් හානි කරන බවය.

263 D කෘෂිකර්ම පර්යේෂණ නිලධාරි අජිත් තුෂාර මහතා ප්‍රදේශයේ පවතින මොනර හානිය පිළිබඳව අප හා විස්තර කළේ මෙලෙසිනි,

"ඉස්සර අපි පුංචි කාලෙ මේ පැත්තෙ එක මොනරෙක්වත් සිටියේ නැහැ. අහම්බෙන් හරි මොනරෙක් දකින්න නම් හම්බන්තොට සීමාවවත් පනින්න ඕනි.දැන් මෙහෙ මොනරෙක් දකින්න නැති මොහොතක් නෑ. මං හිතන්නෙ කටුපොල් වගාවත් එක්ක තමයි මොනරුන්ගේ බෝවීම වැඩි වුණේ. ඉස්සර මෙහෙ කටුපොල් තිබ්බෙ නෑ. රබර් ඉඩම් ගලෝලා 1996 දී විතර කටුපොල් වගාව දැම්මා. එම බිම් ආශ්‍රිතව සර්පයො බෙහෙවින් බෝ වීම සිදු වුණා. සර්පයාට විලෝපිකයෙක් විදියට තමයි මොනරා ගෙනත් දැම්මෙ. මොනරට වේගෙන් බෝවෙන්න හොඳ පරිසරයක් මෙහෙ තියෙනවා. මොකද මොනරට විලෝපිකයෙක් නෑ. ඉස්සර නම් නරි, ඌරො, කොළ දිවියො වැනි සත්තු මොනරු දඩයම් කළා. ඒත් වන ලැහැබ් ජල පෝෂක ප්‍රදේශ අඩු වන්නට අඩු වන්නට නරි වඳ වෙලා ගියා. නිල්වලා ගඟ උතුරා ඇති වෙන මහා ගංවතුර නිසා මේ පැත්තෙ ඌරොත් අඩුයි. ඒ නිසා මොනරු නිදැල්ලේ බෝ වෙනවා. සෙබඩ එක සැරේකට බිත්තර 3-5 අතර ගානක් දානවා. ඒ බිත්තර හැම එකකින්ම පැටවු බිහිවෙනවා. පැටවුන් ද කුඩා කාලයේ දී මියයන ප්‍රවනතාවය අඩු වන්නේ සෙබඩ නිතරම උන් ආරක්ෂා කරන නිසයි. මම හිතන්නෙ මොනරුන්ගෙ බෝ වීම වැඩි වීමට ප්‍රධානම ඒ හේතුවයි."

කෙසේ නමුත් ලංකාවේ වන සතුන් නිසා කෘෂි බෝගවලට සිදු වන හානිය සියයට 40කි. එනම් අපේ රටේ නිෂ්පාදනය කරන ආහාරවලින් 1/3ක් පමණ විනාශ කරනු ලබයි. මිනිසුන්ගේ පරිභෝජනය සඳහා තිබෙන ආහාර සතුන් විසින් විනාශ කරනු ලබන ලෝකයේ එකම රට ශ්‍රී ලංකාවයි. වෙනත් රටවල ආහාර විනාශ කරන සතුන්ව මර්දනය කළත් අපේ රටේ සංස්කෘතිකමය හා ආගමික වශයෙන් පවතින විශ්වාස මත විවිධ සත්ත්වයින් පූජනීයත්වයෙන් සලකන බැවින් ඔවුන් විනාශ කිරීමට මිනිස්සු මැළි වෙති.

මොනරුන් එවන් ඓතිහාසික පුරාවෘත්තයක් හිමි සත්ත්වයකු බැවින් උගෙන් කෙතරම් හානියක් සිදු වුවත් ඝාතනය කිරීමට බියවන්නේ බොහෝ දෙනෙක් කතරගම දෙවියන් අදහන නිසාත්, උන්වහන්සේට භාරහාර වී සිටින නිසාත්ය. එබැවින් කුඹුරට, ගෙවත්තට පැමිණෙන මොනරු පලවා හරින්නේ සිරුරේ නොවදින ලෙස සිදුවන ගල් ප්‍රහාරවලින්, කෑ කෝ ගැසීමෙන්, රතිඤ්ඤා හෝ අහස් කූරු දැමීමෙන්, කුඹුරේ ටකයක් බැඳීමෙන් ආදී ප්‍රාථමික ක්‍රමවේදයන් මඟිනි. එහෙත් ගොවිතැනින් එදා වේල සරි කරගන්නා ඇතැම් ප්‍රදේශවාසීන්ට රතිඤ්ඤා හෝ අහස් කූරු සඳහා නිතිපතා වියදම් කිරීමට තරම් මුදලක් නොවන නිසාත්, ඔවුන්ගේ දුක් අඳෝනාවන් නිසාත්, ග්‍රාමීය වශයෙන් සිටින කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීන්ගේ උපදෙස් පරිදි මොනරුන් නිතර ගැවසෙන ප්‍රදේශවල ඇල්කොහොල් මිශ්‍ර කළ කඩල තැබීමත්, වායු රයිෆල් තුවක්කු භාවිත කිරීමටත්, කුඹුර පුරාවටම විවිධ උස මට්ටමින් යුත් උල් සිටුවීමටත් උපදෙස් ලබා දී ඇත.

එහෙත් එය සාර්ථක ක්‍රමවේදයක් නොවේ. විශේෂයෙන් ආරක්ෂිත වනජීවී සත්ත්වයකු වන මොනරා මැරීම සඳහා උපදෙස් දීම රජය මඟින් අනියමින් නීති විරෝධී ක්‍රියාවකට පෙලඹවීම් කිරීමක් වන නමුදු අවස්ථානුකූලව ඔවුන්ට ද වෙන කළ යුතු යමක් නොමැතිවනවාට සැක නැත. ඊට හේතුව වගකිව යුතු ආයතන මඟින් නිරවද්‍ය වූ විද්‍යානුකූල විසඳුමක් ලබා නොදීමයි.

මොනරු මස් පිණිස දඩයම් නොකරන්නේමත් නොවේ. ඇතැම් ආගමික විශ්වාස නොතකන්නන් මොනර මස් කලුකුම් මස් ලෙස හෝ දඩ මස් ලෙස විකුණනු ලබන අතර, මෙම තර්ජනයට බොහෝ විට ලක්වනු ලබන්නේ සෙබඩයි. එයට හේතුව මොනරා විනා සෙබඩ කතරගම දෙවියන්ගේ වාහනය නොවන නිසාත්, සෙබඩගේ මාංස ඉතා තෙල් අධික ආහාරයක් වන නිසාත් බැව් ප්‍රදේශවාසීහු පවසති. එහෙත් එවැනි ක්‍රියා සිදු වන්නේ ඉතා ස්වල්ප වශයෙනි.

පිටබැද්දර, කදුරුවාන, මොරවක්කෝරළේ, තේ නිපදවන්නන්ගේ සමුපකාර සමිතියේ ඩබ්. එස්. සරත් වික්‍රමරත්න මහතා මොනරුන් නිසා තම කෘෂිභෝග සඳහා සිදු වන හානිය පිළිබඳ අප හා විස්තර කළේ මෙලෙසිනි.

"සාමාන්‍යයෙන් මොනර රංචුවක මොනරු 20-25 ක් විතර ඉන්නවා. මොනරු අපේ වී කනවට වඩා උන්ගෙ හැසිරීමෙන් තමයි වගා විනාශ වෙන්නෙ."

ගොඩක්ම පිල් කලඹ නිසා, පිල් කලඹ කුඹුර දිගේ ඇදගෙන යෑම නිසාත්, ඉතා පුළුල් වපසරියකින් යුත් පාද නිසාත්, මොනරාගේ පිල් කලඹ විහිදුවා කරන රංගනය නිසාත් අපේ වගා විනාශ වෙනවා. එක සැරේකට මොනරු දෙතුන් දෙනෙක් කුඹුරට බැස්සත් කුඹුර විනාශයි. ගොයම් ටික කපලා වී ටික කමතෙ තියලා ඩිංගක් එහෙ මෙහෙ උනොත් රංචුවක් ඇවිල්ලා වී ගොඩ උඩ පුදුම කරදරයක් තමයි, ඒක අපේ සමහර ගොවි මහත්තුරු දැන් අවුරුදු 2-3 ඉඳන් කුඹුරු කරන්නෑ. පුරන් වෙන්න ඇරලා තියෙන්නේ. මොනරා හරි ලොකු සතෙක්නෙ, ඌ අපේ ගෙවල්වල වහල උඩත් ඉන්නවා. මොනරා ඇවිත් වහන කොටයි ආයෙ ඉගිලෙන්න වීරිය ගන්නකොටයි උලුකැට බිමට වැටෙනවා, කැඩෙනවා. වැස්සට මුළු ගේම තෙමෙනවා."

263 සියඹලාගොඩ බටහිර කෘෂිකර්ම පර්යේෂණ නිලධාරී එන්. ඒ. ගුණවර්ධන මහතා මොනරුන් ගැන කියන්නේ මෙවන් කතාවකි.

"මේ පැත්තේ තේ, වී, කටුපොල්වලට අමතරව කුරුඳු වගාවත් සෑහෙන මට්ටමින් සිදු වෙනවා. මොනරා කුරුඳුවලටත් හානි කරනවා. විශේෂයෙන් කුරුඳු තවාන් බිම්වල ඇවිදීම නිසා කුඩා කුරුඳු පැළ සහිත භාජන පෙරළිලා ඒවාට හානි වෙනවා. ඒ වගේම කුරුඳු කියන්නෙ තනි කෙළින් හැදෙන්න ඕන ගහක්. එතකොට තමයි හොඳ අස්වැන්නක් ගන්න පුළුවන්. ඒත් කුරුඳු දල්ල කාපුවාම කුරුඳු ගහ කෙළින් හැදෙන්නෙ නෑ. රිකිලි දානවා. මිනිස්සු මොනරුන්ගෙ ජීවිතවලට හානි කරන්නෙ නෑ. ඒත් මේ පැත්තෙ කරන්ට් වයර්වල වැදිල මොනරු මැරෙනවා. ඒ නිසා අපට නිතර කරන්ට් එක යනවා. ඒ හැරෙන්න මොනරුන්ගෙ බෝ වීම වැළැක්වීමට නිශ්චිත ක්‍රමවේදයක් නෑ."

ඒ වගේම ලියුම්කරු හට ප්‍රදේශයේ සංචාරය සඳහා මඟපෙනවූ සහ සමීක්ෂණය සඳහා සහාය දැක් වූ ගොරකවල කෘෂිකර්ම පර්යේෂණ නිලධාරී එම්.පී. නිහාල් ප්‍රියන්ත මහතා පවසන අදහසයි මේ.

මොනරා කියන්නේ ඉතා දැඩි සංවේදී ඉන්ද්‍රියන් සහිත සත්ත්වයෙක්. ගසක පොත්තක් බිමට වැටෙන ශබ්දය පවා ඉතා විශාල වශයෙන් මොනරාට ශ්‍රවණගෝචර වෙනවා. එබැවින් මාර්ග දෙපස තිබෙන කුඹුරුවලට මොනරුන්ගෙන් සිදු වන හානිය ගම්මැද්දේ කුඹුරුවලට සිදු වන හානියට සාපේක්ෂව අඩු මට්ටමක පවතිනවා. ඒ වගේම කොරටු හෝ වෙනත් වගාබිම් ආශ්‍රිතව පරණ පොහොර උර ආදියෙන් සාදා ඇති ආවරණයත් ඊට ඉහළින් මොනරුන්ට පියාඹා පැමිණිය නොහැකි සේ රෙදිපටි ලණු උපයෝගී කරගෙන සකසා ඇති වියනත් මොනරුන්ගේ තර්ජනයෙන් බේරීමට ප්‍රමාණවත් නොවන බවත් ප්‍රදේශයේ පලා වර්ග ආහාරයට ගැනීමට ඇතැමුන් අකැමැතියි. එයට හේතුව මොනරුන්ගේ පිල්කලඹෙහි පවතින කුඩු වැනි ද්‍රව්‍යය ශරීරයට අහිතකර යැයි ඔවුන් විශ්වාස කරන නිසාත් මොනරා විසින් සර්පයන් ආහාරයට ගන්නා නිසාත් ඔවුන්ගේ අසූචි විෂ සහිත යැයි නිශ්චය කරන නිසාත් යැයි පවසනවා.

නිමාෂා තමාලි රාජපක්ෂ

> මොනරා අපේ ගම්බිම්වලට හෝ නගරයට හෝ පැමිණීම ගැටලුවක් නොවේ. ඒහෙත් ඔවුන් තම වාසභූමි සඳහා ග්‍රාමීය කෘෂිකාර්මික බිම්, විශේෂයෙන් වී වගාබිම් සහ කොරටු වගාබිම් තෝරා ගැනීම උග්‍ර ගැටලුවක් බවට පත්ව ඇත. එබැවින් බොහෝ කෘෂිකාර්මික ප්‍රදේශවල වෙසෙන ජනතාවගේ දුක් අඳෝනාව වනුයේ මෙනරුන් නිසා තම වගාබිම් තවදුරටත් පවත්වාගෙන යෑමේ දුෂ්කරතාවක් ද පවතින බවය.





ටී.එල්.ඩී.පී. හේමපාල - නාගොඩ සමූහ, හිනිදුම විශේෂ

# නාගොඩ දරු පවුලකයට හිසට සෙවණක්





ජනාධිපතිතුමන්ගේ සහ අගමැතිතුමන්ගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක ගමට ගෙයක් නිවාස වැඩසටහන යටතේ හිනිදුම මැතිවරණ කොට්ඨාසයට අයත් නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 222 ඌරල දකුණ ග්‍රාමනිලධාරී වසමේ දොලහේන්කන්ද ප්‍රදේශයේ ඉදිකළ දෙවැනි නිවෙස ප්‍රතිලාභීන්ට බාරදීම උත්සවාකාරයෙන් සිදුකෙරිණි.

ගමට ගෙයක් නිවාස වැඩසටහන යටතේ මේ සඳහා රුපියල් ලක්ෂ 6ක් වියදම් කර තිබිණි.

ගාල්ල දිස්ත්‍රික් පාර්මේන්තු මන්ත්‍රී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති සම්පත් අතුකෝරල මහතාගේ ප්‍රධානත්වයෙන් ප්‍රතිලාභීන්ට පිරිනැමූ අවස්ථාවයි මේ. මේ අවස්ථාවට දකුණුපළාත් සංවර්ධන අධිකාරියේ සභාපති චරිත් අසේල මනෝරත්න, නාගොඩ ප්‍රාදේශීය ලේකම් සී.පී. රාජකරුණා, නාගොඩ ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඩබ්ලිව්. පතිනායක යන මහත්ම මහත්මීහු සහභාගි වූහ.

සීගිරිය විශේෂ

## හෙරොයින් ජාවාරම් කළැයි අම්මයි පුතයි අත්අඩංගුවට

හෙරොයින් මත් කුඩු ජාවාරමක නිරත වයස හැත්තෑ පස් වියැති කාන්තාවක ඇතුළු තවත් පුද්ගලයන් හත්දෙනකු ගලේවෙල කොරියාව නමැති ප්‍රදේශයෙන් සැකපිට අත්අඩංගුවට ගත් බව පොලීසිය කියයි.

එහිදී මත්කුඩු අලෙවි කිරීම සහ මත්කුඩු මිලදී ගැනීම සඳහා පැමිණ සිටි වයස අවුරුදු 20ත් 25ත් අතර තරුණයන් පිරිසක්, සැකකාර කාන්තාව සහ ඇයගේ පුතා සැකපිට අත්අඩංගුවට ගත් බවත් ඔවුන් සන්තකයේ තිබී හෙරොයින් ග්‍රෑම් තුනකට වැඩි ප්‍රමාණයක්, ජංගම දුරකථන කීපයක් සහ ජාවාරම්කරුවන් කීපදෙනකුගේම වැදගත් තොරතුරු රැසක් සොයා ගත් බවත් අපරාධ කොට්ඨාස අපරාධ විමර්ශන ඒකකය කියයි.

සැකකාර කාන්තාවගේ දියණිය සහ ලේලිය මේ වන විටත් හෙරොයින් ජාවාරම යටතේ බන්ධනාගාරයේ පසුවන බව ද ඇයගෙන් ප්‍රශ්න කිරීම්වලදී හෙළි විය.

එන්. නවරත්න - මීගහකිවුල සමූහ

## කුඹුක් ගසක් කැපූ තරුණයකුට ඇප

රිදීමාලියද්ද පොලිස් වසමට අයත් කුඩාලුණුක ප්‍රදේශයේ දිය කඳුරක කුඹුක් ගසක් කපමින් සිටි පුද්ගලයකු විවිධ දිග ප්‍රමාණයන්ට කපන ලද කුඹුක් කොට 11ක් ද සමඟ පසුගියදා (14) සවස සැකපිට අත්අඩංගුවට ගත් බව රිදීමාලියද්ද පොලීසිය පවසයි.

මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ රිදීමාලියද්ද කුඩාලුණුක පදිංචි වයස අවුරුදු 25ක තරුණයෙකි.

පොලීසිය වෙත ලද තොරතුරක් මත සිදුකළ වැටලීමකදී සැකකරු හා කපන ලද දැව තොගය අත්අඩංගුවට ගෙන ඇත. සැකකරු ඇප මත මුදා හළ අතර ඔහුට එරෙහිව නඩු පවරන බව පොලීසිය පවසයි.

සුදත් පුබුදු කීර්ති - දෙල්ගොඩ සමූහ

## බියගම-මාකොළ 60 දෙනෙක් පීසීආර් පරීක්ෂණයට

බ්‍රැන්ඩික්ස් ආයතනයේ කොළඹ කොල්ලුපිටිය කාර්යාලයේ සේවය කළ බියගම ඉහළ බියන්විල ප්‍රදේශයේ නේවාසිකව සිටින පුද්ගලයකු කොවිඩ්-19 ආසාදිතයකු බවට තහවුරු වීමෙන් පසුව ඔහුගේ ආශ්‍රිතයන් 12 දෙනකුගේ පීසීආර් පරීක්ෂණ සඳහා ජෛව සාම්පල් ලබා ගැනීම පසුගියදා (14) දෙල්ගොඩ මහජන ක්‍රීඩාංගණයේදී සිදු කෙරිණි.

මීට අමතරව මාකොළ ප්‍රදේශයේ ඇන්ටනා කුලුනු නිෂ්පාදනය කරන සමාගමක අධ්‍යක්ෂවරියක ඇතුළු තිදෙනෙකුට වයිරසය ආසාදනය වීමෙන් පසු මෙතෙක් සවයං නිරෝධායනයට යොමු කර සිටි බියගම සහ මාකොළ ප්‍රදේශයේ පදිංචි එම සමාගමේ සේවකයන් 60 දෙනකුගේ පීසීආර් පරීක්ෂණ සඳහා සාම්පල් ලබා ගැනීමද මෙහිදී සිදු විය.

බියගම පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක සමන් පෙරේරා මහතාගේ අධීක්ෂණය යටතේ මේ වැඩසටහන සිදු කෙරිණි.

නාඋල සමූහ

# මාතලේට මහ කන්නයට පොහොර මෙ.ටො.5000ක් නොමිලේ

2020 - 21 මහ කන්නනයේ වී වගාව සඳහා මාතලේ දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 20,978කට රුපියල් මිලියන 320ක් වැයකරමින් පොහොර මෙට්‍රික් ටොන් 5,311ක් නොමිලේ ලබා දීමට කටයුතු කර ඇතැයි ජාතික පොහොර ලේකම් කාර්යාලයේ මාතලේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ එම්.එම්.එස්. සේනාරත්න මහතා පැවැසීය.

ඒ අනුව මහා වාරිමාර්ග යටතේ හෙක්ටයාර් 6855ක් ද, සුළු වාරිමාර්ග යටතේ හෙක්ටයාර් 7,874ක් ද, වැහි ජලපෝෂක ප්‍රදේශවල හෙක්ටයාර් 6239ක් ද වී වගා කිරීමට පොහොර ලබා දීමට නියමිත බව ද ඒ මහතා කීය.

සහකාර අධ්‍යක්ෂවරයා මේ බැව් කියා සිටියේ පසුගිය දා (13) මාතලේ දිසා ලේකම් කාර්යාලයේ පැවැති දිස්ත්‍රික් කෘෂිකර් ම කමිටු රැස්වීමට එක් වෙමිනි.

එහිදි වැඩිදුරටත් අදහස් දැක්වූ සේනාරත්න මහතා කිය සිටියේ යූරියා මෙට්‍රික් ටොන් 3,715ක්, ටී.එස්.ටී මෙට්‍රික් ටොන් 478ක් සහ එම්. ඕ. පී. 1,117 වශයෙන් ගොවීන්ට ලබා දීමට නියමිත බවයි.

මීට අමතරව කාබනික පොහොර බෙදා දීම යටතේ ඝන පොහොර මෙට්‍රික් ටොන් 1,400ක් සහ දියර පොහොර ලීටර් 1,2000 ක් ලබා දීමට ද නියමිතය.

ඔත්තොබර් 25 වැනි දිනට පසුව කිසිම ගැටලුවකින් තොරව පොහොර ලබාදීමට හැකි බවත් දැනට වගා කටයුතු ආරම්භ කොට ඇති ගොවීන් සඳහා පොහොර හිඟයකින් තොරව ලබාදීමට හැකි බවත් ඒ මහතා සඳහන් කළේය.

කේ. ඩී. දේවප්‍රිය - කතරගම සංචාරක

## යාල ජාතික වනෝද්‍යානයේ දෛනික ආදායම බැහැලා



මෙරට පවතින කොරෝනා අර්බුදය මුල් කරගෙන දේශීය සහ විදේශීය සංචාරකයන් යාල ජාතික වනෝද්‍යානය වෙත නොපැමිණීම මත වනජීවී දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතු ආදායම් විශාල වශයෙන් අහිමි වී තිබේ.

වෙනදා දිනක ආදායම රුපියල් ලක්ෂ 20ක් පමණ වූ අතර මේ වනවිට එය දිනක ආදායම රුපියල් 50,000 ක් දක්වා අඩු වී ඇති බව වනජීවී නිලධාරීහු පවසති. වෙනත් දින වල දී දිනකට සෆාරි ජීප් රථ 400ක් පමණ සංචාරකයන් රැගෙන වනෝද්‍යානය වෙත ඇතුළු වූවත් මේ වන විට එය දිනකට ජීප් රථ 10කටත් අඩු සංඛ්‍යාවක් දක්වා අඩු වී ඇති බව වාර්තා වේ.

මීට අමතරව සංචාරක මාර්ගෝපදේශක රැකියාව සිදු කර දිවි ගෙවූ පිරිස් මෙන්ම මේ පිරිස් වෙත නවාතැන් සපයා දිවිගෙවන හෝටල් හා සංචාරක නිකේතන රැසක හිමිකරුවන් ඇතුළු සේවකයෝ දැඩි ආර්ථික අපහසුතාවකට පත්ව සිටිති.

ගාල්ල දිසා සමූහ

## පොලිස් සැරයන්වරයකුට පහර දුන්නැයි ත්‍රිරෝද රථ රියැදුරෙක් දැලේ

ත්‍රිරෝද රථය සෙමින් ධාවනය කරන ලෙස පැවසීම නිසා ඉන් උරණවූ බීමත්ව සිටි ත්‍රිරෝද රථ රියැදුරකු ත්‍රිරෝද රථය නවත්වා එහි ගමන් කරමින් සිටි පොලිස් සැරයන්වරයකුට පසුගියදා (14) පස්වරුවේ දී පහරදී ඇති බැව් ඉමදූව පොලීසිය පවසයි.

පහරකෑ පොලිස් සැරයන්වරයා ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලට ඇතුළත්ව ඇති බව ද පොලිසිය පවසයි. පොලිස් සැරයන්වරයා ගාල්ල පොලීසියට අනුයුක්තව රාජකාරි කරන අයෙකි. ඔහු පසුගියදා (14) පස්වරුවේ සේවය නිමකොට නිවෙස බලායෑම සඳහා බස් රථයකින් ගොස් ඉමදූව පැගිරිහේන හන්දියෙන් බැස කොඹල ප්‍රදේශයට යාම සඳහා ත්‍රිරෝද රථයට ගොඩවී තිබේ. එම අවස්ථාවේ දී සැරයන්වරයා බිමතින් සිට ඇති අතර ඔහු අධික වේගයෙන් ත්‍රිරෝද රථය ධාවනය කොට ඇත.

එහිදී පොලිස් සැරයන්වරයා ත්‍රිරෝද රථය හෙමින් ධාවනය කරන ලෙස ත්‍රිරෝද රථ රියැදුරට පවසා ඇති අතර ඉන් උරණ වූ ත්‍රිරෝද රථ රියදුරු ත්‍රිරෝද රථය නවත්වා පොලිස් සැරයන්වරයාට පහරදී ඇති බව පොලීසිය පවසයි.

සැකකාර ත්‍රිරෝද රථ රියැදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර ඔහු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

ඒ.ඒ.එල්. ඩයස් - මාතලේ දිස්ත්‍රික් සමූහ

## ලූනු මිල පහළ යෑමෙන් දඹුල්ලේ ලූනු අස්වනු ගබඩාවල

කෝවිඩ්-19 පැතිරීයෑමේ අවදානම නිසා ජනතාවට ඇතිව තිබෙන ආර්ථික අපහසුතා තරමක් දුරට හෝ මඟහැරවීම සඳහා රජය විසින් ආනයනික ලොකු ලූනු බද්ද ඉවත් කිරීමත් සමගම වෙළෙඳපොළේ දේශීය ලොකු ලූනු මිල අනපේක්ෂිත ලෙස පහත වැටීමෙන් ගොවීන් සිය ලොකු ලූනු අස්වනු අලෙවි නොකර ගබඩා කිරීමට පටන්ගන ඇත. තව ද මේ දිනවල පවතින වර්ෂාව නිසා ලොකු ලූනු අස්වනු විනාශවී යෑමේ තත්ත්වයක්ද උද්ගතවී ඇතැයි ඔව්හු සඳහන් කරති.

මේ අතර පසුගිය සතියේ දේශීය ලොකුලූනු කිලෝවක මිල රුපියල් 200 දක්වා ඉහළ ගොස් තිබුණත් මේ වනවිට එය රුපියල් 80 දක්වා පහත වැටීම නිසා මෙවැනි තත්ත්වයක් උදාවී ඇතැයි ගොවියෝ පවසති. මෙවර දඹුල්ල, ගලේවෙල, සීගිරිය සහ දේවහුව ප්‍රදේශවල ලොකු ලූනු වගාව තරමක් දුරට සිදුකර ඇති අතර අස්වනු නෙළීම මේ වනවිට අවසන්වීමට ද ආසන්නවී ඇති බව ඔව්හු පෙන්වා දෙති.



සීගිරිය විශේෂ

## ඉඩෝරයෙන් බැටකන නාමල්පුර වැසියෝ





පලුගස්වැව, කැකිරාව සහ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මායිම්ව පිහිටි නාමල්පුර ගම්මානයට මේ දිනවල පවතින දැඩි නියං තත්ත්වය හේතුවෙන් ජනතාව දැඩි පීඩනයකට පත්ව සිටිති. මේ ප්‍රදේශයේ වැව් අමුණු ඇළ දොළ බොහෝමයක් වතුර සිඳී ගොස් ඇති බවත් ඇතැම් වැව් අමුණුවල ඉතා සීමිත ජල ප්‍රමාණයක් පවතින නිසා ගොවිතැන් බත් කටයුතු සිදු කර ගැනීමට නොහැකිව දැඩි ආර්ථික දුෂ්කරතාවකට තමන් පත්ව ඇතැයි ගම්වැසියෝ පවසති.

මෙම ගම්මානයේ පවුල් 250ක් 300ක් පමණ දෙනා ජීවත් වෙන බවත් තම අවට ගම්මානවල ජනතාවට ද මේ ආකාරයෙන්ම නියං තත්ත්වය දැඩි ලෙස බලපා ඇතැයි ඔවුහු පෙන්වා දෙති.

අහස් දියෙන් වගා කරන මේ ගම්මානවල ජනතාවට ජනතාව වැඩි වශයෙන් හේන් ගොවිතැන්වලින් ජීවත් වූවෝ වෙති. මේ දිනවල තමන්ට නිසියාකාර වර්ෂාපතනයක් නොමැතිවීම හේතුවෙන් පානීය ජලය පවා දින තුනකට වරක් ලැබෙන බව පෙන්වා දෙන ගම්වාසීන් හේන් ගොවිතැන් සකස් කරමින් අහසින් දිය පොදක් වැටෙන තුරු බලා සිටින බව පවසති.

තම ප්‍රදේශයට පවතින නියං තත්ත්වය හේතුවෙන් ඇතැම් පවුල්වල ජනතාව ආහාර හිඟයකට ද මුහුණ පා ඇති බව ඔවුහු පෙන්වා දෙති.

කේ. ඩී. දේවප්‍රිය - කතරගම සංචාරක

## රුහුණු වනෝද්‍යානයේ පිවිසුමට ගණදෙවි පිළිරුවක්



වනජීවී ඇමැති සී. බී. රත්නායක මහතාගේ නව සංකල්පයක් අනුව ජාතික වනෝද්‍යාන වෙත පිවිසෙන ප්‍රධාන ස්ථානවල ගණදෙවි පිළිරුවක් තැබීමේ නව වැඩසටහන පසුගියදා (14) රුහුණු ජාතික වනෝද්‍යානයෙන් ආරම්භ කරනු ලැබීය.

මහා වනයට අධිපති දෙවියන් වන ගණ දෙවියන් මුල් කර ගෙන අතීතයේ වැසියන් පුද පූජා තබා දෙවියන්ට වැඳුම් පිදුම් කළ අතර මහ වනයට යන පිරිස් කොළ අත්තක් කඩා ගණපති දෙවියන් සිහිකිරීම අදත් ජනයා සිදු කරති. මේ ගණදෙවි පිළිමය තැබීම කතරගම දේවාලයේ හිටපු බස්නායක නිලමේ දිල්රුවන් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදි.

ඒ.ටී.එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

## පාලම්පටාරු පොලිස් මුරපොළ යළි විවෘත කරයි



ත්‍රිකුණාමය නුවර ප්‍රධාන මාර්ගයේ ගරාවැටෙමින් තිබූ තඹලගමුව පොලීසිය මගින් පාලනය වූ පාලම්පටාරු මාර්ග බාධක පොලිස් මුරපොළ පොලිස් නිලධාරින්ගේ ශ්‍රම දායකත්වයෙන් ප්‍රතිසංස්කරණය කර යළි විවෘත කෙරිණි.

ත්‍රිකුණාමලය දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ලයනල් ගුණතිලක මහතා විසින් මේ මුරපොළ විවෘත කරණු ලැබුවේ කන්තලේ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ධම්මික වීරසේකර මහතා විසින් කළ ආරාධනාවකට අනුවය. තඹලගමුව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සම්පත් බණ්ඩාර මහතාගේ අධීක්ෂණය යටතේ මේ මුරපොළ ක්‍රියාත්මක වේ.

පී. සෝමරත්න - මීගහතැන්න සමූහ

## ඇලේගොඩ ගොවි සෙවණ විවෘත නොකරන්නේ ඇයි?

අහලා බලමු



මුදල් රුපියල් ලක්ෂ විස්සක් සහ ගොවීන්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදිකළ ඇලේගොඩ ගොවි සෙවණ කාර්යාලය විවෘත නොකර කැලේට ගොස් ඇතැයි ප්‍රදේශයේ ගොවීහු කියති. 1994 වර්ෂයේ දි ඉදිකිරීම් අවසන්කර ඇති මේ ගොඩනැගිල්ල මෙතෙක් විවෘත නොකරම අතහැර දමා තිබේ.

අක්කරයක භූමිය සමග ගොඩනැගිල්ල දශක දෙකකට වැඩි කාලයක් කැලෑවෙන් යටවෙමින්, දිරාපත්වෙමින් තිබෙන අතර ප්‍රදේශයේ ගොවීන්ට පොහොර, කෘෂි උපකරණ බෙදා දීමටත්, කෘෂිකර්ම පර්යේෂණ නිලධාරින් ඇතුළු ක්ෂේත්‍ර නිලධාරීන්ගේ කාර්යාලය ලෙස ගැනීමටත් මෙය ඉදිකර තිබේ.

මිහිර විජේසේකර - මාරවිල සමූහ

## නාත්තන්ඩියේ ජල මූලාශ්‍ර නිරීක්ෂණයට රාජ්‍ය ඇමැති සනත් නිශාන්ත එක්වෙයි



වර්තමානයේ රටපුරා පවතින පානීය ජල අවශ්‍යතාව කඩිනමින් සපුරාලීමට කටයුතු කරන බව ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය ඇමැති සනත් නිශාන්ත මහතා පවසයි. නාත්තන්ඩිය මැතිවරණ බල ප්‍රදේශයේ පානීය ජල සැපයුම් ලබාදීම සඳහා අවශ්‍ය ජල මූලාශ්‍ර සොයාබැලීම සඳහා ගම්මාන රැසක සිදුකළ සංචාරයට එක්වෙමින් රාජ්‍ය ඇමැතිවරයා මේ අදහස් පළ කළේය.

පසුගිය කාලයේ ක්‍රියාත්මක කළ ප්‍රජා ජල ව්‍යාපෘති රැසක් අසාර්ථක වී ඇති බව මෙහිදී හඳුනා ගත්තේය. විශාල මුදලක් වැයකර ඉදිකර තිබෙන ප්‍රජා ජල ව්‍යාපෘති ගණනාවක් මේ වනවිට අක්‍රියව පවතී.

# රැකියා ඇබෑර්තු



## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

### පුරප්පාඩු

කැලණිය විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුර : විනයාරක්ෂක නිලධාරී (II ශ්‍රේණිය)**

**සුදුසුකම් :**

01. I. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධරයෙකු වීම
II. වයස අවුරුදු 30 – 45 අතර වීම
III. ශාරීරික යෝග්‍යතාවය **පිරිමි**

උස : අඩි 5 අඟල් 5ට නොඅඩු විය යුතුය.
පපුව : අඟල් 32 (සාමාන්‍ය)

**කාන්තා**

උස : අඩි 5 අඟල් 4ට නොඅඩු විය යුතුය.

**සටහන : පොලිස් හෝ හමුදා සේවයේ පළපුරුද්දක් ලබා ඇති සහ ක්‍රීඩා කටයුතු සමාජ සුබසාධක ක්‍රියාකාරකම් සම්බන්ධව විශ්වවිද්‍යාල හා ජාතික මට්ටමේ ක්‍රියාකාරි සහභාගිත්වයක් ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.**

**හෝ**

02. ශ්‍රී ලංකා හමුදා සේවයන්හි මේජර් හෝ ඊට සමාන වන තනතුරක පළපුරුද්ද සහිත හෝ ශ්‍රී ලංකා පොලීසියේ හෝ ඒ හා සමාන තනතුරක පළපුරුද්ද තිබීම.

**තෝරා ගැනීම :** සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වැටුප් පරිමාණය :** UMN 3 (II) 42885 - 18 x 660 - 54765 p.m.

(කොමිෂන් සභා චක්‍රලේඛ 17/2016 සහ 17/2016 (V) අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය)

මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

**02. තනතුර : ආරක්ෂක පරීක්ෂක (II ශ්‍රේණිය)**

**සුදුසුකම් :**

01. අ. දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 05 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබිය යුතුය. එසේ සම්මාන සාමාර්ථ ලබාගත් විෂයයන් අතරට සිංහල / දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය / වාණිජ අංක ගණිතය / ගණිතය යන විෂයන් ඇතුළත් විය යුතුය.

**හෝ**

ආ. තුන්වරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව ඇත්තා වූ සහ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවකයින් විය යුතුය. සමත්ව ඇති විෂයයන්ට සිංහල / දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය / වාණිජ අංක ගණිතය / ගණිතය යන විෂයන් ඇතුළත් විය යුතුය.

**සහ**

I. පොලිස් හෝ හමුදා සේවයේ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක ආරක්ෂක සේවයේ හෝ පිළිගත් ආරක්ෂක සේවා ආයතනයක ආරක්ෂක සේවයේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

II. ක්‍රීඩාවන්හි ක්‍රියාශීලී ලෙස සහභාගී වී තිබිය යුතුය.

III. **උස** : අඩි 5 අඟල් 4 කට නොඅඩු විය යුතුය.
**පපුව** : අඟල් 34 කට නොඅඩු විය යුතුය. (සාමාන්‍ය)

**තෝරා ගැනීම** : සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වැටුප් පරිමාණය :** UMN 1 (III A) රු. 30725 - 17 x 300/- - 35825 (මාසික)

(කොමිෂන් සභා චක්‍රලේඛ 17/2016 අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය)

මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

**03. තනතුර : පෙදරේරු (II ශ්‍රේණිය)**

**සුදුසුකම් :**

I. අටවන (08) ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය.
II. (අ) බිත්තිපාද, බිත්ති ආරුක්කු කේතුමය කණු, දුම් කවුළු කසළ කානු කුහර ආදිය ඉදි කිරීමේදී උපයෝගී කර ගන්නා ගඩොල් වැඩ සහ නොයෙකුත් ආකාරයේ ක්‍රම.
(ආ) සියලුම අන්දමේ බදාමයන්, ශක්තිමත් කරන ලද කොන්ක්‍රීට් මිශ්‍ර කිරීම හා දැමීම.
(ඇ) සැලසුම් කියවීම හා සරළ ඉදි කිරීම් සඳහා අත්තිවාරම දැමීම.
(ඈ) එමල්ෂන් තීන්ත පාවිච්චි කිරීම ඇතුළු තීන්ත ආලේප කිරීම පිළිබඳව දැනුමක් තිබිය යුතුය.
III. පෙදරේරු වැඩ පිළිබඳව වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

**සේවා පළපුරුද්දට අදාළ සේවා සහතිකවල පිටපතක් අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ නොමැති අයදුම්පත් අදාළ සේවා පළපුරුද්ද නොමැති සේ සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**වයස :** අවුරුදු 45 ට නොවැඩිය විය යුතුය.

**වැටුප් පරිමාණය :** (U-PL 3 III) රු. 29915 - 16 x 270 - 34,235 (මාසික)

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ)

**තෝරා ගැනීම :** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**04. තනතුර : විදුලි කාර්මික (II ශ්‍රේණිය)**

**සුදුසුකම් :**

I. කියවීමට හා ලිවීමට හැකියාව තිබීම.
II. පහත සඳහන් කරුණු පිළිබඳ දැනීම.
(අ) දෝෂයන් සොයා ගැනීම, ද්‍රව්‍ය අලුත්වැඩියා කිරීම සහ නැවත සවි කිරීම, ට්‍රාන්ස්ෆෝමර සහ සියලු වර්ගවල යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ කේබල්, වයර්, කම්බි ඇදීමේ විවිධ ක්‍රම, බද්ධ කිරීම, මීටර් හා කුඩා ට්‍රාන්ස්ෆෝමර් පරීක්ෂා කිරීම.
(ආ) ඇඳීමේ සහ රූප සටහන් කියවා තේරුම් ගැනීම, පරිමාණයන් කියවීම සහ භාගවලින් මාන සටහන් තැබීමට ඇති හැකියාව.
(ඇ) මෙම වෘත්තීයේදී ආවුද භාවිතය හා ආරක්ෂාව පිළිබඳ දැනුම තිබීම.
III. රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක විදුලි කාර්මිකයකු වශයෙන් අවුරුදු දෙකකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**සටහන : සේවා පළපුරුද්දට අදාළ සේවා සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ නොමැති අයදුම්පත් අදාළ සේවා පළපුරුද්ද නොමැති සේ සළකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**වයස :** අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** (U-PL 3 III) රු. 29915 - 16 x 270 - 34235 (මාසික)

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ)

**තෝරා ගැනීම :** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**05. තනතුර : කාර්මික (II ශ්‍රේණිය)**

**සුදුසුකම් :**

I. 08 වන ශ්‍රේණිය සමත් විය යුතුය.
II. පහත සඳහන් කරුණු පිළිබඳ දැනීම.
(අ) පරිමාණ, සූක්ෂම මාන කියවීම සහ භාගවලින් මාන සටහන් තැබීමට හැකියාව තිබීම.
(ආ) වාෂ්ප, මෝටර් සහ ඩීසල් පිරියත හා යන්ත්‍රෝපකරණවල විශේෂිත සවි කිරීම් වර්ග, ලියවන පට්ටල් හෝ මිල්ලම් කිරීමේ යන්ත්‍ර සහ හැඩ ගැමේ (Shapin) යන්ත්‍ර වැනි වැඩපල යන්ත්‍ර ක්‍රියා කරවීමට හැකියාවක් තිබීම.
(ඇ) ඇඳීම් (Drawing) කියවීම සහ අවබෝධය පිළිබඳව දැනුමක් තිබිය යුතුය.
III. කාර්මිකයෙකු හෝ යන්ත්‍ර ක්‍රියාකරුවෙකු ලෙස වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

**සටහන : සේවා පළපුරුද්දට අදාළ සේවා සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ නොමැති අයදුම්පත් අදාළ සේවා පළපුරුද්ද නොමැති සේ සළකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**වයස :** අවුරුද 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :** (U-PL 3 III) රු. 29915 - 16 x 270 - 34235 (මාසික)

(මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ)

**තෝරා ගැනීම :** වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

ඉල්ලුම්පත් විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය. (www.kln.ac.lk) නිසි ලෙස සම්පූර්ණ කරනලද අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමග ඉල්ලුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර 2020 නොවැම්බර් මස 2 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි සහකාර ලේඛකාධිකාරී / ආයතන අනධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය දෙපාර්තමේන්තු. සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් හට වයස් සීමාව බලනොපානා අතර, ඔවුන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාල සතුය.

අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, අසම්පූර්ණ, අපහැදිලි හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර එසේ ප්‍රතික්ෂේප කරනු ලැබූ අයදුම්පත් කිසිදු හේතුවක් නිසා හෝ යළි සලකා බලනු නොලැබේ.

**ලේඛකාධිකාරී,**
**කැලණිය විශ්වවිද්‍යාලය.**
**2020.10.14**

## තනතුරු පුරප්පාඩු

සී/ස හතරලියද්ද විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ 2/2019 චක්‍රලේඛය අනුව සුදුසුකම් සපුරාලන මහනුවර දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් 2020.11.15 දින දක්වා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ. සියලුම අයදුම්පත්‍ර 2020.11.15 දිනට **ගරු සභාපතිතුමා, සී/ස හතරලියද්ද විවිධ සේවා සමුපකාර සමිතිය, වැලිගඩපොල, හතරලියද්ද** යන ලිපිනයට ලි.ප. තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ඉහළ වම් කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

සමිතිය විසින් පිළියෙල කර ඇති අයදුම්පත්‍රයක් හා අදාළ සුදුසුකම් ලේඛනයක් රු. 100 ක මුදලක් ගෙවා සමිතියෙන් ලබාගත හැකි අතර, අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් සහතික කර අමුණා එවිය යුතුයි.

- **උප්පැන්න සහතිකය**
- **ජාතික හැඳුනුම්පත**
- **පදිංචිය සනාථ කෙරෙන ග්‍රාම නිලධාරී සහතිකය**
- **චරිත සහතික 02**
- **අධ්‍යාපන සහතික**

**තනතුර :**

**01. සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු) ii & i**

වැ.ප.අ. S.E.M.L 02 : 03
වැ. ප. 22000 - 470x10,570x10, 720x10 = 39,600
**වයස :** 18 – 45 අතර
(මීට අමතරව රු. 5,000 ක දීමනාවක් ගෙවනු ලැබේ)

**02. ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක ii & i**

වැ.ප.අ. S.E.M.L 02:06
වැ.ප. 19100 - 440 x 10, 540 x 10 = 35,800
**වයස :** 18 – 45 අතර
(මීට අමතරව රු. 5,000 ක දීමනාවක් ගෙවනු ලැබේ)

**03. ලේකම් ii & i**

වැ.ප.අ. S.E.M.L 02:07
වැ.ප. 19100 - 440 x 10, 540 x 10 = 35,800
**වයස :** 18 – 45 අතර
(මීට අමතරව රු. 5,000 ක දීමනාවක් ගෙවනු ලැබේ)

**සභාපති,**
**සී/ස හතරලියද්ද විවිධ සේවා සමුපකාර සමිතිය,**
**හතරලියද්ද.**

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තියට අනුකූලව පහත සඳහන් සමාගම වර්ෂ 2020 ක් වූ ඔක්තෝම්බර් මස 12 වන දින සංස්ථාගත කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ !

**සමාගමේ නම :**
ෆැෂන් & ඉවෙන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

**සංස්ථාගත අංකය :**
පී.වී. 00228832

**ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය :**
නො. 136/4, උඩුවන, හෝමාගම.


**සමාගමේ ලේකම්වරු**
**2020 ක්වූ ඔක්තෝම්බර් මස 15 වන දින**

පඩුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1389 වැලිවැහැර ග්‍රාමසේවා වසමේ වැලිවැහැර, මොරගනේ ලිපිනයෙහි පදිංචි **රන්දුනු පේඩි දුරයලාගේ හෂිනි ශානිකා ධර්මකීර්ති, රන්දුනු පේඩි දුරයලාගේ චාමිණී ශානිකා ධර්මකිර්ති** වන අපි මින් ඉදිරියට **රාමනායකගේ ශෂිනි ශානිකා ධර්මකීර්ති, රාමනායකගේ චාමිණී ශානිකා ධර්මකිර්ති** යනුවෙන් නම් භාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් ද, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

### සුළු දැන්වීම්



**වෙළෙඳ**



**233**
**යන්ත්‍රෝපකරණ හා මෙවලම්**
විකිණීම

විකිණීමට - ආනයනය කළ කම්බි දිග හැරීමේ සහ කැපීමේ යන්ත්‍රයක් වහාම විකිණීමට. පාවිච්චිය මාස 03 ක් පමණයි. හොඳ තත්වය ධාරිතාවය මිමි 6 සිට මිමි 16 දක්වා. 0773930800 / 0775789109
061645




**රැකී රක්ෂා**



**325**
**ඇබෑර්තු**
විවිධ

කොළඹ ප්‍රදේශය අවට සිම්කාඩ් පත් (SIM CARD) විකිණීම සඳහා සේවක ඇබෑර්තු ඇත. (පිට පළාත් සඳහා විශේෂයි) අමතන්න. 0715925156 / 0714600087
063435



**නිවාස හා ඉඩම්**

**618**
**ගේ දොර ඉඩකඩම්**
**කළුතර**
දිස්ත්‍රික්කය
විකිණීමට

පානදුර, ගොරකපොළ, (පැරණි කොළඹ පානදුර මාර්ගය) පර්චස් 20.95 ක නේවාසික හා වාණිජ තෙමහල් ගොඩනැගිල්ල, මාර්ගය ඉදිරිපස වහාම විකිණීමට. බිම් මහල සාප්පු ඒකක තුනක් සමග නිදන කාමර පහක්, නාන කාමර තුනක්, ලොබිය, බැල්කනිය හා පැන්ට්‍රිය සහිතය. ව. අඩි 3350, හොඳ නේවාසික ප්‍රදේශයක පිහිටීම. දුරකථනය 0773930800 / 0777634791
061314

## මහා නගර සභාව – කඩුවෙල

### මස්කඩ හා වෙළඳපොළ ප්‍රසම්පාදන දැන්වීම - 2021 වර්ෂය

කඩුවෙල මහා නගර සභාවට අයත් පහත උපලේඛනයේ සඳහන් මස්කඩ කාමර සහ වෙළඳපොළ 2021.01.01 සිට 2021.12.31 දක්වා බදු දීම පිණිස 2020.11.06 දින පෙ.ව. 10.00 දක්වා මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ලංසු කැඳවනු ලැබේ.

ප්‍රසම්පාදන ලංසු පෝරම 2020.10.19 දින සිට 2020.11.05 දින දක්වා (සතියේ දිනවල පමණි) පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා මෙම කාර්යාලයේ නාගරික මුදල් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලැබේ. 2020.11.06 වන දින පෙ.ව. 10.00 ට මෙම කාර්යාලයේදී ප්‍රසම්පාදන ලංසු විවෘත කරනු ලබන අතර, වැඩි විස්තර කාර්යාල දිනයන්හි පෙ.ව. 09.00 සිට ප.ව. 3.00 දක්වා නාගරික ගණකාධිකාරීගෙන් විමසා දැනගත හැක. (දුරකථන අංක 0112-539562) ප්‍රසම්පාදන ලංසු විවෘත කරන අවස්ථාවේ දී ප්‍රසම්පාදන ඉල්ලුම්කරු හෝ ඔහුගේ ලිඛිතව බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

**සැලකිය යුතුයි**

01. ප්‍රසම්පාදන ලංසු ඉල්ලුම්පත් ලබාගැනීමේදී ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත / රියදුරු බලපත්‍රය / විදේශ ගමන් බලපත්‍රය අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය.
02. කඩුවෙල මහා නගර සභාවට හිඟ කඩ කුලී ගෙවීමට ඇති කිසිවෙකුට හෝ මීට පෙර ප්‍රසම්පාදන ටෙන්ඩර් නීතිරීති උල්ලංඝනයකර ඇති කිසිවෙකුට හෝ ප්‍රසම්පාදන ඉල්ලුම්පත් නිකුත් කරනු නොලැබේ.
03. ඉදිරිපත් කරනු ලබන ප්‍රසම්පාදන ලංසු පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය නාගරික කොමසාරිස් සතු වේ.
04. යම් තැනැත්තෙකු එක් කඩ කාමරයකට වඩා වැඩි ගණනකට ටෙන්ඩර් අයදුම්කරන්නේ නම් එක් එක් කඩ කාමරය වෙනුවෙන් වෙන වෙනම අයදුම්පත් මිලදී ගත යුතු අතර, ඒවා වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතුය.
05. ටෙන්ඩර් අයදුම්පත් පිටපත් දෙකකින් සම්පූර්ණකර "මුල් පිටපත" හා "අනු පිටපත" වශයෙන් සඳහන් කර ඇති කවරවල බහා මුද්‍රා තබා 2020.11.06 වන දින පෙ.ව. 10.00 ට ප්‍රථම කඩුවෙල මහා නගර සභාවේ, නාගරික මුදල් දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය. ටෙන්ඩර් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ විසින් මිල ගණන් ඉදිරිපත් කරන කඩ කාමරයේ නම සඳහන් කළ යුතුය.

| | ස්ථානය | 2021 වර්ෂයේ අවම ප්‍රසම්පාදන ලංසුව | ප්‍රසම්පාදන තැන්පත් මුදල | |
|---|---|---|---|---|
| | | රු. ශත | ආපසු ගෙවනු ලැබිය හැකි රු. ශත | ආපසු නොගෙවන ටෙන්ඩර් පෝමර ගාස්තු රු. ශත |
| **අතුරුගිරිය දිස්ත්‍රික් කාර්යාලය** | | | | |
| 01. | එළහරක් මස් කඩය | 293,000.00 | 23,000.00 | 4,000.00 |
| 02. | එළු හා කුකුළු මස් කඩය | 304,000.00 | 24,000.00 | 4,000.00 |
| 03. | ඌරු මස් කඩය | 330,000.00 | 26,000.00 | 4,000.00 |
| **කඩුවෙල දිස්ත්‍රික් කාර්යාලය** | | | | |
| 01. | කඩුවෙල එළු හා කුකුළු මස් කඩය | 304,000.00 | 24,000.00 | 4,000.00 |
| 02. | කඩුවෙල එළහරක් මස් කඩය | 330,000.00 | 26,000.00 | 4,000.00 |
| 03. | කඩුවෙල ඌරු මස් කඩය | 322,000.00 | 26,000.00 | 4,000.00 |

**2020.10.14**
**කඩුවෙල මහා නගර සභාව,**
**කඩුවෙල.**

**සංජීව බන්දුකීර්ති,**
**නාගරික කොමසාරිස්.**



